# කාර්යසාධන වාර්තාව - 2024



## කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

## (වැය ශීර්ෂ අංකය - 171)

# පටුන


| අන්තර්ගතය | පිටු අංක |
|---|---|
| **පරිච්ඡේදය 01** | |
| ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1-19 |
| **පරිච්ඡේදය 02** | |
| ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 20-77 |
| **පරිච්ඡේදය 03** | |
| වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 78-86 |
| ඇමුණුම I | |
| **පරිච්ඡේදය 04** | |
| කාර්ය සාධන දර්ශක | 87-88 |
| **පරිච්ඡේදය 05** | |
| තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 89-94 |
| **පරිච්ඡේදය 06** | |
| මානව සම්පත් පැතිකඩ | 95-108 |
| **පරිච්ඡේදය 07** | |
| අනුකූලතා වාර්තාව | 109-116 |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 දැක්ම

**සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ සාධාරණව හා සමානව භුක්ති විඳින සමෘද්ධිමත් සමාජයක්**

### 1.2 මෙහෙවර

**ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ආර්ථික සවිබලගැන්වීම, කාන්තාවන්, ළමුන්, අවදානමට ලක්විය හැකි හා වරප්‍රසාද නොලබන පුද්ගලයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ආයතනික හා මානව සම්පත් සේවා සැපයීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.**

## 1.3 හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය. මෙම අමාත්‍යාංශය කාන්තා හා ළමා කටයුතු අංශය සහ සමාජ සවිබලගැන්වීම් අංශය යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක විය.

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ලිංගිකත්වය හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා කටයුතුවලට අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම.
- දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වශයෙන් 50%ක් දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති ක්‍රමිකව හඳුන්වාදීම.
- ආර්ථව දරිද්‍රතාව අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබා දීම.
- ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීම.
- ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම.
- අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැළපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම.
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම.
- ස්ත්‍රීන්ට සහ දරුවන්ට වෙනස්කොට සලකන හා පීඩාවට ලක්කරන විශේෂ නීති සංශෝධනය කිරීම.
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකරදීම.
- මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම.
- පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහනය හා එක්ව කටයුතු කිරීමට හැකි වනසේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.

ඉහත කාර්යය හා කර්තව්‍යයන් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටුකරගැනීම සඳහා පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ සක්‍රීයව ක්‍රියාත්මක වේ.

i. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)
iii. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
iv. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
v. ජාතික කාන්තා කමිටුව
vi. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
vii. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSE)
viii. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
ix. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)
x. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
xi. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
xii. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
xiii. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)
xiv. උපදේශන අංශය

තවද ඉහත ආයතන සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහය ලබාදීමට ආයතන අංශය, ගිණුම් අංශය, සංවර්ධන අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ සැලසුම් හා මෙහෙයුම් අංශය ක්‍රියාත්මක වේ.

ඒ අනුව, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වැය ශීර්ෂ අංක 171 යටතේ ක්‍රියාත්මක වන අතර සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේද පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේත්තුව වැය ශීර්ෂ 217 යටතේද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේත්තුව වැය ශීර්ෂ 331 යටතේද ක්‍රියාත්මක වේ. මෙම කාර්යසාධන වාර්තාව මඟින් වැය ශීර්ෂ අංක 171ට අදාළ ප්‍රගතිය දැක්වේ.

**තවද, වර්තමානයේ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය ලෙස අමාත්‍යාංශ දෙකක් වශයෙන් ක්‍රියාත්මක වේ.**

## 1.4 සංවිධාන සටහන


කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
කාන්තා හා ළමා කටයුතු අංශය
ලේකම්
දෙපාර්තමේන්තු/ව්‍යවස්ථාපිත ආයතන
අතිරේක ලේකම් (පාලන) (ශ්‍රී ලං.ප.සේ විශේෂ)(1)
අතිරේක ලේකම් (සංවර්ධන) (ශ්‍රී ලං.ප.සේ විශේෂ)(1)
ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී ල.ග.සේ විශේෂ) (1)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) (ශ්‍රී ල. ක්‍ර. සේ. ) විශේෂ (I)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ල.ග.සේ/I) ( I)
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
ජාතික කාන්තා කමිටුව
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී.ලං.ප.සේ) (1)
අධ්‍යක්ෂ සංවර්ධන (ශ්‍රී.ල.ප.සේ) (1)
අධ්‍යක්ෂ (කාන්තා කාර්යාංශය) (ශ්‍රී.ල.ප.සේ) (1)
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්.) (ශ්‍රී.ල.ප.සේ) (1)
ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ල.ග.සේ I) (1)
අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ල.ක්‍ර.සේ (1)
සහකාර ලේකම් (පාලන) ශ්‍රී ල.ප.සේ (II/III) (1)
නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත ( /II III) (2)
නි.අධ/ සහකාර අධ. සංවර්ධන ශ්‍රී.ල.ප.සේ (II/III) (1)
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ ශ්‍රී ලං ප.සේ (II/III) (3)
සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ල.ක්‍ර.සේ අධි සේවක (III) (1)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) (II/III) (4)
ගණකාධිකාරී (ශ්‍රී ල.ග.සේ (II/III) (2)
නියෝජ්‍ය සහකාර/ අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී ල.ක්‍ර.සේ (II/III) (2)
සහකාර අධ්‍යක්ෂ ශ්‍රී.ල.ක්‍ර. සේ. අධි සේවක (III) (1)
සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තො.තා.) (1)
අභ්‍යන්තර විගණක (ශ්‍රී ල.ග.සේ (II/III)
පරිපාලන නිලධාරී (කා.සේ. නි.සේ. අධි පන්තිය) (1)
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී (රා.ක.සේ.(I)
භාෂා පරිවර්තකක ශ්‍රී ලංකා භාෂා පරිවර්තන සේවය(I/II) (1)
උපදේශන නිලධාරී (I/II) දෙපාර්තමේන්තුගත (13)
සහාය කාර්ය මණ්ඩලය (සංවර්ධන නිලධාරී/පුස්තකාලයාධිපති/ කළමනාකරණ සේවා නිලධාරී / පුස්තකාල සහකාර/ තොරතුරු තාක්ෂණ සහකාර/ පිළිගැනීමේ නිලධාරී /රියදුරු/ කාර්යාල කාර්ය සහායක)

## 1.4.1 සංවිධාන සටහන




අධ්‍ය.ජ.(DSD)- අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අධ්‍ය.ජ.(NISD) - අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ. - සහකාර ලේකම්
නි.අධ්‍ය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අධ්‍ය -සහකාර අධ්‍යක්ෂ
අධ්‍ය.(RDTRI) - අධ්‍යක්ෂ (Rural Development Training and Research Institute)
නි.සා. - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
සං.නි. - සංවර්ධන නිලධාරි

අධ්‍ය (සං) - අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍ය (සැල.) - අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍ය (SDB) - අධ්‍යක්ෂ - (Saubhagya Development Bureau)
ප්‍ර.ග. - ප්‍රධාන ගණකාධිකාරී
ප්‍ර.අ.වි. - ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍ය.(NSPD) -අධ්‍යක්ෂ (National Secretariat for Persons with Disabilities)
අධ්‍ය.(NSE) -අධ්‍යක්ෂ (National Secretariat for Elders)\
අධ්‍ය.(Coun) - අධ්‍යක්ෂ - (Counselling)
ස.සා. - සහකාර සාමාන්‍යාධිකාරී (Sri Lanka Social Security Board)
කල.සහ. - කලමනාකරණ සහකාර
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

# 1.5 අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු/ආයතන හා අංශ

## කාන්තා සහ ළමා කටයුතු අංශය

### පාලන අංශය

#### හැඳින්වීම

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව මෙන්ම අවස්ථානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනවලට කාර්යක්ෂම සේවාවක් ලබාදේ.

#### ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියලුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම, දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම, අමාත්‍යාංශ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ, පනත් කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, අවශ්‍ය මානව සම්පත් ලබා දීමට කටයුතු කිරීම, මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මහජන දුක් ගැනවිලි සම්බන්ධව කටයුතු කිරීම, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, පාර්ලිමේන්තු උපදේශක කාරක සභා කටයුතු, පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනා, ස්ථාවර නියෝග ඇතුළු සියලුම පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධීකරණය, අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, ජනාධිපති කාර්යාල, අග්‍රාමාත්‍ය කාර්යාලය හා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු සම්බන්ධීකරණය හා තොරතුරු දැන ගැනීමේ පනත සම්බන්ධ කටයුතු කිරීම ප්‍රධාන කාර්යභාරයන් අතර වේ.

## සංවර්ධන අංශය

### හැඳින්වීම

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා නීති සම්පාදනය හා ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම දරන ප්‍රධාන අංශයයි. අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, කාන්තා හා ළමා විෂයට අදාළ එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන අනෙකුත් විදේශීය මෙන්ම දේශීය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා ඇගයීම් සිදු කරනු ලබයි. තවද ජාත්‍යන්තර සම්මුතීන් එකඟතා ආදිය සඳහා කාන්තා හා ළමා සංවර්ධනයට අදාළව යාවත්කාලීන වාර්තා සකස් කිරීම ද මූලික වගකීමක් වේ.

### ප්‍රධාන කාර්යභාරය

කාන්තාවන් හා ළමුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව බැඳී සිටින විවිධ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතීන් හා ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කරන රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශ්වකරුවා වන කාන්තා සහ ළමා කටයුතු විෂයය භාර අමාත්‍යාංශයෙහි, අනුබද්ධ ආයතන විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන හා විදේශීය මෙන්ම දේශීය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, පසුවිපරම මෙන්ම කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා ඔවුන්ගේ පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති අණපනත් හා ජාතික මට්ටමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම ප්‍රධාන කාර්යභාරයන් වේ.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම පැවරී ඇති අංශය වේ.

අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරීක්ෂණය ද සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය, කාර්යසාධන විගණනය, කළමනාකරණ විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහගත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් ආයතනයේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට මඟ පෙන්වීම සිදු කිරීමයි.

## සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

### හැඳින්වීම

කාන්තා හා ළමා ක්ෂේත්‍රය තුළ අමාත්‍යාංශ සේවාවන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම්කරණය, මෙහෙයුම්කරණය, පසුවිපරම්කරණය සිදුකිරීම හා අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම, ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය හා ඊට අදාළ සියලුම තාක්ෂණික ප්‍රතිපත්තීන්ට අනුකූලව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කටයුතු පවත්වාගෙන යන අංශය වේ.

### ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශයේ සියලු අංශ/ දෙපාර්තමේන්තුවල තොරතුරු ඒකාබද්ධ කර වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ ජාතික සැලසුම් සම්පාදනය කිරීම හා අවශ්‍ය දායකත්වය ලබා දීම, ක්‍රියාකාරී සැලසුම්වලට අදාළව ප්‍රගති වාර්තාකරණය, ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ක්‍රියාවලිය පවත්වාගෙන යාම, අමාත්‍යාංශයට අදාළ සංවර්ධන වැඩසටහන් මෙහෙයුම්කරණය හා ඇගයීම හා සංවර්ධන වැඩසටහන්වලට අදාළ ඉදිරි වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා නව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම ප්‍රධාන කාර්යභාරයන් වේ.

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අනාථ, අත්හල, අසරණ හා ගැටුම්වලින් අවතැන් වූ යන සියලු කණ්ඩායම්වල ළමුන්ට සම අවස්ථාවන් ඇති කරලීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නෛතික විධිවිධාන අනුව කටයුතු කරනු ලබන ජාතික මට්ටමේ ආයතනයයි.

### ප්‍රධාන කාර්යභාරය

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටලුවලට යොමු වූ ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියලු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකරදීම යන මෙහෙවර යටතේ පරිවාස හා ළමාරක්ෂණ සේවය ක්‍රියාත්මක වේ.

පරිවාස විෂය යටතේ ප්‍රධාන වශයෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා සම්බන්ධීකරණය හා සහාය වීම, පරිවාස විෂය යටතේ ක්‍රියාත්මක වන විවිධ ආයතන සඳහා අවශ්‍ය අවස්ථාවලදී මඟපෙන්වීම, ජාතික ප්‍රතිපත්ති/ ප්‍රමිතීන් සකස් කිරීම, විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, ළමුන්ට අදාළ නීති සංශෝධනය හා නව නීති සම්පාදන කටයුතු සඳහා සහාය වීම සිදු කරනු ලැබේ.

ළමාරක්ෂණ විෂය යටතේ ළමා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම, ළමාරක්ෂණය සඳහා වන සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම, ළමාරක්ෂණය සඳහා දිවයින පුරා ක්‍රියාත්මක රාජ්‍ය නොවන

සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ප්‍රවර්ධන සහකාර නිලධාරීන් හරහා සිදු කරනු ලැබේ.

## මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

### හැඳින්වීම

එවකට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය 1979 වර්ෂයේදී ස්ථාපනය කර ඇති අතර ආයතනයේ ආයතනික කාර්යයන් හා කර්තව්‍යන් නිසි පරිදි නිරූපණය වන ආකාරයෙන් එහි ආයතනික නාමය මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ලෙස 2020 වර්ෂයේදී සංශෝධනය කරන ලදි.

දරුවකු මව්කුස පිළිසිඳ ගැනීමේ සිට වයස අවුරුදු 5 දක්වා කාලය දරුවාගේ මුල් ළමාවිය අවධිය ලෙස සැලකේ. ඒ අනුව, ශාරීරික, මනෝ සමාජීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් පිරිපුන් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරු පරපුරක් බිහිකිරීම හා ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීම තුළින් ශ්‍රී ලාංකීය මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම සිය මෙහෙවර කරගනිමින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය කටයුතු කරනු ලැබේ.

### ප්‍රධාන කාර්යභාරය

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති, ව්‍යාපෘති/ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම, රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම, මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම, මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම හා මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය ප්‍රධාන කාර්යභාරයන් ය.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### හැඳින්වීම

1998 අංක 50 දරන පනත මඟින් පිහිටවනු ලැබූ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සියලු ආකාරයේ ළමා හිංසන හා අපයෝජනය වැළැක්වීම සඳහාත් ළමුන් ආරක්ෂාව හා රැකවරණය සඳහාත් ජාතික මට්ටමින් ක්‍රියාත්මක ආයතනය වන අතර රජයට ළමා ආරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති හා නීති සම්පාදනය වෙනුවෙන් උපදෙස් ලබා දීම ද සිදු කරයි.

### ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වගන්තිය ප්‍රකාරව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික, පරිපාලන හෝ වෙනත් ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම, ළමුන්ට එරෙහි සාහසිකත්වය පිළිබඳ ජාතික දත්ත පදනම සංවර්ධනය සහ පවත්වාගෙන යාම, මහජනතාවගෙන් ළමා අපයෝජන සම්බන්ධ පැමිණිලි ලබා ගැනීම. විමර්ශන, මෙහෙයුම් සහ නඩත්තු කිරීම, ළමුන් සම්බන්ධ ළමා අපයෝජන නඩු ක්‍රියාවලිය අධීක්ෂණය හා නීතිය සමඟ ගැටෙන හා සම්බන්ධ වන ළමයින් සඳහා ආධාර, අධීක්ෂණය සහ පසු විපරම් සිදු කිරීම, ළමා ආරක්ෂක සේවා සහ පහසුකම් සැපයීම සඳහා අවම ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඊට ඇතුළත් වේ. එමෙන්ම ළමයාගේ උපරිම යහපත සඳහා ළමා අපයෝජන වැළැක්වීම හා අපයෝජනයට ගොදුරු වූ ළමයාට ප්‍රතිචාර දැක්වීමේ අරමුණු ඇතිව ජාතික වැඩසටහන් සංවර්ධනය සහ පැවැත්වීම. සියලු ආකාරයේ අපයෝජනවලින් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමවේදයන් හා ළමා ආරක්ෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ළමුන්, යෞවනයන්, වෘත්තිකයන් සහ මහජනතාව දැනුවත් කිරීම, තොරතුරු සහ අධ්‍යාපනය ලබා දීම හා ළමා ආරක්ෂණය හා ළමා සංවර්ධනය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, සහ සංසද ආදිය පැවැත්වීම ද ප්‍රධාන කාර්යයන් අතර වේ.

## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### හැඳින්වීම

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නංවන ජාතික යාන්ත්‍රණයයි. ශක්තිමත් සංවිධාන ජාලයක් ඇති කරමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සාමූහික ක්‍රියාවලියක් හරහා ඉටු කිරීමට ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය කටයුතු කරනු ලබයි.

### ප්‍රධාන කාර්යභාරය

ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම මෙන්ම සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යභාරයන් අතර වේ.

කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩසටහන් මෙන්ම සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම

සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදුකරනු ලබයි. තවද කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් සංවිධානගත කිරීම ද ප්‍රධාන කාර්යයන්ය.

## ජාතික කාන්තා කමිටුව

### හැඳින්වීම

1993 මාර්තු 08 දින පිහිටවනු ලැබූ ජාතික කාන්තා කමිටුව මගින් කාන්තා ප්‍රඥප්තියේ නිර්දේශ ක්‍රියාවට නංවනු ලබයි. කාන්තාවන්ගේ සුභසිද්ධිය, ආරක්ෂාව, රැකවරණය වෙනුවෙන් ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරනු ලබන ජාතික ආයතනයයි.

### ප්‍රධාන කාර්යභාරය

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක් බිහි කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්ය වන්නේ, ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම වේ. මේ සඳහා ජාතික කාන්තා කමිටුව මගින් නිර්දේශ හා සහාය ලබා දීම, අධීක්ෂණය කර ඇගයීම සිදු කරනු ලබයි. ඒ අනුව, ජාතික කාන්තා කමිටුව තුළ පැමිණිලි මධ්‍යස්ථානයක් සහ පැය 24 පුරා අවශ්‍ය සේවා සපයන 1938 කාන්තා උපකාරක නිදහස් දුරකථන සේවාව ක්‍රියාත්මක වේ. එම සේවාව මගින් නීති උපදෙස් ලබා දීම, උපදේශනය ලබා දීම හා අදාළ ආයතන වෙත පැමිණිලිකරුවන් යොමු කිරීම හා වාර්තා කැඳවීම සිදු කරනු ලබයි. එමෙන්ම ලැබෙන පැමිණිලි සම්බන්ධව කාලීන පසුවිපරම් සිදු කිරීම ද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යය භාරයකි.

# සමාජ සවිබලගැන්වීම් අංශය

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය සහතික කිරීම අරමුණු කොටගෙන, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සෑම දිළිඳු පුද්ගලයෙකු තුළම පවතින සැඟවුණු විභවතාවන් යටපත් කරගෙන ඇති බාධක දුරලමින්, එම පවුල් සවිබලගැන්වීම, සමාජ ආරක්ෂණය සහ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධිත) පනතින් සංශෝධිත හා 2013 අංක1 දරන දිවිනැගුම පනත මඟින් ස්ථාපිත කර ඇත.

## ප්‍රධාන කාර්යභාරය

- 2025 සිට 2029 දක්වා වසර 05 ක කාලය තුළ බහුමාන දරිද්‍රතාවයට මුහුණ දී ඇති පවුල් මිලියන 2ක් ආර්ථික, සමාජීය හා මානසික යන අංශ යටතේ සවිබලගැන්වීම.
- අඩු ආදායම්ලාභි පවුල්වල ආදායම් උත්පාදන මාර්ග හා ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපීයම
- අඩු අදායම්ලාභී සඳහා පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීම
- අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස වැඩි දියුණු කිරීම සඳහා නිවාස ආධාර ලබා දීම
- අඩු ආදායම්ලාභි පවුල්වල සමාජ සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

වර්තමාන රජයේ කිසිවෙකු අත් නොහැර යන ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වරප්‍රසාද නොලත් රටේ සමස්ත ප්‍රජාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වා ක්‍රියාත්මක වන අන්තර්කරණීය සමාජ ආරක්ෂණ වැඩසටහනක් 2025 වර්ෂයේ සිට හඳුන්වාදීමට බලාපොරොත්තුවේ.

එහිදී, අමාත්‍යාංශය යටතේ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හා උපදේශන අංශය යන සියලුම ආයතන සමාජ සේවා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ වෙමින් ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගත් දත්ත පද්ධතියක් හරහා සකස් කරන ලද පුනරුත්ථාපන සැලසුම් අනුව සමාජ ආරක්ෂණ හා සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ.

## ප්‍රධාන කාර්යභාරය

- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන තුළින් ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම
- ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳ පොළට සරිලන පරිදි සංවර්ධනය කිරීම.

- ආබාධ සහිත සහිත ළමුන් සඳහා කල්තියා මැදිහත්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් සමාජගත කිරීම
- දෙමාපිය භාරකරුවන් අහිමි ආබාධ සහිත පුද්ගලයන් සඳහා පූර්ණ කාලීන නේවාසික රැකවරණයලබාදීම හා සවිබලගැන්වීම
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගතකිරීම
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කටයුතු සිදු කිරීම
- ප්‍රජා මූලික පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කර ප්‍රචලිත කිරීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමෙන් මෙහෙයුම් කමිටු හරහා අධීක්ෂණය වන ස්වශක්ති සංවිධාන මඟින් පුනරුත්ථාපන සැලසුම් හරහා සේවාදායකයන් සවිබලගැන්වීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම
- රිදියගම නිවර්තන නිවාසය හරහා යාචකයින් පුනරුත්ථාපනය කිරීම

## ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

### හැඳින්වීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති අතර, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකරදීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අභිප්‍රායෙන් **ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව** මඟින් ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මඟින් සිදුකරයි.

### ප්‍රධාන කාර්යභාරය

- ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සපයා ඔවුන් රැකබලා ගැනීමේ පහසුකම් සැලසීම සහ පුද්ගලයින් සඳහා පිහිටුවන ලද ආයතන වල කටයුතු මෙහෙයවීම, උපදෙස්දීම සහ ආධාරදීම
- භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සහ ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබාදීම.
- ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම සහ පාලනය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇතිකිරීම හා ප්‍රවර්ධනය.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

### හැඳින්වීම

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස 2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය පිහිටුවීම සිදුකර ඇත.

### ප්‍රධාන කාර්යභාරය

- වැඩිහිටියන්ට රැකවරණය, ආරක්ෂාව හා සුහසාධනය ලබාදීම පවුල තුළින්ම ඉටුකළ යුතු කාර්යභාරයක් බවට සමාජය දැනුවත් කිරීම.
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කිරීම.
- වැඩිහිටියන්ගේ හැකියාවන්, කුසලතා සංවර්ධනය මඟින් ආදායම් උත්පාදන මාර්ගයන්ට යොමු කරවීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් විශ්‍රාම දිවිය තුළ මුහුණ දෙන ගැටළු මඟහැරවීමට සූදානම් කිරීම.
- පිහිටක් අවැසි වැඩිහිටියන් සඳහා රැකවරණය සැලසීම.

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

### හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව ක්‍රියාත්මක වන ආයතනයකි.රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### ප්‍රධාන කාර්යභාරය

- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත් වූ විට එම කාලයේ දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන් මියගියවිට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- ස්වයංරැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- ස්වයංරැකියාවල යෙදෙන ලෙස තරුණයින් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම

## ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

### හැඳින්වීම

1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත්කර ඇති අතර සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය ආයතනය වේ.

ආයතනයේ කේන්ද්‍රීය අංශය වන පාලක සභාව (Governing Council) මගින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board)ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදීම සිදු කරයි.

ආයතනයේ ක්‍රියාකාරී කටයුතු එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා නම්,

1. සමාජ සේවා විද්‍යාලය
2. පුහුණු අංශය
3. සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
4. පරිපාලන හා මුදල් අංශය

### ප්‍රධාන කාර්යභාරය

- සමාජ වැඩ වෘත්තියවේදි අධ්‍යාපනය ලබාදීම.
- සමාජ වැඩ උපාධි පශ්චාත් උපාධි පවත්වා ගෙන යාම හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ නව උපාධි පාඨමාලා ආරම්භකිරීමට කටයුතු කිරීම. (සමාජ විද්‍යා විශේෂ උපාධිය, මානව විද්‍යා විශේෂ උපාධිය,මනෝවිද්‍යා හා උපදේශන විශේෂ උපාධිය හා වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය)
- සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්විම.
- සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා ප්‍රකාශන පළ කිරීම.
- සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්විම.
- සමාජ සුභසාධන කටයුතු වල නියැලී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම.
- සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දීම.

## සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

### හැඳින්වීම

සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය හරහා ග්‍රාමීය ජනතාව සෘජුව නිෂ්පාදන කාර්යයට සම්බන්ධ කර ගනිමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරීම පිණිස සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වාදෙන ලද අතර එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොළ හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින්, අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කිරීමත් ග්‍රාමශක්ති වැඩසටහන මගින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති පිළිබඳ පසුවිපරම් සිදුකරමින් පවත්වාගෙන යමින් 2021 වර්ෂයේ සිට 2024 දක්වා ක්‍රියාත්මක කර ඇත.

මෙම කාර්යාංශය විසින් සිදු කරනු ලැබූ ඉහත වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කෙරුණු ව්‍යාපෘති සාර්ථක කරගැනීමට අවශ්‍ය මැදිහත්වීම් තවදුරටත් සිදු කරමින් රජයේ ප්‍රතිපත්තියට අනුව 2025 වර්ෂයේ සිට සාකල්‍ය ප්‍රවේශයකින් හා ප්‍රජා සහභාගිත්වයකින් යුතුව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් බහුමාන දරිද්‍රතාවයෙන් ග්‍රාමීය ජනතාව ක්‍රමිකව මුදවා ගනිමින් ආර්ථික, සමාජ පාරිසරික යන අංග අතර ඒකාබද්ධතාවයකින් යුතුව තිරසාර ග්‍රාමීය සංවර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

### ප්‍රධාන කාර්යභාරය

කිසියම් ප්‍රදේශයක පවතින නිෂ්පාදන විභවතාව, සම්පත් සුලභතාව, වෙළඳපොල යනාදී කරුණු පදනම් කරගෙන, අදාළ ක්ෂේත්‍රයන් කෙරෙහි වූ විභවතාවයක් සහිත පිරිස් ද සම්බන්ධ කර ගනිමින්, අඩු ආදායම්ලාභී පවුල් සෘජුවම නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගනිමින්, ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහල නැංවීමට අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, තාක්ෂණික සහය, පුහුණු වැඩසටහන් ලබාදීම හා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබාදීමට සහය වීම.

## ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

### හැඳින්වීම

1974 වර්ෂයේ දී ආරම්භ වූ මෙම ආයතනය, 1978 වර්ෂයේ සිට ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ ක්‍රමෝපායක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තීකරණයට ලක් වූ දිළිඳු ප්‍රජාවගේ විභව ශක්තීන් මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදුන් ජාතික ආයතනයකි. දිළිඳු ප්‍රජාවගේ සමාජ ආර්ථික ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණපාන අවාසිදායක තත්ත්වය, වඩා වාසිදායක තත්ත්වයක් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

### ප්‍රධාන කාර්යභාරය

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂඥ දැනුම සමාජගත කිරීම
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව ග්‍රාමීය සංවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පවුල් හා ප්‍රජා මූල සංවිධාන සවිබලගැන්වීමට සෘජුව සම්බන්ධ වන පරිදි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- ප්‍රතිපත්ති සම්පාදකයින් /සංවර්ධනවේදීන් සඳහා තොරතුරු සම්පාදනය.
- සේවා හා ක්‍රියාවලීන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම
- නව සංවර්ධන ප්‍රවේශයන් සමාජගත කිරීම

## උපදේශන අංශය

### හැඳින්වීම

ප්‍රජාව මුහුණපාන මානසික ගැටළුකාරී තත්ත්වයන්, මානසික අසමතුලිතතා හා විවිධාකාර මනෝසමාජීය ගැටලු සඳහා, මනෝවිද්‍යාත්මක උපදේශන හා ප්‍රතිකාරාත්මක ක්‍රමවේද භාවිතා කරමින් මානසික යහපැවැත්ම ගොඩනැගීම මෙම අංශය මඟින් සිදු කරයි.

### ප්‍රධාන කාර්යභාරය

- පුද්ගලයින් මුහුණපාන මානසික ගැටළුකාරී තත්ත්වයන්, මානසික ආබාධ, මානසික ලෙඩ රෝග හා විවිධාකාර මනෝසමාජයීය ගැටළු හඳුනාගෙන එම තත්ත්වයන් අවම කිරීමට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් සිදු කිරීම.
- ප්‍රජාව මානසිකව සවිබලගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය යොදාගනිමින් දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් පැවැත්වීම.
- මානසික ආබාධ හා මානසික ගැටළු සහිතව පැමිණෙන සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවා සපයමින් මානසික යහපැවැත්ම ගොඩනැංවීම.
- ජංගම දුරකථන උපදේශන සේවාව හරහා තනි පුද්ගල උපදේශන සේවා සැපයීම.
- සමාජ සංවේදීතාවය වඩාත් අවශ්‍යවන ප්‍රජා කණ්ඩායම් හඳුනාගෙන ඔවුන්ගේ මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ උපදේශන වැඩසටහන් සිදු කිරීම.

## පාලන අංශය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන වල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛවලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා අංශවලට කාර්යක්ෂම සේවාවක් ලබාදෙයි.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
- දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ,පනත්, කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
- අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ඒ අනුව, මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ කුසලතා හා දැනුම සංවර්ධන පුහුණු වැඩසටහන් 15 ක් හා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහනක් පිළිවලින් නිලධාරීන් 1000 ක් හා 71 ක් සහභාගිත්වයෙන් පවත්වන ලදී. එසේම තනි පුද්ගල පුහුණු වැඩසටහන් 14 ක් යටතේ නිලධාරීන් 65 දෙනෙක් යොමු කර ඇත.

## සංවර්ධන අංශය

මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ආයතන හා අංශයන්හි අරමුණු ළඟාකර ගැනීම සඳහා උපදෙස් ලබාදීම, මඟ පෙන්වීම හා මෙහෙයවීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එහිදී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය සහ ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) මඟින්ද සමාජ ආරක්ෂණය අවැසි පුද්ගලයන් සඳහා හඳුනාගත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන අතිරේක ලේකම් (සමාජ ආරක්ෂණ) මඟින්ද පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවිත පාලනය කිරීමට, තීරණ ගැනීමට සහ ඔවුන්ගේම සමාජ, ආර්ථික සහ දේශපාලන පරිසරයන් හැඩගස්වා ගැනීමට ක්‍රියාකාරීව සහභාගී වීමට හැකියාව ලබා දීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලියෙහි නියුතු ආයතන අතිරේක ලේකම් (ප්‍රජා සවිබලගන්වීම්) මඟින්ද අධීක්ෂණය කරනු ලබයි.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ.

අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරීක්ෂණය සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශ ලේකම් වෙත සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

## සැලසුම් හා මෙහෙයුම් අංශය

සමාජ සවිබලගැන්වීම් අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛිය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම සැලසුම් හා මෙහෙයුම් අංශය යටතේ සිදුවේ. තවද විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි සම්බන්ධිකරණ හා අධීක්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

| | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ මුල්‍ය ඇස්තමේන්තුව රු.මිලියන | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය (ADB) | ආසියානු සංවර්ධන බැංකුව | රු.මි 695.394 | 2022 අගෝස්තු සිට 2026 අගෝස්තු දක්වා |
| 2 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම හා කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීම පිළිබඳ ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | රු.මි 7.000 | 2024 වර්ෂය ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා |
| 3 | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | රු.මි 52.989 | 2024 වර්ෂය ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා |
| 4 | තිරසර ප්‍රජා පදනම්වූ පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන | සෙමාවුල් ගෝලීය පදනම | අදාළ ප්‍රධායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023-2027 |
| 5 | සමාජ ආර්ථික අර්බුදයෙන් වැඩිම පීඩාවට පත් වූ කාන්තාවන් සඳහා හදිසි සහන සැලසීමේ ව්‍යාපෘතිය. | එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN WOMEN) | අදාළ ප්‍රධායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023 අගෝස්තු සිට 2024 පෙබරවාරි දක්වා |
| 6 | කාන්තාවන් ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය | JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය) | අදාළ ප්‍රධායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි | 2023-2025 |

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම

### කාන්තා හා ළමා කටයුතු අංශය

**කාන්තාවන් සවිබලගැන්වීමේ පනත බලාත්මක කිරීම**

2024 අංක 37 දරන මෙම පනත පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර මෙම පනත 2024 ජූලි 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 11 කොටසේ අතිරේකයක් ලෙස පල කරන ලදි. එහි විධිවිධාන අනුව ජාතික කාන්තා කොමිසම පිහිටුවීම සඳහා මූලික කටයුතු සිදුකරමින් පවතී.


ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2024 අංක 37 දරන
කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීම**

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත සකස් කිරීම පිළිබඳව වූ සංකල්ප පත්‍රිකාව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ සංශෝධන ඇතුළත් කිරීමෙන් අනතුරුව එකඟතාවය ලබා ගැනීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීමට නියමිතය.

**ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමුන් සඳහා එක් නීතියක් සකස් කිරීම**

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් සුරැකීමට අදාළ සියලු නීති රීති හා අණ පනත් අධ්‍යයනය කර වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි එක් පනතක් වශයෙන් ළමා අයිතිවාසිකම් නීතිගත කිරීම මෙහි අරමුණයි. මේ වනවිට ඒ පිළිබඳ අධ්‍යයනය කර සංකල්ප පත්‍රිකාව සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර, නීති කෙටුම්පත් සම්පාදක විසින් මූලික කෙටුම්පත සකස් කර ඇත.

## සමාජ සවිබලගැන්වීම් අංශය

### ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වෙනුවට නව පනතක් සැකසීම සඳහා කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍ය සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.03.13 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අවසන් පනත් කෙටුම්පතට අදාලව ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා වර්ෂ 2024.02.07 නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

2024.06.12 වන දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් අවසන් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දී ඇති අතර 2024.09.09 වන දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.එහි තවදුරටත් සංශෝධන ඇතුලත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇති අතර ඒම කමිටුව විසින් අදාල සංශෝධන සිදු කරමින් පවතී.

### සංඥා භාෂා පනත් කෙටුම්පත

සංඥා භාෂා පනත් කෙටුම්පතෙහි අවසන් කෙටුම්පත 2024.02.12 වන දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කර එවා ඇති අතර එම කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය 2006 අංක 1 දරන ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන් හා පිරිවිතරයන් සැලකිල්ලට ගෙනප්‍රවේශ නියෝග කෙටුම්පත් කර ඇති අතර අදාළ පාර්ශවයන්ගෙන් නිරීක්ෂණ ලබා ගනිමින් පවතී.

## 2.2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### කාන්තා හා ළමා කටයුතු අංශය

### සංවර්ධන අංශය

#### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2024-2028) සකස් කිරීම**

ප්‍රධාන ආංශික සැලසුම් 13කින් සමන්විත ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවැනි පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2024-2028) සඳහා 2024/07/09 වන දින කැබිනට් අනුමැතිය ලැබුණු අතර 2024/12/20 වන දින ගරු කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේ දී එළි දක්වන ලදි .




**2. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම**

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2023 මාර්තු 8 දින ජාත්‍යන්තර කාන්තා දිනයේ දී භාෂාත්‍රයෙන් එළිදක්වන ලදි. එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා වූ මූලික කටයුතු සිදුකරමින් පවතී.

**3. කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම (UNSCR 1325)**

ශ්‍රී ලංකාව සිය ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ යෝජනාව (1325) යටතේ හා ජාත්‍යන්තර බැදීම්වලට ද අනුකූලව මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර 2023 වර්ෂයේ දී කැබිනට් අනුමැතිය සහිතව ජාත්‍යන්තර කාන්තා දින උත්සවයේ දී එළිදක්වන ලදි. දැනට මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරමින් පවතින අතර 2024 අවසන් වන විට 33% කට ආසන්න ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**4. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම**

දරුවන්ට හා කාන්තාවන්ට සේවා සපයන සියලුම පාර්ශ්වකරුවන් ඒකාබද්ධ කොට, ගැටලු සාකච්ඡා කිරීමට කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පැවැත්වීම සඳහා දිස්ත්‍රික්ක 25 සඳහා අවශ්‍ය රු.930,800.00ක ප්‍රතිපාදන වාර්ෂිකව නිදහස් කරනු ලැබේ.

**5. කාන්තාවන්ට හා ගැහැනු ළමුන්ට එරෙහිව ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය (SGBV) වැළැක්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංසද පිහිටුවීම**

2030 වසර වන විට තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුකූලව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැළැක්වීම ප්‍රමුඛ කාර්යයක් බවට පත්ව ඇත. ඒ අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැළැක්වීම, ඊට ප්‍රතිචාර දැක්වීම, දත්ත එක්රැස් කිරීම හා උද්දේශනය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් ප්‍රාදේශීය සිවිල් සමාජය සමඟ සාධනීය හවුල් ක්‍රියාකාරිත්වයක් තුළින් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය සම්බන්ධ ගැටළු වලට ප්‍රතිචාර දැක්වීමට රජයට ඇති හැකියාව ද වැඩිදියුණු කරගැනීම මෙමඟින් අපේක්ෂා කරයි.

මෙම සංසද පිහිටුවීම සඳහා උපදෙස් ඇතුළත් කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අංක 02/2024 දරන චක්‍රලේඛය සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කර ඇත. ඒ අනුව දැනට පිහිටුවා ඇති සංසද සංඛ්‍යාව සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවා ඇත.

**6. අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන**

1991 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අපරානුමත කිරීමෙන් පසු ශ්‍රී ලංකා රජය විසින් ළමුන් සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන්, සූරා කෑමෙන්, අපයෝජනයෙන් හා නොසලකා හරිනු ලැබීමෙන් ආරක්ෂා කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරයි. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ අඩු වයස් ගැබ් ගැනීම් වාර්තාවීම ඉහළ යාම සමඟ පාසල් ළමුන් ඇතුළු විවිධ ඉලක්ක කණ්ඩායම් වෙනුවෙන් අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආරම්භ කර ඇත.

**7. මාධ්‍ය ප්‍රචාරණය**

කාන්තාවන් සහ දරුවන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් වෙන්ව ඇති දිනයන්හි දී ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා, පුවත්පත් අතිරේක ආදිය හරහා ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත. කාන්තාවන් සවිබලගැන්වීම සහ ඔවුන් සුරැකීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් පිළිබඳවත්, කාන්තාවන්ට හා දරුවන්ට හිතකර අයුරින් සදාචාරාත්මක ලෙස මාධ්‍ය හැසිරවීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳවත් සමාජය සංවේදී කිරීම සඳහා මාධ්‍යන්හි දායකත්වය ලබා ගැනීම සිදු කෙරේ.

**8. වෙනත් අමාත්‍යාංශ වෙත වාර්තා/ තොරතුරු ලබා දීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු**

ජාත්‍යන්තර වාර්තාකරණය, විදේශ අමාත්‍යාංශය වෙතින් සිදුකරනු ලබන ඉල්ලීම් අනුව ජාත්‍යන්තර වාර්තා සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම. නිදසුන් ලෙස, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිටු දැකීමේ සම්මුතිය (CEDAW) කාලීන වාර්තාකරණය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), විශ්ව කාලාන්තර සමාලෝචනය (UPR) ආදියට රේඛීය අමාත්‍යාංශය ලෙස තොරතුරු සැපයීම, බීජින් ප්‍රකාශය සහ ක්‍රියාකාරිත්වය සඳහා වන ප්‍රකාශය සඳහා වූ Beijing 30+ සමුළුව සඳහා ද වාර්තාකරණය සිදු කර ඇත.

2025 පෙබරවාරි මස ජිනීවාහි දී පැවැත්වුණු කාන්තාවන්ට එරෙහිව පවත්නා සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියෙහි (CEDAW) 91 වැනි සැසිවාරයට සහභාගී වන දූත කණ්ඩායමට අවශ්‍ය තොරතුරු රැස් කිරීමට, තොරතුරු යාවත්කාලීන කිරීම හා අදාළ වාර්තා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යැවීම ද සිදු කර ඇත.

**9. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැඩසටහන - එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල් (UNFPA) ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්**

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය වැළැක්වීමට හා වින්දිතයන් වෙත සේවා සැපයීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මගින් 2024 වසර සඳහා මෙම අමාත්‍යාංශය වෙත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ සංවර්ධන අංශය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, ජාතික කාන්තා කමිටුව හරහා යෝජිත වැඩසටහනේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම, කාන්තා රැකවරණ මධ්‍යස්ථාන සඳහා CDMA දුරකථන 42 ක බිල් ගෙවීම, වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පාඨමාලාව පැවැත්වීම, තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදු කර ඇත. වැයකරන ලද මුදල රු. මිලියන 0.290කි.

**10. මිනිස් ජාවාරම පිටුදැකීම හා මෙහෙයවීම පිළිබඳ ජාතික උපායමාර්ගික සැලැස්මේ අප අමාත්‍යාංශයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම**

ආර්ථික අර්බුදය හා දිළිඳුකම හමුවේ මිනිස් වෙළඳාමට ගොදුරුවීමේ වැඩි අවදානමට පත්ව ඇත්තේ කාන්තාවන් හා ළමුන් වේ. ඔවුන් මිනිස් වෙළඳාමට භාජනය වීම වළක්වා සුරක්ෂිත කිරීම අරමුණු කරගෙන "කුට්ටනය" (Human Trafficking) සම්බන්ධ නෛතික කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අමාත්‍යාංශය යටතේ වන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත නිලධාරීන්ගේ හා 1929 හා 1938 ළමා හා කාන්තා උපකාරක දුරකථන සේවාවන්හි නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් සිදු කෙරේ.

## 2.2.2. සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. සැලසුම්කරණය**

අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, දිස්ත්‍රික් ක්‍රියාකාරී සැලසුම්, ආයතනික ප්‍රතිඵල රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වන සැලැස්ම ඇතුළු කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. ඊට අමතරව, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශ විෂය පථය යටතේ විවිධ ආයතන/ දෙපාර්තමේන්තු හා වෙනත් අමාත්‍යාංශ මඟින් සකස් කෙරෙන සැලසුම්, ප්‍රතිපත්ති හා වෙනත් කාලීන වාර්තා සඳහා තාක්ෂණික සම්පත්දායකත්වය ලබා දීම සිදු කර ඇත.

**2. මෙහෙයුම්කරණය**

අමාත්‍යාංශයේ සියලු සංවර්ධන වැඩසටහන් වලට අදාළ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තාකරණ හා ප්‍රගති සමාලෝචන සාකච්ඡා පැවැත්වීම සිදු කරනු ලබයි. ඒ යටතේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 09ක් පවත්වා ඇත. තවද, දිස්ත්‍රික් නිලධාරීන් වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් පවත්වා වගකීම් පවරා වාර්තා ඉදිරිපත් කර ඇත.

**3. පසුවිපරම්කරණය**

ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන, කෑගල්ල හා වරකාපොළ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇති ප්‍රතිලාභීන්ගේ සාධ්‍යතාවය ක්ෂේත්‍ර නිරීක්ෂණයට ලක් කර නිර්දේශ වාර්තා කර ඇත.

කිලිනොච්චිය හා යාපනය දිස්ත්‍රික්කයන්හි ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණය, කිලිනොච්චිය දිස්ත්‍රික් වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික මධ්‍යස්ථානය අධීක්ෂණය කිරීම හා යාපනය දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන නිලධාරීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වීම සිදු කළ අතර නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කර ඇත.

**4. පරිගණක තාක්ෂණ පුහුණු වැඩසටහන්**

පරිගණක තාක්ෂණය පිළිබඳ තෙදින පුහුණු වැඩමුළුවක් 2024.12.19, 23 හා 24 දිනයන්හි දී අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන්හි නිරත ආයතනවල නිලධාරීන් හා ප්‍රධාන වශයෙන්ම සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්ගේ ද සහභාගිත්වය සහිතව නිපුණතා සංවර්ධන අරමුදලේ දී පැවැත්විණි.

තවද ප්‍රතිපාදන රහිතව වෙබ් අඩවිය පිළිබඳව, ඉ- වාණිජ්‍ය හා ලංකා විමෙන් ඉ- මාර්කට් හා අංශයේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් සිදු කළ පරිගණක පුහුණු වැඩසටහන් ගණන 08ක් වන අතර ඒ සඳහා නිලධාරීන් 166 දෙනෙකු සහභාගී වී ඇත.

## 5. ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යයන්

ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණය සිදු කරනුයේ සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය මඟින් වන අතර ඒ යටතේ ප්‍රගති වාර්තාකරණය, මෙහෙයුම් සාකච්ඡා හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ප්‍රදායක ආයතන මට්ටමේ සාකච්ඡා නියෝජනය හා අදාළ උපදෙස් හා නිර්දේශ නිකුත් කිරීම් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2026.08.29 දක්වා ක්‍රියාත්මක වේ. කාන්තා හා ළමා සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 535.110ක අරමුදල් වෙන් කර ඇති අතර, සංවර්ධන අංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි .

යෝජිත alenia International පස් අවුරුදු ව්‍යාපෘතියට අදාළ හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ කාර්යයන් සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරමින් පවතී.

## 6. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය, යූ ටියුබ් චැනලය, ෆේස් බුක් පිටුව පවත්වා ගෙන යාමේ කටයුතු පැවරී ඇති මෙම අංශය මගින් ආයතන මඟින් ලබා දෙන තොරතුරු මත පදනම්ව අදාළ මාධ්‍යයන්හි යාවත්කාලීන තොරතුරු පවත්වා ගෙන යනු ලබයි. තවද, අමාත්‍යාංශයේ ප්‍රති වෛරස මෘදුකාංග සැපයීම, ලංකා ඉ - රාජ්‍ය ජාල ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාල කටයුතු පවත්වාගෙන යාම හා පරිගණක ජාලකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම බාර අංශය වශයෙන් ද කටයුතු කරනු ලබයි. විධිමත් ප්‍රසම්පාදන කාර්යයන් හරහා මෙම කටයුතු ඉටු කරනු ලබයි. 'සුහුරුකත' ඉ- සඟරාව ප්‍රකාශයට පත් කිරීම ද ඉටු කර ඇත.




https://www.childwomenmin.gov.lk

### විදේශීය ආධාර යටතේ සිදුකළ වැඩසටහන්

Australia Awards Sri Lanka as a part of a Small Grant යටතේ ව්‍යාපෘති වාර්තාවක් ලියා අනුමත කර ගත් ඕස්ට්‍රේලියානු ඩොලර් 5000ක ප්‍රදානයක් මත පහත වැඩසටහන් සිදු කිරීමට මෙම අංශයේ නිලධාරීන් කටයුතු කරන ලදි.

2024.03.26 දින සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු අදාළ පාර්ශ්ව ආයතනයන්ගේ දායකත්වයෙන් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා සෞඛ්‍ය කඳවුරක් පවත්වන ලදි. මෙහිදී නිලධාරීන් 500කට පමණ වෛද්‍ය පරීක්ෂාවන්, වෛද්‍ය හමුව, ඇස්, කන්, වකුගඩු රෝග, ඊ.සී.ජී, රුධිරගත සීනි හා කොලෙස්ටරෝල් පරීක්ෂාවන් සඳහා අවස්ථාව ලැබිණි.

මෙම සෞඛ්‍ය කඳවුරට සමගාමීව 2024.03.27 දින අමාත්‍යාංශයීය නිලධාරීන් 100ක් සඳහා පිළිකා හා අනෙකුත් බෝ නොවන රෝග හා කාන්තා හා ළමුන් කෙරෙහි එහි බලපෑම පිළිබඳ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි.

එමෙන්ම, පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලක්කගත පවුල් 300ක් වෙනුවෙන් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය වැළැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහනක් 2024.06.08 දින පවත්වා ඇත. තවද එදින නවෝත්පාදන සමාජ සංවර්ධන පදනම අනුග්‍රහය ඇතිව තෝරාගත් දරුවන් 50ක් දෙනෙකු සඳහා ද වැඩසටහනක් පවත්වනු ලැබීය. ඊට අදාළ පසුවිපරම් වැඩසටහනක් ද ක්‍රියාවට නංවන ලදි.

## 2.2.3. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. ගර්භණී හා කිරිදෙන මව්වරුන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් / ප්‍රතිලාභ**

**ගර්භණී මව්වරුන්ට රුපියල් 45,000/-ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

පෝෂණ ඌණතා හා සෞඛ්‍ය හේතු සහිතව හෝ පවුලේ ආදායම එම පවුලේ ඇස්තමේන්තුගත මධ්‍යයන මාසික වියදමට අඩු පවුල්වල මව්වරු සඳහා ගර්භණී සමයේ අවසන් මාස 06 සහ කිරිදෙන සමයේ පළමු මාස 04 සඳහා අවශ්‍ය පෝෂණීය ආහාර ද්‍රව්‍ය ලබාගැනීම සඳහා රු.45,000/- ක් වටිනා වවුචර් පත් නිකුත් කෙරේ. 2024 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක මෙම වැඩසටහන සඳහා රු.මි.9,817.430 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර ඇති අතර එහි භෞතික ඉලක්කය ගර්භණී මව්වරුන් 222,220 කි. 2024.12.31 දින වනවිට ගර්භණී මව්වරුන් 290,560 සඳහා දරන ලද වියදම රු.මි.7584.000 ක් වේ.

**2. පාසල් ගුරුවරුන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන්/ ප්‍රතිලාභ**

**පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

පෙර පාසල් ගුරුවරියන්ගේ සේවය ඇගයීම හා ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කර ගෙන පෙර පාසල් ගුරුවරුන්ට මාසික දීමනාවක් ලබා දීමේ ගුරු අභිමානී වැඩසටහන 2024 වර්ෂයේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය. එම වැඩසටහන 2024 ජනවාරි මස සිට මැයි මස දක්වා රු.2500/-ක දීමනාවක් වශයෙන් ලබා දුන් අතර 2024 ජුනි මස සිට රු.5000/-ක් දක්වා එම දීමනාව ඉහළ නංවා ඇත. රු.2500/-ක දීමනාව සඳහා 2024 වර්ෂයට අදාළව රු. මිලියන 550ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබූ නමුත්, එම දීමනාව රු.5000/-ක් දක්වා ඉහළ නැංවීම මත අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා අමතරව රු. මිලියන 165.200ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරය මගින් ඉල්ලුම් කරන ලදි. ඒ අනුව, ගර්භණී මව්වරුන්ට රුපියල් 45,000/-ක පෝෂණ දීමනාවක් ලබා දීමේ වැඩසටහන සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයෙන් ගුරු දීමනා වැඩසටහන සඳහා අවශ්‍ය රු. මිලියන 165.200ක ප්‍රතිපාදන ප්‍රමාණය වැඩසටහන වෙත ලබා දී ඇත.

ඒ අනුව, මෙම වැඩසටහන වෙනුවෙන් වාර්ෂිකව වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 715.200 ක් වන අතර වාර්ෂික ඉලක්කය ප්‍රතිලාභී ගුරුවරු 16,000කි. 2024.12.31 දිනට ප්‍රතිලාභී ගුරුවරු 15,669 වෙනුවෙන් දරන ලද මුළු වියදම රු. මිලියන. 671.598 ක් වේ.

**3. පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන නියාමනය හා අධීක්ෂණ අනු කමිටුව**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ගුරු ඩිප්ලෝමා ආයතන 64ක් පවතින අතර මේ වනවිට අදාළ ආයතනවල නියාමන කටයුතු පළාත් වශයෙන් ආරම්භ කර ඇත. 2024.12.31 දින වනවිට ආයතන 05ක නියාමන කටයුතු වෙනුවෙන් දරන ලද මුළු වියදම රු. මිලියන 0.028ක් වේ.

**4. පෙර පාසල් දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්/ප්‍රතිලාභ**

**පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේලක් ලබා දීමේ වැඩසටහන**

පෙර පාසල් වියේ පසුවන අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීමේ අරමුණ මත 2024 වර්ෂයේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වතු සහ වතු නොවන ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන සඳහා 2024 වර්ෂයට රු. මිලියන 2,102.000ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර ඇත. 2024.12.31 දින වනවිට වතු නොවන සහ වතු මුළු පෙර පාසල් 6674ක් තුළ මුළු දරුවන් 147,927 ක් සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 1,398.741ක් වේ.

**5. අරුණ දකින රටා සිතුවම් ප්‍රදර්ශනය**

පෙර පාසල්වියේ පසුවන දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතාවන් වර්ධනය කරලීමේ අභිප්‍රාය යටතේ ලෝක ළමා දින සැමරුම් උළෙල 2024 ට සමගාමීව ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ජාතික මට්ටමින් චිත්‍ර නිර්මාණය කිරීම, ඇගයීම හා තෝරා ගන්නා ලද චිත්‍ර නිර්මාණ ඇසුරින් ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කෙරිණි.

ඒ යටතේ, 2024.12.31 වනවිට චිත්‍ර 81,000කට අධික ප්‍රමාණයක් ලැබී ඇති අතර ඉන් චිත්‍ර 250ක ප්‍රමාණයක් සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨය මගින් පත්කර ගන්නා ලද කමිටුවක් මගින් තෝරා ගන්නා ලදි. එම තෝරාගත් දරුවන්ගේ චිත්‍ර සඳහා 2024 වර්ෂයේ ලෝක ළමා දිනය හා සමගාමීව චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීම, සහතික හා ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වා ඇගයීම සිදු කරන ලදි.

**ක්‍රියාත්මක කරන ලද වෙනත් වැඩසටහන්**

**6. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව**

ජාතික මට්ටමේ සැලසුම් සම්පාදනයේ දී, ක්‍රියාත්මක කිරීමේ දී සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කාර්යයන් වලදී ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා බහු ආංශික සහයෝගීතාවය සහතික කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය හා ජාතික මට්ටමේ තීන්දු තීරණ ගැනීම මෙම කමිටුවෙහි අරමුණ වන අතර 2024.12.31 දින වනවිට කමිටු වාර 2 ක් පවත්වා ඇත.

**7. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2018) ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට යුනිසෙෆ් ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත අවසන් කර ඇත. ඒ අනුව 2025-2028 දක්වා, සියලු පාර්ශ්වකාර ආයතන සම්බන්ධ කර ගනිමින් මෙම ක්‍රියාකාරී සැලැස්මෙහි අවසන් වලංගුකරණය සිදු කර ඇත. එහි භාෂා පරිවර්තන කටයුතු සිදු කරමින් පවතින අතර, එය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**8. මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් විසින් ඉටු කරනු ලබන කාර්යයන්වල ප්‍රගතිය ඇගයීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වෙමින් මාසික හා කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. ඒ අනුව, 2024.12.31 වනවිට මාර්ගගත ක්‍රමය ඔස්සේ කාර්තුවකට 1 බැගින් කාර්තු 4 අවසානයේ රැස්වීම් වාර 04 ක් සහ මාසිකව රැස්වීම් වාර 12 ක් පවත්වා ඇත.

**9. නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය**

තෝරාගත් පවුල් ඒකක සඳහා අවශ්‍ය මැදිහත්කරණය හා මඟ පෙන්වීම තුළින් නිවස තුළ දරුවාගේ උපරිම යහපත හා සංවර්ධනයට ඉඩ සැලසෙන ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම, දෙමාපියන් හා රැකබලාගන්නන්ගේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය හා සම්බන්ධ දැනුවත්භාවය ඉහළ

නැංවීම තුළින් දරුවාගේ සමස්ත සංවර්ධනය තහවුරු කිරීම, පවුල තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම තුළින් ළමා මන්දපෝෂණය අවම කිරීම, අවදානම් සහගත සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මුල් කාලීනව හඳුනා ගැනීම හා අවශ්‍ය සේවාවන් සඳහා යොමුකිරීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී 2024 වර්ෂය සඳහා සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර 2024.12.31 වනවිට පවුල් ඒකක 600ක් බලගැන්වීමට කටයුතු කර ඇත.

**ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

**10. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය**

සෑම වර්ෂයකම ජූලි මස 14 දින සිට 20 දින දක්වා මුල් ළමාවිය විෂය හා සම්බන්ධව වගකිවයුතු සියලු පාර්ශ්වයන් ඒකරාශි කර ගනිමින්, මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක සහ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම සිදු කරයි. ඒ අනුව, 2024 වර්ෂයේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික සතිය සැමරීම සඳහා **'පිබිදෙන දරු කැලට මඟ සලසමු'** තේමාව ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ යටතේ,

| දිනය | වැඩසටහනේ තේමාව | ඉලක්කගත ප්‍රතිලාභීන් | පැවැත්වූ දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| **2024.07.14** | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ දෙමාපියන්ගේ කාර්යභාරය | පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් | වෙබිනා වැඩසටහන |
| **2024.07.15** | මුල් ළමාවිය දරුවන් සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ මූලික සංකල්ප | පෙර පාසල් දරුවන් | ත්‍රිකුණාමලය |
| **2024.07.16** | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාලය ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහනක් | රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන හා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන සියලු ආයතනයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින් | කොළඹ |
| **2024.12.17** | නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීම | මුල් ළමාවිය සංවර්ධන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය සඳහා | කොළඹ |
| **2024.12.18** | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | ක්ෂේත්‍ර නිලධාරීන් (සංවර්ධන නිලධාරීන්/ ග්‍රාම නිලධාරීන්/ මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්) | මහනුවර |
| **2024.07.19** | ගැබිණි මව්වරුන් දැනුවත් කිරීමේ සහ රසවින්දනාත්මක ජාතික වැඩසටහන | ගැබිණි මව්වරුන් | කොළඹ |
| **2024.07.20** | සෙල්ලම් පාදක ඉගෙනුම තුළින් මුල් ළමාවිය සංවර්ධනය | පෙර පාසල් ගුරුවරියන්<br>දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන්<br>ළමා නිවාස පාලිකාවන් | වෙබිනා වැඩසටහන |

**11.ෆේස්බුක් පිටුව සහ යූ ටියුබ් මාධ්‍යය මගින් මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කෙටි වීඩියෝපට සහ සටහන් මගින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (Promotion of ECCD through FB, Youtube)**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් නිල ෆේස්බුක් පිටුවක් (NSECD Facebook) සහ යූ ටියුබ් චැනලයක් (NSECD YouTube Channel) ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනයට අදාළව සකස් කරන ලද පෝස්ටුව (Post) සහ විවිධ වීඩියෝපට 07 සහ දැන්වීම් සටහන් 20 සමාජ මාධ්‍ය වෙත 2024 වර්ෂය අවසානය වනවිට මුදා හැර ඇත.

## 2.2.4. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. ළමා උපකාරක දුරකතන සේවය 1929 පවත්වාගෙන යාම**

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙමගින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම ද පැය 24 පුරාම සිදුකරයි. 2024.01.01 සිට 2024.12.31 වන විට 1929 දුරකතන සේවාව ආමන්ත්‍රණය කරන ලද ඇමතුම් සංඛ්‍යාව 29,667කි. ඉන් 7,362ක් පැමිණිලි ලෙස ලැබී ඇත.

එම පැමිණිලි අතරින් වැඩිම සංඛ්‍යාව වන්නේ භාරය හා ආරක්ෂාවට අදාළ පැමිණිලි වන අතර එය 2,756ක් වෙයි. කෲරත්වයට අදාළ පැමිණිලි 1,950ක් ලැබී ඇත. අනිවාර්යය අධ්‍යාපනය කඩවීම් හෝ ඊට අදාළ පැමිණිලි 1,628ක් ලැබී තිබුණි. ළමා ශ්‍රමයට අදාළ පැමිණිලි 165කි. ළමා දුරකථන සේවය සඳහා දරා ඇති වියදම රු. මිලියන 0.649කි.




*මූලාශ්‍රය : දිස්ත්‍රික් වශයෙන් පැමිණිලි ලැබීම් වාර්තාව 2024 - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය*

**2. පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරැකුම් පච්ච)**

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයන්ගෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම මෙහි අරමුණු වේ. මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 2011/ 17 චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වැඩසටහන සිදුකරයි. මෙම වසරේ දී නව පාසල් ළමා ආරක්ෂක කමිටු 687ක් ස්ථාපිත කර ඇති අතර, කමිටු 114 ක් ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සිදුකරන පාසල් ළමා ආරක්ෂක කමිටු ඇගයීම් වැඩසටහන යටතේ

පාසල් 908ක ඇගයීම් සිදුකර ඇත. මේ වන විට දරා ඇති වියදම රු. මිලියන 1.765කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 23,260කි.

| පාසල් ළමා ආරක්ෂක කමිටු ක්‍රියාවලිය | | | | | |
|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් අනුව ක්‍රියාත්මක පාසල් ළමා ආරක්ෂක කමිටු | | | | | |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | | | | | |
| අ.අ | දිස්ත්‍රික්කය | මුළු ද්වීතියික පාසල් සංඛ්‍යාව | මුළු ප්‍රාථමික පාසල් සංඛ්‍යාව | සමස්ත පාසල් සංඛ්‍යාව | 2024.12.31 දිනට ස්ථාපිත කර ඇති කමිටු සංඛ්‍යාව |
| 1 | කොළඹ | 287 | 112 | 399 | 408 |
| 2 | ගම්පහ | 351 | 185 | 536 | 186 |
| 3 | කලුතර | 274 | 146 | 420 | 429 |
| 4 | මහනුවර | 445 | 206 | 651 | 680 |
| 5 | මාතලේ | 188 | 129 | 317 | 335 |
| 6 | නුවරඑළිය | 278 | 272 | 550 | 568 |
| 7 | ගාල්ල | 241 | 188 | 429 | 437 |
| 8 | මාතර | 231 | 127 | 358 | 362 |
| 9 | හම්බන්තොට | 226 | 94 | 320 | 337 |
| 10 | යාපනය | 247 | 201 | 448 | 513 |
| 11 | මන්නාරම | 73 | 60 | 133 | 138 |
| 12 | වවුනියා | 79 | 94 | 173 | 190 |
| 13 | මුලතිවු | 66 | 61 | 127 | 146 |
| 14 | කිලිනොච්චි | 64 | 40 | 104 | 109 |
| 15 | මඩකලපුව | 204 | 158 | 362 | 441 |
| 16 | අම්පාර | 262 | 178 | 440 | 624 |
| 17 | ත්‍රිකුණාමලය | 194 | 119 | 313 | 362 |
| 18 | කුරුණෑගල | 543 | 330 | 873 | 877 |
| 19 | පුත්තලම | 275 | 97 | 372 | 379 |
| 20 | අනුරාධපුරය | 307 | 255 | 562 | 576 |
| 21 | පොළොන්නරුව | 118 | 135 | 253 | 265 |
| 22 | බදුල්ල | 376 | 229 | 605 | 605 |
| 23 | මොනරාගල | 204 | 87 | 291 | 311 |
| 24 | රත්නපුර | 411 | 187 | 598 | 602 |
| 25 | කෑගල්ල | 327 | 194 | 521 | 531 |
| | මුළු එකතුව | 6271 | 3884 | 10155 | 10411 |
| මූලාශ්‍රය:- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | | | | | |

### 3. විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නියාමන කටයුතු සිදු කිරීම

ළමා අපයෝජන හේතුකොට වින්දිත වූ ළමුන් සඳහා නෛතික සහාය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය අධිකරණයේ පෙනී සිටීම් 2,049 ක් 2024 වර්ෂය තුළ සම්පූර්ණ කර ඇත. එමෙන්ම නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 12 ක් සිදුකර ඇති අතර, පුද්ගලයින් 803කට නීතිමය සහාය ලබා දී ඇත. සයිබර් නිරීක්ෂණ පැමිණිලි 209 ක් ලැබී ඇත. දරා ඇති වියදම රු. මිලියන 5.060 කි.

**4. අපරාධ නඩු කටයුතු නියාමනය**

අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා අධිකාරිය කටයුතු කරනු ලබයි. ඒ යටතේ රජයේ නිවාසයන්හි නේවාසිකයින් හා රැඳවියන් පිළිබඳව නියාමනය සිදු කරයි. මෙහිදී සිද්ධි 498ක් පිළිබඳව කටයුතු කර තිබේ. දරා ඇති වියදම රු. මිලියන 0.432කි.

**5. ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම**

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත්වන ළමුන් ද්විතීයික වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හා දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) ළමා පියස පරිශ්‍රයේ පිහිටුවන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මගින් ද ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදුකරයි. 2024 වර්ෂය තුළ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 209 ක් අවසන් කර ඇති අතර, අධිකරණ නියෝග හා නීතිපතිවරයාගේ නියෝග මත සාක්ෂි සටහන් 232 ක් නිකුත් කර ඇත. එමෙන්ම මහාධිකරණ නඩු වාර 110ක් සඳහා පෙනී සිට ඇත. දරා ඇති වියදම රු. මිලියන 0.274 කි.

**6. ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය උපකාර සේවාව**

ළමුන් අපයෝජනය වීමට ඇති අවදානම වැළැක්වීම, අධ්‍යාපනය සඳහා සහාය සහ කායික හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙමගින් ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය සහායන් ළමයින්ට ලබා දෙයි. 2024 වර්ෂය තුළ ළමුන් 119ක් සඳහා මනෝ සමාජීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇති අතර, ළමා අපයෝජන පැමිණිලි පසු විපරම් 288ක් සිදු කර ඇත. එමෙන්ම ඊට අමතරව මනෝ සමාජීය උපදේශන 118ක් හා සිද්ධි සම්මන්ත්‍රණ 18ක් පවත්වා ඇත. දරා ඇති වියදම රු. මිලියන 0.781කි.

**7. කැපකරු සත්කාර වැඩසටහන යටතේ සුනාමියෙන් විපතට පත් වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම**

සුනාමි ව්‍යසනයෙන් වින්දිතභාවයට පත් වූ ළමුන්ගේ භාරකාරිත්වය පරීක්ෂාවට ලක්කරමින් ළමුන්ගේ උපරිම යහපත තහවුරු කෙරෙන භාරකාරිත්වය හා රැකවරණය සඳහා නිර්දේශ සැපයීම සහ "සැමට අධ්‍යාපනය" යන තිරසර තේමාව යටතේ සුනාමි ව්‍යවසනයෙන් වින්දිත, ආන්තික හා අනාරක්ෂිතභාවයට පත් වූ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම හා ඔවුන්ගේ අධ්‍යාපන අයිතීන් ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙම වසරේ දී ළමුන් 08 දෙනකු සඳහා අධ්‍යාපනික ආධාර ලබා දීම සිදුකරන ලද අතර, සුනාමි මණ්ඩල 04 ක් පවත්වා ඇත. සමස්ත වියදම රු. මිලියන 0.499 කි.

**8. ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14(ග) වගන්තියට අනුව ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන, ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරයකි. ඒ අනුව, ළමා සංවර්ධන මධ්‍යස්ථාන 296ක් අධීක්ෂණය හා නියාමනය කිරීම සිදු කර ඇත. දැනුවත් කිරීමේ

වැඩසටහන් 14ක් සිදුකර ඇත. දැනුවත් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 696කි. දරා ඇති වියදම රු. මිලියන 0.877කි.

**9. ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා "විශ්ව විද්‍යාල තානාපති" ජාතික වැඩසටහන**

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් හා විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීම සහ පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කෙරේ. මෙම වසරේ ලියාපදිංචි පාසල් සංඛ්‍යාව 201කි. දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති පුහුණු වැඩසටහන් 15ක් පවත්වා ඇත. දිස්ත්‍රික් සමුළු 15ක් සිදුකර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ ශිෂ්‍ය තානාපති සම්පත් සංචිතය සඳහා එක් පුහුණු වැඩසටහනක් පවත්වා ඇත. මේ වන විට දරා ඇති වියදම රු. මිලියන 1.595කි.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති වැඩසටහන මඟින් පාසල් ශිෂ්‍යයන් සමඟ එක්ව වැඩ කටයුතු කරමින් ළමා ආරක්ෂාව තහවුරු කිරීමට දායකත්වය විශ්වවිද්‍යාල සිසුන් ලබා දෙයි. විශ්වවිද්‍යාල සිසුන් 1337ක් ලියාපදිංචි කර ඇත. පුහුණු වැඩසටහන් 12ක් පවත්වා ඇත. දරන ලද මුළු වියදම රු. මිලියන 0.456කි.

**10. අදාළ ළමා ආරක්ෂණ අංශ 10 තුළ ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ උපදේශනය, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සහ මෙවලම් සංවර්ධනය කිරීම**

මෙම වැඩසටහන් යටතේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන නව වෛද්‍යවරුන්, විද්‍යාපීඨ ගුරුසිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් හා හෙද නිලධාරීන් ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම මෙහි මූලික අරමුණ වේ. මේ යටතේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යාපනය ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක්, රජරට විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් හා සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක්, හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් සහ විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පවත්වා ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3,349කි.

**11. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම**

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු වේ. මේ යටතේ පුහුණු වැඩසටහන් 02ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 28ක් පවත්වා ඇත. දරන ලද වියදම රු. මිලියන 1.486කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1452කි.

**12. ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහන්**

මෙම වැඩසටහන් යටතේ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන් සහ පාසල් වැන්රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. වැඩසටහන් 84ක් පවත්වා ඇත. දරන ලද වියදම රු. මිලියන 3.880කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 5475කි.

මෙම ප්‍රධාන වැඩසටහන්වලට අමතරව ආන්තික, අවදානම්සහගත, අවදානමට ලක්විය හැකි, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනයන්ට ගොදුරුවූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබා දීම, ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය සහ සන්නිවේදන වැඩසටහන්, ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය උපකාර සේවාව සහ ළමා ආරක්ෂණය පිළිබඳ විශේෂ ප්‍රජාවන් සඳහා සිදු කරන වැඩසටහන (වැවිලි, නාගරික, වතු, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ප්‍රජාවන්, සංචාරක ප්‍රදේශ, සමාජීය වශයෙන් සංක්‍රමණික මවුවරුන්ගේ ළමුන්, වීදි ළමුන්, ආබාධිත ළමුන්, ළමා ශ්‍රමිකයින්) යනාදී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. දරන ලද වියදම රු. මිලියන 2.186 කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1857කි.

**13. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)**

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් ළමා ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවාවේ මෙහෙයුම් කටයුතු සඳහා සහ අධිකාරියේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා දරන ලද වියදම රු. මිලියන 4.518කි.

## 2.2.5. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුවේ.

මේ යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වෙන් කරනු ලබන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වලට අමතරව කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිමත් කිරීම අරමුණු කරගනිමින් වැඩසටහන් රැසක් දීප ව්‍යාප්තව සිදුකරනු ලබයි.

අප ආයතනය සතුව සිටින දීප ව්‍යාප්තව දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් (වනිතා සංවර්ධන නිලධාරි, වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිලධාරි, උපදේශන නිලධාරි, උපදේශන සහකාර) විසින් ප්‍රතිපාදන මත පදනම් නොවී කාන්තාවන්ගේ දැනුම, ආකල්ප හා කුලසතා වර්ධනය කරනු වස් විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

## කාන්තාවන්ගේ ආර්ථික සවිබලකරණය උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

### 1. ස්වයං රැකියා පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය සැපයීම. (අත්කම්, කර්මාන්ත, ව්‍යාපාරික කළමනාකරණය)

දිවයින පුරා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්තව විවිධ රාජ්‍ය ආයතනවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් රැසක් සේවය කරනු ලබයි. (කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, කෘෂිකර්ම උපදේශක, අපනයන ව්‍යාපෘති සංවර්ධන නිලධාරි) මෙම නිලධාරීන්ගේ සහාය ලබා ගනිමින් කාන්තාවන් සඳහා වෘත්තීය පුහුණු වැඩමුළු සංවිධානය කිරීම සිදු කරයි.

එමෙන්ම, ග්‍රාමීය හා අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන වැඩිදියුණු කිරීම යටතේ ප්‍රාදේශීය වශයෙන් සුලබ සම්පත් භාවිතා කරමින් වෙළඳපොළ ඉල්ලුමට සරිලන නිෂ්පාදන සිදු කිරීම සඳහා ශිල්පීය දැනුම ලබා දෙමින් කාන්තාවන්ගේ ආර්ථික සංවර්ධනය අරමුණ කර ගත් වැඩසටහන් රාශියක් ද පවතී.

මේ යටතේ අඩු ආදායම්ලාභී නාගරික කාන්තාවන්, අඩු ආදායම්ලාභී කාන්තාවන්, ධීවර කර්මාන්තය ආශ්‍රිත කාන්තාවන්, වතු ආශ්‍රිත කාන්තාවන්, ආබාධිත කාන්තාවන්, විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන්, සුවිශේෂී හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන්, දිගු කාලයක් බන්ධනාගාරගත වූවන්ගේ පවුල්, ආපදාවට ලක්වූ කාන්තාවන්, නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන් හා ස්ත්‍රී මූලික පවුල්වල කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සිදුවේ. 2024 වර්ෂය තුළ වැඩසටහන් 256ක් ක්‍රියාවට නංවා ඇති අතර, ඒ සඳහා වැය වූ මුදල සඳහා රු. මිලියන 29.118කි.

### 2. අඩු ආදායම්ලාභී නාගරික කාන්තාවන් සවිබලගැන්වීමේ වැඩසටහන

ශ්‍රී ලාංකීය නාගරික අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබලගැන්වීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක කරනු ලබයි. නාගරික කාන්තාවන් තුළ ඇති හැකියාවන් හා දක්ෂතා මත ස්වයං රැකියා ගැන්වීම සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දෙන අතර මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන්ගේ පවුලේ සමාජීය හා ආර්ථික සංවර්ධනය, සමාජ විරෝධී කාර්යයන් සඳහා යොමු වීමේ ප්‍රවණතාව අවම වීම අපේක්ෂා කරයි.

### 3. වැන්දඹු හා ගෘහමූලික කාන්තා ආධාර වැඩසටහන

විවිධ හේතූන් මත වැන්දඹුභාවයට පත් හා ගෘහමූලික කාන්තාවන් ව්‍යවසායිකාවන් බවට පත් කිරීම උදෙසා අවශ්‍ය සවිබලය සපයයි. මෙහි දී ස්වයං රැකියා සඳහා අවශ්‍ය පුහුණුව, භාණ්ඩ හා උපකරණ ලබා දෙනු ලබයි. එක් ප්‍රතිලාභිනියකට රු. 100,000/-ක් දක්වා ප්‍රතිලාභ හිමිවේ. 2018 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රතිලාභීන් 700ක් ප්‍රතිලාභ ලබා ඇත.

ප්‍රතිලාභීන් තෝරාගැනීමේ දී අධ්‍යාපනය ලබන දරුවන් සිටින ගෘහමූලික කාන්තාවන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙනු ඇත.

**4. කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා වන 'දිරිය මංපෙත' වැඩසටහන**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52% ක් වූ කාන්තාවන් රටේ ආර්ථිකය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීම සඳහා ගෘහණියන් ලෙස පමණක් කාර්යයන් ඉටු කරන හා ආර්ථික අපහසුතාවන්ට පත් වූ කාන්තාවන් ඉලක්ක කර පවුල් ඒකකවලට ශක්තියක් ලබා දීමේ අභිප්‍රාය මත 'දිරිය මං පෙත' නමින් මෙම වැඩසටහන ක්‍රියාත්මකයි. රැකියා අවස්ථා බිහිකිරීමේ අරමුණින් ඔවුන් ස්වයං රැකියා ගැන්වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රමුඛ පරමාර්ථය වේ.

ග්‍රාමීය කාන්තාවක් වශයෙන් ඔවුන් හා පවුල මුහුණ දී ඇති සමාජ ආර්ථික ගැටලු මගහරවා ගැනීම සඳහා ආර්ථික සවිබලයක් සැපයීම සඳහා ක්‍රියාත්මකයි. තනි හෝ කණ්ඩායම් වශයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබා දේ. තම ප්‍රදේශයට ආවේණික අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් ආර්ථික කටයුතුවල නියැලි ව්‍යාපෘති සාර්ථකව පවත්වා ගෙන යයි.

**5. විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන**

කාන්තාවන් රැකියා සඳහා විදේශගත වීම නිසා සිදුවන දරුවන් අනාරක්ෂිත වීම් තුළින් ඇතිවන විවිධ ගැටලු, පවුල් බිඳවැටීම් හා විදේශයන්හිදී මුහුණපාන විවිධ හිංසන ආදි ගැටලු සඳහා විකල්පයක් ලෙස ඔවුන් ස්වයං රැකියාගත කිරීම මගින් තම නිවස තුළම රැඳවීමටත්, ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමටත් මෙමගින් කටයුතු කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණු වන්නේ කාන්තාවන් විදේශගතවීම නිසා පවුලේ සාමාජිකයන්ට ඇතිවන අවදානම දුරු කිරීම, කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම තුළින් පවුලේ දියුණුව හා සමාජයේ යහපැවැත්ම ඇති කිරීම, විදේශගතවීමට ආදේශකයක් ලෙස ස්වයං රැකියා මඟින් ස්ථාවර ආර්ථිකයක් ගොඩනැගීම පිළිබඳ දැනුවත්භාවය ලබා දීම, දරුවන්ට මවගේ සෙනෙහස ලබා දීම තුළින් ඔවුන්ගේ අනාගතය වඩා යහපත් කරවීම, කාන්තාව සමස්ත සංවර්ධන කාර්යයන්ට දායක කර ගැනීම සඳහා සජීවීව සහභාගී කර ගැනීම, සමස්තයක් ලෙස කාන්තාවන් විදේශගත වීමෙන් සිදුවන අහිතකර ප්‍රතිඵල දුරු කිරීම හා කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමයි.

**6. වතු අංශයේ කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම ව්‍යාපෘතිය**

වතු අංශයේ කාන්තාවන් මුහුණපාන ආර්ථික හා සාමාජීය ගැටලු සඳහා සහනයක් වෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය යහපත් මට්ටමකට ගෙන ඒම සඳහා මෙරට තුළ කුඩා කර්මාන්තයක හෝ ස්වයං රැකියාවක නිරතවීම තුළින් ස්ථාවර ආර්ථිකයක් ගොඩනගා ගැනීමට ඇති හැකියාවට අත්වැලක් වීම.

මෙම ව්‍යාපෘතියෙහි අරමුණු වන්නේ ආදායමට සරිලන ලෙස වියදම සකසා ගැනීම හා ඉතිරි කිරීම් පිළිබඳ නිසි අවබෝධයක් ලබා දීම, කාන්තාවන් දේශීය වශයෙන් ආදායම් උත්පාදන මාර්ගවලට යොමු කිරීම හා පවුලේ ආදායම ඉහළ නැංවීම, දේශීය වශයෙන් ග්‍රාමීය කාන්තාවන් ඍජුව ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීයව දායක කර ගැනීම, වතුකරයේ පවුල්වල විරැකියා ගැටලුව අවම කිරීමයි.

## 7. සුවිශේෂී හේතුන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාව ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම යටතේ 'දිවියට අරුතක්' වැඩසටහන

සමාජයේ මෙතෙක් අවධානය නොලැබූ සුවිශේෂී හේතුන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා 'දිවියට අරුතක්' වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහනේ ප්‍රධාන වශයෙන් සිදුවන්නේ ආර්ථික අපහසුතා මත සිටින කාන්තාවන් ආර්ථිකව සවිබලගැන්වීම සඳහා කටයුතු කිරීම වේ. මෙහිදී ස්වයං රැකියා සඳහා යොමු කර ආදායමක් උපයා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම හා එයට අවශ්‍ය අනෙකුත් පහසුකම් සපයනු ලැබේ.

විවිධ ආර්ථික අපහසුතා සම්බන්ධයෙන් අප අමාත්‍යාංශයට එවන ලද ඉල්ලීම් ලිපිවලට අනුව වාර්තා හා ව්‍යාපෘති යෝජනා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මගින් ලබා ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු කරයි.
දැඩි ආර්ථික අර්බුද හා අනපේක්ෂිත ලෙස ආර්ථික බිඳවැටීම්වලට ලක්ව සිටින කාන්තාවන් ව්‍යවසායක කාන්තාවන් ලෙස නඟා සිටුවීම මගින් එම පවුල්වල ආර්ථිකය නඟා සිටුවීම, රටේ සංවර්ධනයට කාන්තා දායකත්වය ඉහළ නංවා ගැනීම මෙන්ම කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරයි.

## 8. බන්ධනාගාරගත රැඳවියන්ගේ පවුල් ආර්ථිකව සුරක්ෂිත කිරීමේ වැඩසටහන

දීර්ඝ කාලීනව ස්වාමිපුරුෂයන් බන්ධනාගාර ගතවූ ගෘහ කුටුම්භයන් හි ආර්ථිකය නඟා සිටුවීම මෙන්ම සුළු වැරදි සඳහා බන්ධනාගාර ගතව නිදහස් වන කාන්තාවන් නැවත බන්ධනාගාර ගතවීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි. මෙමගින් ස්වාමිපුරුෂයන් බන්ධනාගාරගත වූ පවුල්වල කාන්තාවන් සහ බන්ධානාගාරගතව නිදහස් වන කාන්තාවන් සඳහා පුහුණුව, උපකරණ හා අමුද්‍රව්‍ය ලබා දීම මගින් ඔවුන්ට ස්වයං රැකියාවක නිරත වීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සිදු කරයි.
කාන්තාවන් නැවත නැවතත් බන්ධනාගාරගත වීම වැළැක්වීම, ස්වාමිපුරුෂයා දීර්ඝ කාලයකට සිර ගත වීම නිසා පවුලේ ඇතිවන ආර්ථික හා සාමාජීය ගැටලුවලට විසඳුම් ලබා දීම, එම කාන්තාවන් ව්‍යවසායක කාන්තාවන් ලෙස නඟා සිටුවීම, පුනරුත්ථාපනය වූ කාන්තාවන් මගින් අනෙක් කාන්තාවන්ට ද ආදර්ශ ලබා ගැනීමට හැකිවීම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කෙරේ.

## 9. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන සැලසීම

නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන ලබා දීම සඳහා ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීමත්, එම පවුල්වල මාසික ආදායම ඉහළ නැංවීම තුළින් ඔවුන් ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදයෙන් මුදවා ගැනීම සඳහා අවස්ථාව සලසා දීමත්, ගෘහ ඒකකය තුළ කාන්තාවන්ගේ කාර්යභාරයන් හා වගකීම් සැලකිල්ලට ගන්නා අඛණ්ඩ හා ස්ථාවර ජීවනෝපාය

අවස්ථා ග්‍රාමීය කාන්තාවන්ට උදාකර දීමත් අරමුණු කරගනිමින් මෙම වැඩසටහන අදියර කිහිපයක් යටතේ මේ වන විට ක්‍රියාත්මක කරනු ලැබේ.

2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය ද සමඟ මුළු දිවයින පුරා නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන් පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වනිතා සංවර්ධන නිලධාරීන් මගින් කාන්තා කාර්ය සංවිධාන මට්ටමින් දත්ත රැස් කිරීම ආරම්භ කරන ලද අතර බලපෑමට ලක්වූ කාන්තාවන්ගේ දත්ත විශ්ලේෂණය, ප්‍රතිලාභීන් තෝරා ගැනීම, දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් සඳහා ඔවුන් යොමු කිරීම සහ ඔවුන්ට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති ආධාර ලබා දීම සිදු කරයි.

**10. දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම**

සියලුම වයස් කාණ්ඩවලට අයත් කාන්තාවන්ගේ සුවිශේෂී අවශ්‍යතා හඳුනා ගෙන එම අවශ්‍යතා පරිපූර්ණ කර ගැනීමට මෙම වැඩසටහන සංවිධානය කෙරේ. මේ යටතේ,

**11. ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන**

- ශ්‍රී ලංකාව තුළ අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය සහ ජීවනෝපාය මාර්ග සඳහා සහාය ලබා දීම සඳහා ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාමීය කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක සියලුම ණය වැඩසටහන් සඳහා (චක්‍රීය ණය වැඩසටහන/ වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම/ විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදනය/ පශු සම්පත්/ දිරිය මංපෙත ආදී වැඩසටහන්) සුදුසුකම් ලැබිය හැක්කේ ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණුව ලබා ගැනීමෙන් අනතුරුවය. මේ තුළින් අඩු ආදායම්ලාභී කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම හා ව්‍යවසායිකාවන් ලෙස තම කටයුතු පවත්වාගෙන යාමට මඟ පෙන්වීම, පුහුණුව ලබා දීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවය ලබා දීම සිදු කරනු බලයි.
- ව්‍යවසායකත්ව අත්දැකීම් හුවමාරු වැඩසටහන් සම්බන්ධීකරණය
  ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ සහයෝගය මත ව්‍යවසායකත්වය මගින් සවිබලකරණය වූ ව්‍යවසායිකාවන් රැසක් දිවයින පුරා විසිරී පවතී. අපගේ ක්ෂේත්‍රගත වනිතා සංවර්ධන නිලධාරීන් විසින් ඔවුන්ගේ සහයෝගය, දැනුම හා අත්දැකීම් අනුසාරයෙන් මූලික මට්ටමේ සිටින කාන්තා ව්‍යවසායිකාවන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලබන අතර මෙම වැඩසටහන ඉතාමත් ප්‍රායෝගික ක්‍රමවේදයක් ලෙස කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා යොදාගනී.
- මෙම වැඩසටහන යටතේ ස්වයං රැකියා සඳහා යොමු වී ඇති කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් ලබා ගත් කුසලතාවන් තුළින් දේශීය සම්පත් රටේ ආර්ථිකය කරා යොමු

කරවමින් ගුණාත්මක තත්ත්වයෙන් යුත් වෙළඳ පොළ වටිනාකමක් ඇති ප්‍රමිතියෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා උනන්දුව ඇති කිරීමත් අළෙවි පොළ අවස්ථා හඳුන්වා දීම හා අත්දැකීම් හුවමාරුව ඇති කිරීම ද සිදු කෙරේ. කාන්තා කාර්ය සංවිධාන මැදිහත්වීම හරහා මෙම කණ්ඩායම්වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට හා ඔවුන්ව සමාජ ප්‍රවාහයට එක් කිරීම සඳහා පවුලේ සුභ සාධනය ඉහළ නංවමින් කාන්තාවන් රටේ ආර්ථික සංවර්ධනයට සෘජුවම හා වක්‍රව දායක කරලීමට අපේක්ෂිතය.

**12. ළමා නිවාසවල සිට ඉවත්වන අවු. 18 ඉක්මවූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ හෙද පුහුණුව ලබා දීම හා අවශ්‍ය මූලික පුහුණුව ලබා දීම**

ළමා නිවාසවල සිට ඉවත්වන අවුරුදු 18 ඉක්මවූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා ජීවනෝපාය හා සුභ සාධන පහසුකම් ලබා දීම යටතේ රු. මිලියන 1.000ක ප්‍රතිපාදන මත ගම්පහ දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

**13. වෙළඳපොළ ප්‍රවර්ධනය සහ කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ**

විවිධ අභියෝග හමුවේ කාන්තාවක් ලෙස ඇය පවුල තුළ විවිධ ආර්ථික හා සමාජ ගැටලු රැසකට මුහුණ දෙනු ලබයි. එවන් තත්ත්ව අභිබවා ව්‍යවසායිකාවක් ලෙස නිෂ්පාදන හා සේවා සපයමින් ව්‍යාපාරික කටයුතුවල නිරත වීමට වෙර දරන කාන්තාවන් හඳුනාගෙන ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන්හි ගුණාත්මක තත්ත්වය ඇති කිරීම, වෙළඳ පොළ අවස්ථා හඳුන්වාදීම, වෙළඳ පොළ පුළුල් කිරීම මෙන්ම ඩිජිටල් අලෙවිකරණය වෙත යොමු කිරීම තුළින් ආර්ථිකය වැඩි දියුණු කර ගැනීම මෙන්ම පවුල තුළ හා සමාජීය තත්ත්වය යහපත්ව පවත්වාගෙන යෑමට යෝග්‍ය පවුල් පරිසරයක් ඇති කිරීම පිණිස මෙම වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව දිස්ත්‍රික් 11 ආවරණය වන පරිදි අමාත්‍යාංශ ප්‍රතිපාදන රුපියල් 877,571.000 යොදා ගනිමින් ව්‍යවසායකයින් 563ක් බලගැන්වීමට හැකි විය.



## සුවිශේෂ වැඩසටහන්

**14. වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සඳහා වන ජාතික මධ්‍යස්ථානය - කිලිනොච්චිය කේන්ද්‍ර කරගනිමින් ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ සුභ සාධනය සඳහා 2015.11.13 දින ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය මගින් කාන්තාවන් සඳහා තාක්ෂණික පුහුණුව අනුව ආදායම් උත්පාදන අවස්ථා ලෙස තල් නිෂ්පාදන, මැහුම් ව්‍යාපෘති, විසිතුරු භාණ්ඩ, ගව පාලනය, එළු පාලනය යනාදි ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් සපයන අතර ඒ සඳහා අවශ්‍ය පුහුණුව හා ආධාර ලබා දෙනු ඇත. ගෘහමූලික කාන්තා පවුල් බලගැන්වීම සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (කිලිනොච්චිය) මගින් ගෘහමූලික කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 1.000ක ප්‍රතිපාදන වැය කර ඇත.



**15. කාන්තාවන් සමාජීය වශයෙන් සවිබලගැන්වීම**

කාන්තාවන්ගේ සාමාජීය සවිබලකරණය උදෙසා පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

කාන්තාවන් වීම නිසාම මුහුණදෙන සමාජීය දුෂ්කරතා මග හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණ වේ.

- ස්ත්‍රී, පුරුෂ සමාජභාවීය දැනුම්වත් කිරීමේ වැඩසටහන්
  ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ නිලධාරීන් විසින් තම සම්පත් දායකත්වය ස්වේච්ඡාවෙන් ලබා දෙමින් කටයුතු කරයි.
- ගෘහස්ත හිංසනය (domestic violence) හා බලපෑම්වලට ලක්වන කාන්තාවන්ට උපදේශන සහාය, නීතිමය දැනුම්වත් කිරීම් (Gender rights, Women's rights)
- කාන්තා නායකත්ව පුහුණු
  අප ආයතනයේ උපදේශන නිලධාරීන් විසින් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් සේවය කරනු ලබන පොලිස් නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන් ආදී ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ කරගනිමින් මෙම වැඩසටහන් සිදු කරනු ලබයි.

**16. තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන**

කාන්තාවන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් තහවුරු කිරීම යන අරමුණ පෙරදැරි කර ගනිමින් දිවයිනේ තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 10ක් පවත්වාගෙන යනු ලැබේ.

- ගම්පහ - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
- රත්නපුර - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
- මොණරාගල - කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය
- කොළඹ - කාන්තා පිහිට ආයතනය
- මඩකළපුව - කාන්තා පිහිට ආයතනය
- අනුරාධපුර - කාන්තා පිහිට ආයතනය
- මාතර - කාන්තා පිහිට ආයතනය
- යාපනය - Jaffna Social Action Center
- මුලතිව් - Jaffna Social Action Center

**17. අනුරාධපුර (තඹුත්තේගම) - ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය**

මෙම රැකවරණ මධ්‍යස්ථාන වෙත ගෘහස්ථ හිංසනයන්ට ලක් වූ හා ලිංගික අතවරයන්ට ගොදුරු වූ කාන්තාවන් අධිකරණ නියෝග මත, පොලීසිය, රෝහල් විසින් යොමු කරනු ලැබේ. වින්දිත කාන්තාවන් නැවත සමාජගත වූ පසු ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා නේවාසික රැකවරණය ලබන කාලසීමාව තුළදී ස්වයං රැකියා පුහුණුව ලබා දෙනු ලැබේ. ඔවුන් සමාජගතවීමෙන් පසු ද පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබේ. කාන්තාවන් 981 දෙනෙකු සඳහා සේවාවන් සපයා ඇති අතර, දරන ලද වියදම රු. මිලියන 12.630කි.

**18. උපදේශන මධ්‍යස්ථාන**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය යටතේ දිවයින පුරා උපදේශන මධ්‍යස්ථාන 12ක් ක්‍රියාත්මක වේ. එම උපදේශන මධ්‍යස්ථාන හරහා උපදේශන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරීන් මඟින් කාන්තා, පිරිමි හා ළමා යන සියලු පාර්ශ්වයන්ට උපදේශන සේවාව ලබා දීම හා උපදේශනය ලබා ගත් සේවාදායකයන්ගේ පසුවිපරම් කටයුතු සිදු කරයි. මේ වන විට සේවාදායකයින් ගණන 2161කි. දරා ඇති වියදම රු. මිලියන 0.931කි.




මූලාශ්‍රය - ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

**19. උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ සේවාලාභීන් 1279ක් සඳහා වැඩසටහන් 2 සිදු කර ඇති අතර එහි වියදම රු. මිලියන 0.300කි.

**20. දින සැමරුම්**

**ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම**

ජාතික සැමරුම් උත්සවය 'ඇයට ශක්තිය දැයට ප්‍රගතිය' තේමාව යටතේ 2024 මාර්තු මස 08 වන දින කාන්තාවන් 400කගේ සහභාගිත්වයෙන් බත්තරමුල්ල වෝටර්ස් එජ් හිදී එවක ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථානයන්ට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහය ඉදිරිපත් කිරීම, කාන්තා කාර්ය සංවිධාන හා බලමණ්ඩල විධිමත් හා ජාලගත කිරීමේ ක්‍රමවේදය එළි දැක්වීම, තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 06ක් සඳහා ත්‍රීරෝද රථ 05ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 05ක් හා ප්‍රින්ටර් 05ක් ලබා දීම, වයස අවු.18ට වැඩි ගැහැනු ළමුන් සඳහා පවත්වන ලද හෙද සත්කාර පුහුණු පාඨමාලාවෙහි සහතික පත්‍ර ලබා දීම, කාන්තා සවිය සඟරාවෙහි ඉ- පිටපත එළිදැක්වීම සිදු කරන ලදි.

ජාතික දින සැමරුමට සමගාමීව අම්පාර දිස්ත්‍රික්කය හා නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ කාන්තා දින වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදි.







**21. මානසික සෞඛ්‍ය දිනය**

ඔක්තෝබර් 10 දිනට යෙදී තිබෙන මානසික සෞඛ්‍ය දිනය වෙනුවෙන් මෙම සැමරුම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව පුරා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විසිර සිටින උපදේශන සේවා සපයන උපදේශන නිලධාරීන් හා උපදේශන සහකාරවරුන්ගේ දැනුම, ආකල්ප ප්‍රවර්ධනය කිරීම සහ සාමූහිකව කටයුතු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මෙහිදී සිදු කෙරුණි. එමෙන්ම උපදේශන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කිරීම, උපදේශන ගැටලු හඳුනා ගෙන දීපව්‍යාප්තව උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු පදනම් කරගෙන දේශන පැවැත්වීම මේ යටතේ සිදුවුණි.

**22. කාන්තාවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය සවිබලකරණය උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්**

- ගර්භණී කාන්තාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු
- ළමා සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ වැඩමුළු
- පවුල් සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

මෙහිදී ද ක්ෂේත්‍රයට අදාළ වෙනත් රාජ්‍ය නිලධාරීන් (පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි, ප්‍රජා සෞඛ්‍ය නිලධාරි) සම්බන්ධ කරගනිමින් අදාළ වැඩසටහන් සංවිධානය කිරීම වනිතා සංවර්ධන නිලධාරීන් විසින් ස්වේච්ඡාවෙන් කටයුතු කරනු ලබයි.

**23. අධීක්ෂණය හා පසුවිපරම**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලු වැඩසටහන් මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණය මත දිස්ත්‍රික් මට්ටමින් පසුවිපරම් හා ප්‍රගති සමාලෝචනය සිදු කරයි. ප්‍රාදේශීය මට්ටමින් සිදු කරන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම මෙහිදී සිදු කෙරේ. මේ වන විට අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් 10ක් සිදු කිරීම සඳහා රු. මිලියන 0.498ක් වැය කර ඇත.

**24. කාන්තා සංවිධාන ජාලය ගොඩනැඟීම**

- කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරීම. ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන් ද සමාජීය වශයෙන් ද බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
- කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජාමූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරීම.
- සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මග හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් උදෙසා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ග්‍රාම සේවා වසම් මට්ටමින් වයස අවුරුදු 18 වැඩි සියලුම කාන්තාවන් ඒකරාශී කර ගනිමින් කාන්තා කාර්ය සංවිධාන පිහිටුවා ගන්නා අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එම කාන්තා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල පිහිටුවා ඇත. කාන්තාවන් දිස්ත්‍රික් මට්ටමින් ඒකරාශී කිරීම සඳහා දිස්ත්‍රික් 25ටම සම්බන්ධ කාන්තා නිලධාරීන් මගින් දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල පිහිටුවයි. මෙම ජාලය මගින් සමස්ත

කාන්තා ප්‍රජාවම රටේ සංවර්ධනයට දායක කර ගැනීමත්, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් සිදු කරන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලබයි.

- කාන්තා කාර්යය සංවිධාන (වසම් මට්ටමින් ) - 12,994
- ප්‍රාදේශීය කාන්තා බලමණ්ඩල (ප්‍රාදේශීය මට්ටමින්) - 317
- දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල (දිස්ත්‍රික් මට්ටමින්) - 25 ද සක්‍රියව පවතී

## විදේශීය අරමුදල් භාවිතයෙන් සිදුකළ ව්‍යාපෘති

1. ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා JICA (ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය) මගින් කාන්තා කාර්ය සංවිධාන ප්‍රතිසංවිධානය හා කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමේ ව්‍යාපෘති අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරනු ලබයි. JICA ආයතනය ව්‍යාපෘතිය සඳහා සෘජුව වියදම් දරයි. ව්‍යාපෘති කාල සීමාව 2023 - 2027 වර්ෂය දක්වා වේ. මෙහිදී කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම අංගය යටතේ එක් දිස්ත්‍රික්කයකින් කාන්තා ව්‍යවසායිකාවන් 09ක් බැගින් 18 දෙනෙකු තෝරා ගන්නා ලද අතර ඔවුන් සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දීමේ ක්‍රියාවලියෙහි ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එමෙන්ම මෙම ව්‍යාපෘතියෙහි කාන්තා කාර්ය සංවිධාන සක්‍රිය කිරීමේ අංගය යටතේ කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් සාමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 56ක් මේ වන විට පවත්වා ඇත. තව ද මෙහි ක්‍රියාකාරකමක් වන කාන්තා කාර්ය සංවිධාන ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ කටයුතු සහ ජාතික බල මණ්ඩලය පිහිටුවීම සඳහා කැබිනට් පත්‍රිකාව සකස් කිරීමේ කටයුතු ද මේ වනවිට අවසන් අදියරෙහි පවතී.

2. නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිරසර ප්‍රජාමූලික පවුල් සවිබලගැන්වීම - Saemaul (සෙමාවුල් ගෝලීය පදනම) මඟින් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම, 2023 අගෝස්තු 25 සමාරම්භක උළෙල පැවැත්වූ අතර, ශාන්තිපුර පාසලේ පිළිසකර කිරීම් සිදු කර ඇත. බිඳුණුවැව කෘෂිකර්ම මධ්‍යස්ථානයේ දී ගොවීන් 60ක් සඳහා කෘෂිකාර්මික පුහුණුව ලබා දීමට සැලසුම් කිරීම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ බඹරකැලේ සෙමාවුල් එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022 - 2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ. ප්‍රදායක ආයතනය සෘජුව වියදම් දරයි.

3. ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිපාදන හදිසි ආධාර ව්‍යාපෘතිය - වෘත්තීය හා ධාරිතා පුහුණු ලබා දීම හා අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදුවේ. මේ සඳහා ADB (ආසියානු සංවර්ධන බැංකුව) විසින් රු. මිලියන 10.766ක මුදලක් වැය කර ඇති අතර, මෙය 2022 - 2026 වර්ෂ සඳහා ක්‍රියාත්මක වේ.

4. එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women) හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් - 2024 - 2025

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම යටතේ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women), ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා ඒකාබද්ධව 2024 මාර්තු මස සිට 2025 මාර්තු දක්වා ව්‍යාපෘති හතරක් (4) ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12හි ව්‍යවසායක කාන්තාවන් 500 දෙනෙකු බලගැන්වීම සිදු කෙරේ.

5. මෙම ව්‍යාපෘතියට ආකාර ද්විත්වයක් යටතේ ප්‍රතිපාදන ලැබෙන අතර ජපන් රජයේ ආධාර මත ක්‍රියාත්මක වන අංගයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස කාන්තාවන් මගින් මෙහෙයවනු ලබන/ හිමිකාරීත්වය දරන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක කාන්තාවන් 500 දෙනෙකු ශක්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා සැපයීම (උපකරණ, ද්‍රව්‍ය, සැපයුම් ආදිය) මගින් සහාය වීම සහ උසස් ධාරිතා වර්ධනය හා භෞතික හා ඉ- වාණිජ බාධක ඇතුළුව වෙළඳ පොළ වෙත ප්‍රවේශය සමගින් ප්‍රාදේශීය මට්ටමින් රැකියා සැපයීම අඛණ්ඩව සිදු කිරීම, සාමකාමී හා ප්‍රචණ්ඩ නොවන ක්‍රම මඟින් ගෘහස්ථ හා ප්‍රජා මට්ටමේ ගැටලු ආමන්ත්‍රණය කිරීමට හා විසඳීමට පිරිමි හා කාන්තා ගෘහ සාමාජිකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සමාජ සම්මතයන් හා හැසිරීම් වෙනස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සාමය ඇති කිරීම, සාමූහික නායකත්වය, ප්‍රජාව තුළ කාන්තා සහභාගීත්වය කෙරෙහි අවධානය යොමු කිරීමටත් කොට්ඨාස මට්ටමින් අන්තර් ප්‍රජා සංවාද පැවැත්වීම, ආරවුල් විසඳීම, ගැටුම් වැළැක්වීම, සමථකරණය පිළිබඳ තම කුසලතා හැකියාවන් වර්ධනය කිරීම සඳහා ප්‍රජා මට්ටමින් සාමය ඇතිකරගන්නන් (කාන්තා) 500 දෙනෙකු සඳහා ධාරිතා වර්ධනය හා ජාලකරණ සැසි පැවැත්වීම, ප්‍රජාවන් අතර සමාජ සහජීවනය හා ගැටුම් වැළැක්වීම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සාමූහිකව සංවර්ධනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට පුහුණුව ලත් කාන්තාවන්ට හා අනෙකුත් ප්‍රජා පාර්ශ්වයන්ට සහාය වීම යන ක්‍රියාකාරකම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ක ක්‍රියාත්මක විය.

මෙම ව්‍යාපෘතියෙහි කොරියානු ආධාර යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල/ හාලිඇල/ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සමාජ ආර්ථික අර්බුදයෙන් වැඩිම පීඩාවට පත් වූ කාන්තාවන් ආමන්ත්‍රණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/කාර්ය | මූල්‍ය ඉලක්කය (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් කාන්තාවන් සවිබලගැන්වීම - වැයශීර්ෂය - 171-02-06-007-2509 | | | | | | | |
| 1 | අඩු ආදායම්ලාභී නාගරික කාන්තාවන් සවිබලගැන්වීමේ වැඩසටහන | 1.000 | 1.000 | ව්‍යාපෘති 10. ප්‍රතිලාභීන් 10. | ව්‍යාපෘති 10 | 10 | |
| 2 | වැන්දඹු කාන්තාවන් ගෘහ ව්‍යවසායකයන් බවට පත් කිරීම | 2.500 | 2.499 | ව්‍යාපෘති 24. ප්‍රතිලාභීන් 24. | ව්‍යාපෘති 24 | 24 | |
| 3 | කිලිනොච්චිය ගෘහමූලික කාන්තා පවුල් සවිබලගැන්වීමේ ජාතික මධ්‍යස්ථානය ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1.000 | 1.000 | ව්‍යාපෘති 10. ප්‍රතිලාභීන් 10 | ව්‍යාපෘති 12 | 12 | |
| 4 | දිරියමංපෙත වැඩසටහන | 8.000 | 7.990 | ව්‍යාපෘති 27. ප්‍රතිලාභීන් 185 | ව්‍යාපෘති 32 | 181 | |
| 5 | ධීවර ආශ්‍රිත ගෘහ කර්මාන්ත සඳහා යොමු වන කාන්තාවන් සවිබලගැන්වීම | 1.500 | 1.497 | ව්‍යාපෘති 30. ප්‍රතිලාභීන් 30 | ව්‍යාපෘති 30 | 30 | |
| 6 | වතු අංශයේ කාන්තාවන් සවිබලගැන්වීම | 1.500 | 1.498 | ව්‍යාපෘති 30. ප්‍රතිලාභීන් 30 | ව්‍යාපෘති 15 | 15 | |
| 7 | විදේශගතවන කාන්තාවන්ගේ ආර්ථිකය, පවුල් සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 1.000 | 0.989 | ව්‍යාපෘති 20. ප්‍රතිලාභීන් 20 | ව්‍යාපෘති 21 | 21 | |
| 8 | විශේෂිත හේතූන් මත සමාජ සංවේදීතාව අහිමි වූ කාන්තාවන්ගේ ආර්ථික හා සමාජ සවිබලගැන්වීම (ජීවිතයට අරුතක්) | 3.500 | 3.845 | ව්‍යාපෘති 60. ප්‍රතිලාභීන් 60 | ව්‍යාපෘති 64 | 64 | |
| 9 | බන්ධනාගාර ගතවූවන්ගේ පවුල් සඳහා සහන සැලසීමට එම පවුල් දැනුවත් කිරීම | 1.000 | 0.599 | ව්‍යාපෘති 15. ප්‍රතිලාභීන් 15 | ව්‍යාපෘති 8 | 8 | |
| 10 | නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන සැලසීම | 3.500 | 3.490 | ප්‍රා.ලේ. කොට්ඨාස 18. ප්‍රතිලාභීන් 70 | ව්‍යාපෘති 31 | 71 | |
| 11 | කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ | 0.825 | 0.878 | අලෙවි පොළවල් 10, ප්‍රතිලාභීන් 300, තෝරාගත් ව්‍යවසායිකාවන් 25 | අලෙවිපොළ 12ක් | 563 | |
| 12 | ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන | 0.675 | 0.677 | පුහුණු වැඩසටහන් 30, ප්‍රතිලාභීන් 750 | පුහුණු වැඩසටහන් 41 | 1131 | |

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතිය/කාර්ය | මූල්‍ය ඉලක්කය (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ත්‍රී | පුරුෂ |
| **13** | ළමා නිවාසවල සිටින වයස අවු.18 ඉක්ම වූ ගැහැනු ළමුන් සමාජගත කිරීම සඳහා NVQ මට්ටමේ හෙද පුහුණුව ලබා දීම හා අවශ්‍ය මූලික පුහුණුව ලබා දීම. | 1.000 | 1.000 | ව්‍යාපෘති 02. ප්‍රතිලාභීන් 40 | හෙද සත්කාර පුහුණු පාඨමාලා 01 | 8 | |
| **14** | මාධ්‍ය හා පුස්තකාල නඩත්තුව | 2.030 | 1.653 | පුස්තකාල නඩත්තු සහ මුද්‍රණ පිරිවැය "කාන්තා සවිය" සහ "අරුණෝදය" 400. වෙබ් සත්කාරක සේවාව සඳහා දුරකථන බිල්පත්. රාජකාරි වාර්තා පොත්වල මුද්‍රණ පිරිවැය. | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ පුස්තකාලයට ප්‍රවෘත්ති පත්‍ර මිලදී ගැනීම, බිල්පත් ගෙවීම් සත්කාරක උපදේශන වෙබ් අඩවිය, වනිතා සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි වාර්තා 815ක් මුද්‍රණය කිරීම. | | |
| **15** | ප්‍රගතිය හා පසුවිපරම් | 0.500 | 0.498 | ප්‍රගති සමාලෝචන රැස්වීම් 20 | රැස්වීම් 10ක් | 979 | |
| එකතුව | | **29.530** | **29.113** | | | **3117** | **0** |
| ළමා අපයෝජනය හා කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම වැඩසටහන වැය ශීර්ෂය 171-02-06-004-2509 | | | | | | | |
| **1** | කාන්තා රැකවරණ මධ්‍යස්ථාන නඩත්තු කිරීම | 12.670 | 12.630 | නඩත්තු | රැකවරණ මධ්‍යස්ථාන 10ක් නඩත්තු කිරීම | 981 | |
| **2** | උපදේශන මධ්‍යස්ථාන නඩත්තු කිරීම | 1.030 | 0.931 | නඩත්තු | උපදේශන මධ්‍යස්ථාන 12ක් නඩත්තු කිරීම | 2165 | |
| **3** | උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් | 0.300 | 0.300 | ව්‍යාපෘති 10. ප්‍රතිලාභීන් 1000 | ව්‍යාපෘති 10 | 1279 | |
| එකතුව | | **14.000** | **13.861** | | | **4425** | **0** |

**වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සිදු කිරීම.**
(වරිපනම්, විදුලි බිල්, දුරකථන බිල්, තැපැල් ගාස්තු, කාර්යාල නඩත්තු) (171 - 02-06 – 1409) වැය ශීර්ෂය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මිලි) | | සත්‍ය වියදම (රු.මිලි) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන , අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන රු. මිලියන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 300.00 | 228.000 | 228.000 | 100% |

**විදේශ ආධාර යටතේ ප්‍රදායක ආයතන සෘජුව වියදම් දරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

| | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | ව්‍යාපෘති කාලසීමාව | සටහන |
|---|---|---|---|---|---|
| 1 | තිරසර ප්‍රජා පදනම් වූ පවුල් සවිබල ගැන්වීමේ වැඩසටහන | සෙමාවුල් ගෝලීය පදනම | රු.මිලි.28.64 | 2023-2027 | |
| 2 | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් වනිතා සංවර්ධන නිලධාරීන් වෙත පැවැත්වීම.(ද්විඩ මාධ්‍ය) | UNFPA | රු.මිලි.1.522 | 2024 | |
| 3 | තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ හා උපකරණ ලබා දීම, සමාජ හා ආර්ථික අර්බුදයෙන් වැඩිම පීඩාවට පත් වූ කාන්තාවන් සඳහා හදිසි සහන සැලසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ඩිජිටල් අලෙවිකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN WOMEN) | ඇ.ඩො. 1,642,203 | 2023 - 2024 | |
| 4 | ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය -අවදානම් සහගත කාන්තාවන්,නව යොවුන් වියේ දරුවන්, ළමුන් සහ කාන්තා රැකවරණ මධ්‍යස්ථානවල රැකවරණය ලබන වින්දිත කාන්තාවන් වෙනුවෙන් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | රු.මිලි.125.5 | 2022-2026 | |
| 5 | කාන්තාවන් ව්‍යවසායකත්වය, නායකත්වය හා ඵලකරණය හරහා ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය | JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය) | රු.මිලි.194.97 | 2023-2027 | |

## 2.2.6. ජාතික කාන්තා කමිටුව

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. සයිබර් ප්‍රචණ්ඩත්වය, ප්‍රවාහනයේදී සිදුවන හිරිහැර සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

පොදු ප්‍රවාහනයේදී හා අන්තර්ජාලය තුළ නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා නව යොවුන්විය තුළ ඔවුන් මුහුණදෙන අභියෝග ජය ගැනීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම අරමුණ වේ.

2024 වර්ෂයේදි බදුල්ල, කොළඹ, කළුතර, යාපනය සහ කෑගල්ල යන දිස්ත්‍රික්කයන් හිදී වැඩසටහන් 11 ක් පැවැත්වූ අතර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 0.499 වැය වී ඇත.

**2. විවාහ අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා පූර්ව විවාහ පිළිබඳ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සඳහා)**

විවාහයෙන් පසු පවුල් ජීවිතය තුළ ඇති වන ගැටුම් අවම කර ගනිමින් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදේශනය ලබා දීම අරමුණයි.

2024 වර්ෂයේදී මාතලේ, ත්‍රිකුණාමලය, පොලොන්නරුව සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන්හිදි වැඩසටහන් 11ක් පවත්වා ඇති අතර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 0.499 වැය වී ඇත.

**3. විවාහයට පෙර විවාහ අපේක්ෂිතයින් සඳහා පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හා උපදේශන නිලධාරීන්/ උපදේශන සහකාරවරුන් බලගැන්වීම වැඩසටහන**

විවාහයෙන් පසුව ඇතිවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහාත් විවාහය තුළදී මතුවන ගැටළුකාරි තත්වයන්ට මුහුණ දෙමින් සාර්ථක විවාහ ජීවිතයක් පවත්වා ගෙන යාම සඳහා විවාහ අපේක්ෂිත යුවලක් විවාහ වීමට ප්‍රථම අවබෝධයකින් යුතුව විවාහ ජීවිතයට පිවිසීම ඉතා සුදුසු වන අතර පූර්ව විවාහ උපදේශනය ඒ සඳහා සාධනීය විසඳුමක් ලෙස පෙන්වා දිය හැකිය.

ඒ අනුව විවාහය ලියාපදිංචිය කිරීමට පෙර විවාහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත විවාහ වීමට නම් ලබා දීමට පැමිණෙන විවාහ අපේක්ෂිත යුවල් වෙත පූර්ව විවාහ උපදේශනය ලබා දීම සඳහා උපදේශන නිලධාරින්/උපදේශන සහකාරවරුන් හා විවාහ රෙජිස්ට්‍රාර්වරුන් බලගැන්වීම සහ ඔවුන් අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම මෙහි අරමුණයි.

කෑගල්ල, මාතර, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුරය, හම්බන්තොට, මොණරාගල, මහනුවර, රත්නපුර, කළුතර, යාපනය, අම්පාර, කොළඹ, යන දිස්ත්‍රික්ක 13හි ක්‍රියාත්මක කර අවසන් කර ඇත. මේ සඳහා රු.මිලියන 1.498 වියදම් වී ඇත.

**4. රැකියා ස්ථානයේ ලිංගික හිංසනය අවම කිරීම සඳහා කාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවක සේවිකාවන් දැනුවත් කිරීම**

රැකියා ස්ථානයන්හි කාන්තා හිංසනයන අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහනින් අරමුණු කෙරේ.

ගම්පහ, මහනුවර, ගාල්ල, කළුතර, කොළඹ යන දිස්ත්‍රික්කයන් හිදී වැඩසටහන් 08ක් පවත්වා ඇත. මේ සඳහා රු.මිලියන 0.472 ක් වැය වී ඇත.

**5. ජාත්‍යන්තර කාන්තා දින සමගාමී වැඩසටහන් (ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් සයිබර් ප්‍රචණ්ඩත්වය සහ මිනිස් ජාවාරම වැළැක්වීම)**

දිනෙන් දින වැඩිවන සයිබර් අපරාධවලින් කාන්තාවන් සහ දරුවන් මුදවා ගැනීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම අරමුණු කෙරේ.

මහනුවර, අම්පාර, ගාල්ල, පොලොන්නරුව, මොණරාගල, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් සයිබර් ප්‍රචණ්ඩත්වය සහ මිනිස් ජාවාරම වැළැක්වීම පිළිබඳව අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කළ අතර මේ සඳහා රු.මිලියන 0.438 වැය වී ඇත.

**6. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ සයිබර් අපරාධ අවම කිරීම සඳහා යොවුන් පාර්ලිමේන්තු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන**

අන්තර්ජාලය භාවිතයේ දී නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා එවැනි ගැටලුවලට සාර්ථකව මුහුණ දිය යුතු ආකාරය පිළිබඳව අවශ්‍ය දැනුම ලබා දීම සහ එම දැනුම ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියින් අතරට ගෙන යෑම මෙහි අරමුණ වේ.

පාර්ලිමේන්තු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් බදුල්ල සහ මහනුවර යන දිස්ත්‍රික්ක 02හි පවත්වා අවසන් කර ඇත. මේ සඳහා රු.මිලියන 0.266 මුදලක් වැය වී ඇත.

**7. දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් බලගැන්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ කාන්තා බල මණ්ඩලවල නියෝජිතයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන**

දේශපාලනයට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්පවලින් හෙබි කාන්තා නායිකාවන් බිහිකිරීම හා දේශපාලනයට අවතීර්ණ වීම සඳහා කාන්තාවන් දිරිමත් කිරීම අරමුණු කරයි.

ගාල්ල, ත්‍රිකුණාමලය, බදුල්ල, අනුරාධපුරය, යාපනය, මහනුවර, රත්නපුර, වවුනියාව, කුරුණෑගල, මාතලේ, කොළඹ, යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 11 පවත්වා ඇත. මැතිවරණය සඳහා ඉදිරිපත් වූ කාන්තා අපේක්ෂකයින් සහ තේරීපත් වූ කාන්තා නියෝජිතයින් මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ අතර, මෙම වැඩසටහනේ සම්පත්දායකයින් ලෙස සහකාර මැතිවරණ කොමසාරිස්වරු විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, වෘත්තීය මාර්ග උපදේශක නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා මානව සම්පත් කළමනාකරණ නිලධාරීන් කටයුතු කරන ලදි. මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මිලියන 1.070 වැය වී ඇත.

**8. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ළමා ආරක්ෂාව පිළිබඳව වතු සුභසාධන නිලධාරීන් දැනුවත් කිරීම සහ උපදේශන වැඩසටහන්**

වතු ප්‍රජාව වෙත වඩාත් යහපත් ජීවන මට්ටමක් හා තෘප්තිමත් රැකියා පරිසරයක් ගොඩනැගීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා ළමා අයිතිවාසිකම් හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ වතු අධිකාරී ඇතුළු වතු කළමනාකරණ මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීම මින් අරමුණු කර ඇත.

ඒ අනුව, මෙම වැඩසටහන බදුල්ල දිස්ත්‍රික්කයේ දී පැවැත්වූ අතර ඒ සඳහා රු.මිලියන. 0.099 මුදලක් වැය වී ඇත.

**9. ඵලදායි දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහ හිටපු සටන්කාමී කාන්තාවන් සඳහා මනෝ සමාජීය උපදේශනය හඳුන්වා දීම, ඔවුන් වඩාත් ඵලදායිව සහ විශ්වාසයෙන් යුතුව සමාජයට නැවත එක්වීමට උපකාර කිරීම.**

හිටපු සටන්කාමී කාන්තාවන් සඳහා මනෝ සමාජීය උපදේශනය හඳුන්වා දීම තුළින් ඔවුන් වඩාත් ඵලදායී ලෙස සහ විශ්වාසයෙන් යුතුව සමාජයට නැවත එකතු වීමට උපකාර කිරීම, ඵලදායී දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මෙහි අරමුණයි.

ඵලදායී දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට යාපනයේ දිස්ත්‍රික් ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති අතර, හිටපු සටන්කාමී කාන්තාවන්ට ඵලදායී ලෙස සහ විශ්වාසයෙන් යුතුව සමාජයට නැවත එකතු වීමට උපකාර කිරීම සඳහා අදාළ මනෝ සමාජීය වැඩසටහන පවත්වා අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා රු.මිලියන 0.140 ක මුදලක් වැය වී ඇත.

**10. සේවා ස්ථානවල සේවය කරන නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත පිළිබඳව දැනුවත් කිරීම.**

ගෘහස්ථ හිංසන පනත පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම, කාන්තාවන්ට රැකියා ස්ථානයේ සිදුවන හිංසනයන් අවම කිරීම, ගෘහස්ථ හිංසනය අවමවීම මගින් පවුල තුළ සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම, නිලධාරීන්ගේ රැකියා ඵලදායීතාව ඉහළ නැංවීම අපේක්ෂිත අරමුණු වේ.

කොළඹ දිස්ත්‍රික්කයේ වැඩසටහන් 2ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු.මිලියන 0.161 ක් වැය කර ඇත.

**දේශීය හා විදේශීය ප්‍රතිපාදන (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල ) භාවිතා කරමින් සිදු කරන ලද වැඩසටහන්**

**11. කාන්තා හිංසනය වැළැක්වීම සඳහා වන අන්තර් ජාතික දින 16 වැඩසටහන**

කාන්තාවන්ට එරෙහි සියලු හිංසන පිටු දැකීම උදෙසා සෑම වර්ෂයකම නොවැම්බර් මස 25 සිට දෙසැම්බර් මස 10 වන දින දක්වා දින 16 කාල පරාසයක් අන්තර් ජාතික දින 16 නමින් වැඩසටහන් සංවිධානය කරනු ලබයි. 2024 වර්ෂයේදී ද ජාතික කාන්තා කමිටුව මගින් වැඩසටහන් රාශියක් පවත්වා ඇත.

කාන්තා හිංසනය වැළැක්වීමේ අන්තර්ජාතික දින 16ට සමගාමීව 2024 වර්ෂයේ දී ජාතික කාන්තා කමිටුව මගින් දේශීය හා විදේශීය අරමුදල් (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල) භාවිතා කරමින් ජංගම සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු සිදු කරන ලදි. එහිදී දේශීය අරමුදල් භාවිතා කරමින් මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජංගම සේවාවක් පැවැත්වූ අතර ඒ සඳහා රු.මිලියන 0.260 ක මුදලක් වැය වී ඇත. මේ සඳහා ප්‍රතිලාභීන් 850ක් පමණ සහභාගී වී ඇති අතර එහිදී, උපදේශන සේවා, නීති සේවා, සෞඛ්‍ය සායන, ඇස්කණ්නාඩි ලබා දීම සහ ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ආදිය වැඩසටහන් ප්‍රතිලාභීන් සඳහා ලබා දෙන ලදි. විදේශීය අරමුදල්

භාවිතා කරමින් අන්තර් ජාතික දින 16 ආරම්භක උත්සවය කොළඹ දී පැවැත්වූ අතර ඒ සඳහා රු.මිලියන 0.237 මුදලක් වැය විය. එමෙන්ම අන්තර්ජාතික දින 16 වැඩසටහනට සමගාමීව පූර්ව විවාහ උපදේශන පිළිබඳ දැනුවත් කිරීම, උසස් අධ්‍යාපනය ලබන සිසුන් සඳහා සයිබර් අපරාධ වැළැක්වීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ රැකියා ස්ථානයේ සිදුවන සිංසනයන් අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වන ලදි. ඒ සඳහා රු.මි. 0.250 ක් වැය විය.

## 12. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම

ජාතික කාන්තා කමිටුවේ කාර්යභාරය තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගාස්තු රහිත 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි. 2024 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව සඳහා පැමිණිලි 2245 ක් ලැබී ඇති අතර පැමිණිලි මධ්‍යස්ථානය සඳහා ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 360 කි.




*මූලාශ්‍රය : දිස්ත්‍රික් වශයෙන් පැමිණිලි ලැබීම් වාර්තාව 2024 - ජාතික කාන්තා කමිටුව*

## 13. විදේශීය ප්‍රතිපාදන - (සාක් සංවර්ධන අරමුදල ) සාර්ක් සාමාජික රටවල කාන්තාවන් සහ ළමුන් සඳහා ගාස්තු රහිත උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය - 4 වන දිගුව

මෙම ව්‍යාපෘතිය සඳහා සාක් සංවර්ධන අරමුදල මගින් ප්‍රතිපාදන සපයයි. ව්‍යාපෘති කාල සීමාව 02/08/2024 සිට 01/08/2025 වේ. 2024 මෙහි පළමු කාර්තුව සඳහා මිලියන 14.400 ක් (ඇමරිකානු ඩොලර් 45712 ) ලබා දී ඇති අතර, ඊට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානය සහ මැදිහත්වීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ආයතන ධාරිතාව ගොඩනැගීම.
- උපදේශනය හා මහජනතාව දැනුවත් කිරීම වශයෙනි. 2024.12.31 වන විට මූල්‍ය ප්‍රගතිය
- රු.මිලියන 10.310 කි. ඉතිරි රු. මිලියන 4.100කි.

උක්ත ක්‍රියාකාරී සැලසුමෙහි පහත උප ක්‍රියාකාරකම් යටතේ දිවයිනම ආවරණය වන ආකාරයට ක්‍රියාකාරකම් සිදු කෙරේ.

- 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී කරුණු පිළිබඳ අමාත්‍යාංශ සහ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රධාන නිලධාරීන් දැනුවත් කිරීම. මේ වන විට දැනුවත් කළ නිලධාරීන් සංඛ්‍යාව 130 කි. මහනුවර දිස්ත්‍රික්කය
- ජංගම සේවා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම මේ වන විට සැලසුම් කර ඇත.
- 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ දිස්ත්‍රික්ක/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ උපදේශන නිලධාරින් සහ පාර්ශ්වකරුවන් හා වෙනත් නිලධාරීන් දැනුවත් කිරීම යටතේ මේ වන විට දැනුවත් කළ සංඛ්‍යාව 140 කි. අනුරාධපුර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක
- 1938 උපකාරක දුරකථන සේවාව සහ පැමිණිලි මධ්‍යස්ථානයට ලැබෙන පැමිණිලි පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම, අමාත්‍යාංශ නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් අතර සහයෝගීතාවය ගොඩ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම යටතේ මේ වන විට දැනුවත් කළ සංඛ්‍යාව 180කි. ගාල්ල හා කෑගල්ල දිස්ත්‍රික්ක
- තෝරාගත් බිහිරි , ගොළු මධ්‍යස්ථානවල අය සඳහා සයිබර් අපරාධ පිළිබඳව සංඥා භාෂාවෙන් දැනුවත් කිරීම ද මේ වන විට සැලසුම් කර ඇත.
- පෞද්ගලික අංශයේ ආයෝජන කලාප සහ වෙනත් පෞද්ගලික සමාගම්/ ඇඟලුම්, ආයතනවල 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ, ප්‍රජනක සෞඛ්‍ය, සේවා ස්ථානයේ ලිංගාශ්‍රිත රෝග/ එච්.අයි.වී වැළැක්වීම, සේවා ස්ථානයේ කාන්තා හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම මේ වන විට දැනුවත් කළ සංඛ්‍යාව 335 කි. කටුනායක හා ත්‍රිකුණාමලය
- සමාජ පර්යේෂණ , 1938 උපකාරක දුරකථන සේවාව පිළිබඳ බස් රථ නාම කරණය, ප්‍රචාරණ ද්‍රව්‍ය මුද්‍රණය, මේ වන විට සැලසුම් කර ඇත.
- පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානයේ දත්ත කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම මේ වන විට සැලසුම් කර ඇත.
- නිලධාරීන්ගේ/ ධාරිතාවය සංවර්ධනය යටතේ මේ වන විට නිලධාරීන් 30 ක් පුහුණු වීම් වැඩසටහන් 2 ක් සඳහා සහභාගී වී ඇත.
- වින්දිත කාන්තාවන්ට ආධාර කිරීම මන්නාරම දිස්ත්‍රික්කයේ කාන්තාවන් 600 ක් සඳහා ආධාර ලබා දී ඇත.

# සමාජ සවිබලගැන්වීම් අංශය

## සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

### අනුමත වාර්ෂික ප්‍රතිපාදන2024 සහ ප්‍රගතිය - 2024.12.31 දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **150.00** | **130.15** |

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | නව නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීම |
|---|---|
| **ව්‍යාපෘති සාරාංශය** | එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොළ හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින් , අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කිරීම. |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 115.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 103.85 |
| **භෞතික ප්‍රගතිය** | නව ගම්මාන 45 |
| | |
| ව්‍යාපෘති අංක 02 | **පවතින නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | දැනට පවත්නා නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීමට අදාළ පහසුකම් සැපයීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 24.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 17.64 |
| **භෞතික ප්‍රගතිය** | ගම්මාන 20 |
| | |
| ව්‍යාපෘති අංක 03 | **කුඩා වෙළඳ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | නිෂ්පාදන ගම්මානවල අලෙවි කටයුතුවලට සහායවීම සඳහා කුඩා පරිමාණයේ වෙළඳ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීමට අදාළ පහසුකම් සැලසීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 7.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 5.46 |
| **භෞතික ප්‍රගතිය** | කුඩා වෙළඳ මධ්‍යස්ථාන 5 |
| | |
| ව්‍යාපෘති අංක 04 | **අලෙවි ප්‍රදර්ශන පැවැත්වීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | නිෂ්පාදන ගම්මානවල නිෂ්පාදන අලෙවිකිරීම දිරිගැන්වීම සඳහා එම නිෂ්පාදන ඇතුළත් වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීමට අදාළ පහසුකම් සැපයීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.00 |

| | |
|---|---|
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.59 |
| භෞතික ප්‍රගතිය | අලෙවි ප්‍රදර්ශන17 |
| | |
| ව්‍යාපෘති අංක 05 | **පුහුණු හා තාක්ෂණික දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | නිෂ්පාදන ගම්මානවල නිෂ්පාදන කාර්යය සිදුකරන පුද්ගලයන් සඳහා අදාළ තාක්ෂණික දැනුවත්කිරීම් සහ අදාළ අනෙකුත් පුහුණු අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීම. |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.01 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 49 |

## ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

### අනුමත වාර්ෂික ප්‍රතිපාදන -2024 සහ ප්‍රගතිය- 2024.12.31 දින දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **50.00** | **50.00** |
| පුනරාවර්තන | **21.00** | **9.22** |
| එකතුව | **71.00** | **59.22** |

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

#### භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති අංක1 | ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබාදීම |
|---|---|
| **ව්‍යාපෘති සාරාංශය** | අඩු ආදායම් ලබන ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්,අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි ඇස් කණ්ණාඩි, රෝදපුටු, ශ්‍රවණ උපකරණ,ත්‍රෛසිකල්, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා වෛද්‍ය නිර්දේශ මත උපරිම රු. 20,000 දක්වා මුදල් ආධාර ලබා දේ. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 11.47 |
| **භෞතික ප්‍රගතිය** | ආබාධ සහිත පුද්ගලයන් 10,449 (ශ්‍රවණ උපකරණ 13, රෝද පුටු 98, කොමඩ් සහිත රෝද පුටු 38, වැලමිට අත්වාරු 100, කිහිළිකරු 42, ඇවිදීමේ රාමු 63, දුර සහ ළඟ පෙනෙන කණ්ණාඩි 83, කණ්ණාඩි 10,000, විශේෂ බඳපටි 2,විශේෂ පාවහන් 5, කෘත්‍රිම පාද 3) |
| | |

| | |
|---|---|
| ව්‍යාපෘති අංක 2 | **වෛද්‍යාධාර ලබාදීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් ආබාධ තත්ත්වයට පත්වීම වැළැක්වීම ද අරමුණු කර ගනිමින් මුළු දිවයිනම ආවරනය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. එහි දී රජයේ රෝහල් මගින් නොසපයන ඖෂධ ලබා ගැනීමට, සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක , ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම් ලබන පවුල් සඳහා උපරිමය රු.20,000ක් දක්වා මේ යටතේ ආධාර ලබා දේ. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 16.17 |
| **භෞතික ප්‍රගතිය** | පුද්ගලයන් 630 |
| | |
| ව්‍යාපෘති අංක 3 | **ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා ආබාධ සහිත තැනැත්තෙකුට හෝ පවුලකට උපරිමය රුපියල් 40,000 ක් දක්වා ලබා දීම සහ ස්වයං රැකියා නියාමනය වැඩිදියුණු කිරීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ මාර්ගෝපදේශනය සහ අලෙවිකරණ මැදිහත්වීම සිදු කරනු ලැබේ. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 6.84 |
| **භෞතික ප්‍රගතිය** | ආබාධ සහිත පුද්ගලයන් 175 |
| | |
| ව්‍යාපෘති අංක 4 | **ආබාධ සහිත තැනැත්තන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | ආබාධ සහිත දරුවන් සඳහා උපරිමය රු.20,000 ක් දක්වා ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මත ලබා දෙන අතර එය එකවර පමණක් ලබාදෙන දීමනාවක් ලෙස ලබා දේ. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 11.74 |
| **භෞතික ප්‍රගතිය** | ආබාධ සහිත ළමුන් 684 |
| ව්‍යාපෘති අංක 5 | **ආබාධ සහිත තැනැත්තන්ගේ කුසලතා සංවර්ධනය සඳහා ආධාර ලබාදීම** |
| **ව්‍යපෘති සාරාංශය** | ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000/- ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.39 |
| **භෞතික ප්‍රගතිය** | ආයතන 09 |
| ව්‍යාපෘති අංක 6 | **ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීම සඳහා ආධාර ලබාදීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.ලක්ෂ දෙකක් දක්වා මූල්‍යාධාර ලබාදීම. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.69 |
| **භෞතික ප්‍රගතිය** | ආයතන 04 |

| | |
|---|---|
| ව්‍යාපෘති අංක 7 | **ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා අවස්ථා ලබාදීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | ආබාධ සහිත පුද්ගලයින් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සහ ඔවුන්ගේ වැටුපෙන් 50% (උපරිම රු.15,000) ක් දක්වා රජය විසින් ගෙවීම සිදුකරයි. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.22 |
| **භෞතික ප්‍රගතිය** | ආබාධ සහිත පුද්ගලයන් 98 (2023 – 31/ 2024 - 67) |
| | |
| ව්‍යාපෘති අංක 8 | **වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | වික්ටෝරියා නිවාසයේ සේවකයින්ගේ වැටුප්, ජල හා විදුලි බිල්පත් ගෙවීම් සිදු කිරිම. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 9.00 |
| **භෞතික ප්‍රගතිය** | වික්ටෝරියා නිවාසයේ සේවකයින්ගේ වැටුප්, ජල හා විදුලි බිල්පත් ගෙවීම් සිදු කිරීම. |
| | |
| ව්‍යාපෘති අංක 9 | **ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දිනයට සමගාමීව පැවැත්වූ වැඩසටහන** |
| **ව්‍යාපෘති සාරාංශය** | ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව “ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම තුලින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම” පිළිබඳ තේමාව යටතේ සාකච්ඡාමය වැඩසටහනක් හා ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරනය වූ තිරසාර අනාගතයක් උදෙසා ඔවුන්ගේ නායකත්වය පුහුණු කිරීම යන තේමා ඔස්සේ වැඩසටහනක් පැවැත්වීම. |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.53 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 02 |

## වෙනත් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

“**සුපිරි වාසනා සම්පත**”**ලොතරැයි අරමුදල් ආදායමෙන්** 5% ක ප්‍රතිපාදන වලින් ගොඩනගා ඇති නිවාස අරමුදල මඟින් අඩු ආදායම් සහිත ආබාධ සහිත පුද්ගලයන් සඳහා පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

| ව්‍යාපෘති අංක1 | ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම |
|---|---|
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 27.46 |
| **භෞතික ප්‍රගතිය** | ආබාධ සහිත පුද්ගලයන් 204 |
| | |
| ව්‍යාපෘති අංක 2 | **ආබාධ සහිත තැනැත්තන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම** |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 6.59 |
| **භෞතික ප්‍රගතිය** | ආබාධ සහිත පුද්ගලයන් 66 |

## වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

### අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **5.00** | **5.00** |
| පුනරාවර්තන | **16.80** | **15.88** |
| එකතුව | **21.80** | **20.88** |

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### පුනරාවර්තන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

| ව්‍යාපෘති අංක 01 | ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි සංවිධාන දැනුවත් කිරීම |
|---|---|
| **ව්‍යාපෘති සාරාංශය** | පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති ග්‍රාමීය වැඩිහිටි කමිටු/ ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල/ දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල හා පළාත් වැඩිහිටි බලමණ්ඩල සඳහා මූල්‍යමය අනුග්‍රහය දක්වමින් ඔවුන්ව අධීක්ෂණය කිරීම හා දැනුවත් කිරීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.19 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.19 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 1 |
| | |
| ව්‍යාපෘති අංක 02 | **පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන** |
| **ව්‍යාපෘති සාරාංශය** | වැඩිහිටිභාවය සහ වැඩිහිටියන් රැකබලාගැනීම පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.53 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.53 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 15 |
| | |
| ව්‍යාපෘති අංක 03 | **වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා විශේෂිත වූ හැඳුනුම්පත් ලබාදීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.47 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.45 |
| **භෞතික ප්‍රගතිය** | හැඳුනුම්පත් 37,517 |
| | |
| ව්‍යාපෘති අංක 04 | **මාලිගාතැන්න වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු** |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 2.10 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 2.09 |
| **භෞතික ප්‍රගතිය** | පරිපාලන කටයුතු |
| | |
| ව්‍යාපෘති අංක 05 | **වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.36 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.36 |
| **භෞතික ප්‍රගතිය** | සභාවාර 10 |
| | |
| ව්‍යාපෘති අංක 06 | **වැඩිහිටි නඩත්තු මණ්ඩලය පවත්වාගෙන යාම** |
| **ව්‍යාපෘති සාරාංශය** | පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයට, අසරණ භාවයට පත් දෙමාපියන් යොමු කරමින් ඔවුන් හට නඩත්තු මුදල් ලබා දීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම. |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.63 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.55 |
| **භෞතික ප්‍රගතිය** | නඩු 103 |

වැඩිහිටි සුබසාධන ජාතික අරමුදල මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

| ව්‍යාපෘති අංක 01 | "ආරෝග්‍යා" වෛද්‍ය ආධාර වැඩසටහන |
|---|---|
| **ව්‍යාපෘති සාරාංශය** | කිසිදු දීමනාවකට හිමිකම් නොකියන, නිදන්ගත බෝ නොවන රෝග වලින් පෙළෙන වැඩිහිටියන් සඳහා රුපියල් 25,000 බැගින් ලබාදීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 50.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 50.00 |
| **භෞතික ප්‍රගතිය** | වැඩිහිටියන් 2000 |
| | |
| ව්‍යාපෘති අංක 02 | **ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආධාරක උපකරණ ලබාදීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ශ්‍රවණාධාර, අක්ෂිකාච හා ඇස්කණ්ණාඩි ලබාදීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 114.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 75.90 |
| **භෞතික ප්‍රගතිය** | ශ්‍රවණාධාර 2000, අක්ෂිකාච 761, ඇස්කණ්ණාඩි 3000 |
| | |
| ව්‍යාපෘති අංක 03 | **වැඩිහිටියන් රැකබලාගැනීමේ වැඩසටහන** |
| **ව්‍යාපෘති සාරාංශය** | වැඩිහිටි නිවාසවල පාලක/ පාලකවරියන් සඳහා වැඩිහිටියන් රැකබලාගැනීම පිළිබඳව වැඩසටහන් පැවැත්වීම |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 3.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.36 |
| **භෞතික ප්‍රගතිය** | වැඩිහිටි නිවාසවල පාලක/ පාලකවරියන් 246 |
| | |
| ව්‍යාපෘති අංක 04 | **වැඩිහිටි නිවාස නඩත්තුව සහ පරිපාලනය** |
| | පන්නල"Welcome"වැඩිහිටි නිවාසය", දෙහිඅත්තකණ්ඩිය"සරණ"වැඩිහිටි නිවාසය, කතරගම වැඩිහිටි නිවාසය |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 15.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 10.012 |
| **භෞතික ප්‍රගතිය** | වැඩිහිටි නිවාස වල පරිපාලන කටයුතු |
| | |
| ව්‍යාපෘති අංක 05 | **කතරගම වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් කටයුතු** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 150.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 114.959 |
| **භෞතික ප්‍රගතිය** | 35% (සමුච්ඡිත 86%) |
| | |
| ව්‍යාපෘති අංක 06 | **වැඩිහිටි නිවාස ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උපකරණ ආධාර ලබාදීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 40.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 30.88 |
| **භෞතික ප්‍රගතිය** | වැඩිහිටි නිවාස 15 ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම (2023 වර්ෂයේ ඉදි කළ වැඩිහිටි නිවාස 08 ක ගෙවීම් සිදු කර ඇත) |
| | |
| ව්‍යාපෘති අංක 07 | **වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ආධාර ලබාදීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 70.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 21.98 |
| **භෞතික ප්‍රගතිය** | වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 13 ක ඉදිකිරීම් කටයුතු |
| | |
| ව්‍යාපෘති අංක 08 | **අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයින් සඳහා නිවාස ඉදි කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාත්මක දිරිය පියස නිවාස වැඩසටහන** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 52.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 44.80 |
| **භෞතික ප්‍රගතිය** | නිවාස 64 |
| ව්‍යාපෘති අංක 09 | **වැඩිහිටියන්ට තමන්ගේම නිවෙස්වල ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක"සුවපහසු" මූලාධාර යෝජනා ක්‍රමය.** |

| | |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 150.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 150.00 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටියන් 2,819 |
| | |
| ව්‍යාපෘති අංක 10 | **වැඩිහිටි ආගමික චාරිකා සංවිධානය කිරීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 28.13 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 28.11 |
| භෞතික ප්‍රගතිය | චාරිකා 375 |
| | |
| ව්‍යාපෘති අංක 11 | **ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු බලගැන්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 60.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 57.51 |
| භෞතික ප්‍රගතිය | කමිටු 575 |
| | |
| ව්‍යාපෘති අංක 12 | **වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා උපකරණ මිලදී ගැනීමට මූල්‍යාධාර ලබාදීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 12.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 12.46 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 25 |
| | |
| ව්‍යාපෘති අංක 13 | **වැඩිහිටියන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා (යෝගා පුහුණුව) සහ ඩිජිටල් සාක්ෂරතාවය සහ ජීවනෝපාය සම්බන්ධ වැඩසටහන** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 10.80 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 3.82 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 5 |
| | |
| ව්‍යාපෘති අංක 14 | **ජීවනෝපාය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද වැඩිහිටි දිවා මධ්‍යස්ථාන අතුරින් තෝරාගත් මධ්‍යස්ථාන සඳහා මූල්‍ය ආධාර සැපයීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 4.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.40 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 2 |
| | |
| ව්‍යාපෘති අංක 15 | **පුහුණුකරුවන් පුහුණු කිරීමේ(TOT)වැඩසටහන (වැඩිහිටියන් සහ නිලධාරීන් සඳහා යෝග අභ්‍යාස සහ සරල අභ්‍යාස සඳහා)** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 7.80 |

| | |
|---|---|
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 2.66 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 2 |
| | |
| ව්‍යාපෘති අංක 16 | **වැඩිහිටියන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 33.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 21.09 |
| **භෞතික ප්‍රගතිය** | වැඩිහිටියන් 435 |
| | |
| ව්‍යාපෘති අංක 17 | **වැඩිහිටියන් සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 7.20 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 6.33 |
| **භෞතික ප්‍රගතිය** | වෛද්‍ය කඳවුරු 6 |
| | |
| ව්‍යාපෘති අංක 18 | **විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 3.11 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 2.52 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 22 |
| | |
| ව්‍යාපෘති අංක 19 | **කතරගම වැඩිහිටි නිවාසය සඳහා උපකරණ මිලදී ගැනීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 37.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.26 |
| **භෞතික ප්‍රගතිය** | ප්‍රවාහන හා දැන්වීම් පළකිරීමේ කටයුතු |

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

**ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ**

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **5.00** | **5.00** |
| පුනරාවර්තන | **163.78** | **153.20** |
| එකතුව | **168.78** | **158.20** |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | |
|---|---|
| ව්‍යාපෘති අංක 01 | විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීමහාවාරිකමුදල්එකතුකිරීම. |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | සමාජආරක්‍ෂණඅරමුදල - රු. මි. 5 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | - |
| **භෞතික ප්‍රගතිය** | නව සාමාජික බඳවාගැනීම් සංඛ්‍යාව: 55,599<br>රැස්කළ පළමු වාරික මුදල :රු.මි.149.34<br>රැස්කළ පසු වාරික මුදල :රු.මි.271.72<br>පසු වාරිකගෙවූ සාමාජිකසංඛ්‍යාව :187,072 |
| | |
| ව්‍යාපෘති අංක 02 | **ස්වයං රැකියාවල නියුතු පුද්ගලයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | භාණ්ඩාගාර ප්‍රතිපාදන- රු. මි. 3.0<br>සමාජ ආරක්‍ෂණ අරමුදල - රු. මි. 3.0 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | භාණ්ඩාගාරප්‍රතිපාදන- රු. මි. 0.977<br>සමාජ ආරක්‍ෂණ අරමුදල - රු. මි. 1.723 |
| **භෞතික ප්‍රගතිය** | වැඩ සටහන් : 3,506 |
| | |
| ව්‍යාපෘති අංක 03 | **සාමාජිකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය සහ සාමාජිකයින් සඳහා අනෙකුත් ප්‍රතිලාභ ප්‍රදානය** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.63 (පුනරාවර්තන වියදම් යටතේ සිදුකර ඇත) |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | විශ්‍රාමවැටුප්ගෙවීම් - රු.මි.429.31<br>අනෙකුත්ප්‍රතිලාභගෙවීම්-රු.මි.11.472 |
| **භෞතික ප්‍රගතිය** | **විශ්‍රාමවැටුප්ගෙවීම්**<br>විශ්‍රාමිකයින්සංඛ්‍යාව : 36,210<br>**අනෙකුත්ප්‍රතිලාභගෙවීම්**<br>ප්‍රතිලාභගෙවීම් සංඛ්‍යාව : 877 |
| | |
| ව්‍යාපෘති අංක 04 | **පුරවැසියන් හා තරුණ ප්‍රජාව සඳහා ස්වයං රැකියා වෙත යොමුවීම ධෛර්යමත් කිරීමේ හාදැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.9 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.133 |
| **භෞතික ප්‍රගතිය** | පාසල් ශිෂ්‍ය ප්‍රජාව සහ වෘත්තිය පුහුණුව ලබන තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා පැවැත්වූවැඩසටහන්සංඛ්‍යාව : 177<br>දැනුවත්කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව: 11,620 |
| ව්‍යාපෘති අංක 05 | **තොරතුරු තාක්ෂණ පහසුකම් හා කාර්යාල පහසුකම් වර්ධනය** |
| **ව්‍යාපෘතියසඳහා ප්‍රතිපාදන (රු.මි)** | 5.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 4.99 |
| **භෞතික ප්‍රගතිය** | පරිගණක උපාංග (14ක්) සහ කාර්යාල උපකරණ (41ක්) දිස්ත්‍රික් කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල වෙත සම්පාදනය කිරීම. |
| | |

## ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන (**සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම** ) | **100.00** | **98.91** |
| ප්‍රාග්ධන (වෙනත්) | **15.00** | **15.00** |
| පුනරාවර්තන | **170.50** | **150.49** |
| එකතුව | **285.50** | **264.40** |

- සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශය වැය ශීර්ෂය වෙත වෙන් කරනු ලබයි.

**ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදල ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය 2024.12.31 දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| සංවර්ධන | **27.75** | 11.53 |
| එකතුව | **27.75** | 11.53 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘති අංක 01 (ප්‍රාග්ධන වියදම්) | ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණය |
|---|---|
| **ව්‍යාපෘති සාරාංශය** | A හා B වශයෙන් කොටස් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර 2022 ඔක්තෝබර් මස අවසන් කිරීමට සැලසුම් කරන ලද නමුත් සැලසුම් කාල සීමාව දීර්ඝ කර ඇත.<br>මෙම ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම රු. මිලියන 1000 ක් වේ.මුළු ඉදිකිරීම් වලින් 1.84% ක් 2024 වර්ෂයේ සිදු කිරීම ඉලක්කගත කරන ලදී. |
| **ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයට වෙන් වූ ප්‍රතිපාදන (රු.මි)** | 100.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 98.91 (සමුච්චිත 971.74) |
| **භෞතික ප්‍රගතිය** | 0.03 % (සමුච්චිත 98.19%) |
| | |
| ව්‍යාපෘති අංක 02 (ප්‍රාග්ධන වියදම්) | |
| **ව්‍යාපෘති සාරාංශය** | ආයතනය සඳහා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 15.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 14.96 |
| **භෞතික ප්‍රගතිය** | පරිගණක30, ලැප්ටොප් පරිගණක 16,මල්ටි මීඩියා 11,ඩිජිටල් ස්ක්‍රීන් 02 |
| | |
| ව්‍යාපෘති අංක 03 | |
| **ව්‍යාපෘති සාරාංශය** | සමාජ වැඩ උපාධි පාඨමාලාව (සමාජ සේවා විද්‍යාලය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 13.00 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 13.00 |
| **භෞතික ප්‍රගතිය** | • සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2018/2019 - සිසුන් 42, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2019/2020- සිසුන්86 සඳහා උපාධිප්‍රදානෝත්සවය පැවැත්වීම, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2020/2021- සිසුන්157, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2021/2022- සිසුන් 403, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2022/2023-සිසුන් 183, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2023/2024- සිසුන් 165 අධ්‍යන කටයුතු සිදුකිරිම.<br>• ශිෂ්‍ය සුහසාධන කටයුතු වෙනුවෙන් (ශිෂ්‍යාධාර) සිසුන් 360 සඳහා ගෙවීම් කිරීම. |
| | |
| ව්‍යාපෘති අංක 04 | |
| **ව්‍යාපෘති සාරාංශය** | පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (පුහුණු අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.28 |
| **භෞතික ප්‍රගතිය** | ප්‍රතිලාභීන් 288 ක් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් 05 ක් පැවැත්වීම, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලව සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරිම, ක්ෂේත්‍ර උපදේශකවරුන් 148 ක් සඳහා වැඩමුළු 02ක් පැවැත්වීම. |
| ව්‍යාපෘති අංක 05 | |
| **ව්‍යාපෘති සාරාංශය** | පර්යෙෂණ හා ප්‍රකාශන එළිදැක්වීම, සම්මන්ත්‍රණ හා පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම (පර්යෙෂණ හා ප්‍රකාශන අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 2.0 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.62 |
| **භෞතික ප්‍රගතිය** | සමාජ විද්‍යා ඊ-සඟරා 02, සමාජ වැඩ ඊ-සඟරා 02, සමාජ වැඩ පිළිබඳ ශිෂ්‍ය ඊ-සඟරා 01, පුවත් ඊ-හසුන් 02, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 08, පර්යේෂණ සම්මන්ත්‍රණ 01, වර්තමාන සමාජ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ 01, සමාජ වැඩ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 01 ක් පැවැත්වීම. |
| | |
| ව්‍යාපෘති අංක 06 | |
| **ව්‍යාපෘති සාරාංශය** | අධ්‍යයන වැඩසටහන් වල තත්ත්ව සහතිකකරණය (තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 5.0 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 4.12 |

| | |
|---|---|
| **භෞතික ප්‍රගතිය** | නව උපාධි පාඨමාලා විෂය නිර්දේශ සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම, නව උපාධි පාඨමාලාවලට අදාල සමාලෝචන පැවැත්වීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදුකරන ආයතනික සමාලෝචනය (Institutional Review)වැඩසටහන පැවැත්වීම. |
| ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදල මඟින් පවත්වන වැඩසටහන් | |
| | |
| ව්‍යාපෘති අංක 07 | |
| **ව්‍යාපෘති සාරාංශය** | අධ්‍යයන වැඩසටහන් වල තත්ත්ව සහතිකකරණය |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 18.48 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 7.36 |
| **භෞතික ප්‍රගතිය** | නව උපාධි පාඨමාලා විෂය නිර්දේශ සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදුකරන ආයතනික සමාලෝචනය සහ ඒ සඳහා ගෙවීම (Institutional Review) සිදුකිරීම. ආයතනය සඳහා නව වෙබ් අඩවිය සකස්කර අවසන් කිරීම.Wing Bගොඩනැගිල්ල ජාලගත කිරීම අවසන් කර ඇත. |
| | |
| ව්‍යාපෘති අංක 08 | |
| **ව්‍යාපෘති සාරාංශය** | නව පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම (සමාජ වැඩ අධ්‍යයන අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 3.2 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.850 |
| **භෞතික ප්‍රගතිය** | ආචාර්ය උපාධි 01, දර්ශනපති උපාධි 01 හා ශාස්ත්‍රපති උපාධි 01 පාඨමාලාවන් සඳහා විෂයමාලා සංවර්ධනය කර ඇත. |
| ව්‍යාපෘති අංක 09 | |
| **ව්‍යාපෘති සාරාංශය** | නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම (මානව විද්‍යා හා වෘද්ධ විද්‍යා අධ්‍යයන අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.5 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.12 |
| **භෞතික ප්‍රගතිය** | මානව විද්‍යා විශේෂ උපාධිය හා වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය සඳහා සංශෝධනය කරන ලද යෝජනා පත්‍ර සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| | |
| ව්‍යාපෘති අංක 10 | |
| **ව්‍යාපෘති සාරාංශය** | නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම (සමාජ විද්‍යා හා සමාජ සංවර්ධන අධ්‍යයන අංශය ) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.5 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.071 |
| **භෞතික ප්‍රගතිය** | සමාජ විද්‍යා විශේෂ උපාධිය සඳහා සංශෝධනය කරන ලද යෝජනා පත්‍රය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. |
| | |
| ව්‍යාපෘති අංක 11 | |
| **ව්‍යාපෘති සාරාංශය** | නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම (මනෝවිද්‍යා හා උපදේශන අධ්‍යයන අංශය ) |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.5 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.133 |
| **භෞතික ප්‍රගතිය** | මනෝවිද්‍යා හා උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවේ සංශෝධනය කරන ලද විෂය නිර්දේශය SCAQA පැනල මණ්ඩලයට ඉදිරිපත් කර එම නිර්දේශ අනුව නැවත සකස් කර ඇත. |
| | |
| ව්‍යාපෘති අංක 12 | |
| **ව්‍යාපෘති සාරාංශය** | සිසුන් සඳහා නේවාසික පහසුකම් හා සුබසාධන වැඩසටහන් පැවැත්වීම (ශිෂ්‍ය සුබසාධන අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.0 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.134 |
| **භෞතික ප්‍රගතිය** | උපාධි පාඨමාලාවන්හි සිසුන් 336 ක් සඳහා මානසික සෞඛ්‍ය හා උපදේශනය පිළිබඳ වැඩසටහන් 02, පෞරුෂත්ව සංවර්ධන වැඩමුළු 01 හා ක්‍රීඩා තරගාවලියක් පැවැත්වීම |
| | |
| ව්‍යාපෘති අංක 13 | |
| **ව්‍යාපෘති සාරාංශය** | විෂය නිර්දේශ සංවර්ධන මධ්‍යස්ථානය |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.0 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.650 |
| **භෞතික ප්‍රගතිය** | මානව විද්‍යා විශේෂ උපාධිය, වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය හා සමාජ විද්‍යා විශේෂ උපාධිය විෂය නිර්දේශ සමාලෝචනය කිරීම හා අංශයට අදාළ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 01, ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍රයක් හා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීම |
| | |
| ව්‍යාපෘති අංක 14 | |
| **ව්‍යාපෘති සාරාංශය** | පුස්තකාල සංවර්ධන වැඩසටහන |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.572 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.564 |
| **භෞතික ප්‍රගතිය** | 100% - පුස්තකාලය ඩිජිටල්කරණය කිරීම |
| | |
| ව්‍යාපෘති අංක 15 | |
| **ව්‍යාපෘති සාරාංශය** | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීම (ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.5 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.16 |
| **භෞතික ප්‍රගතිය** | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු වැඩමුළු 03 ක් පැවැත්වීම හා මෙහෙයුම් කමිටු රැස්වීම් 01ක් පැවැත්වීම. |
| | |
| ව්‍යාපෘති අංක 16 | |
| **ව්‍යාපෘති සාරාංශය** | මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උපාධි සිසුන් ඇතුලත් කර ගැනීම,විභාග පැවැතවීම, උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම. (ලේඛකාධිකාරී අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.5 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.5 |

| | |
|---|---|
| **භෞතික ප්‍රගතිය** | 2023 සමාජවැඩ උපාධිය සඳහා සිසුන් බඳවා ගැනීම. සිසුන් 162 බඳවා ගැනීම, උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම. |
| ආයතනය මගින් මුදල් අයකර පවත්වන ලද පාඨමාලා | |
| ව්‍යාපෘතිඅංක17 | |
| **ව්‍යාපෘති සාරාංශය** | සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය 2021/2022, 2022/2023, සමාජවැඩ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023 (සමාජ සේවා විද්‍යාලය) |
| **ව්‍යාපෘතිය සඳහා ආදායම** | 17.05 |
| **වියදම** | 12.963 |
| **භෞතික ප්‍රගතිය** | 2021/2022 ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සිසුන් 67 , 2022/2023 ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සිසුන් 150, 2022/2023 සමාජ වැඩ ඩිප්ලෝමා සිසුන් 30 |
| | |
| ව්‍යාපෘති අංක 18 | **ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023, උපදෙශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023, උපදෙශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2023/2024 (සීදූව, කිලිනොච්චි, යාපනය), උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025 (සීදූව, අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, නුවර, තලාව)<br>ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හා සාමාන්‍ය ඉංග්‍රීසි පාඨමාලාව (පුහුණු අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ආදායම (රු.මිලි.)** | 14.26 |
| **වියදම (රු.මිලි.)** | 7.51 |
| **භෞතික ප්‍රගතිය** | • උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023 සිසුන් 21 හා, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023 සිසුන් 243 ක් සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රධානෝත්සවය පවත්වා ඇත.<br>• උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2023/2024 (සීදූව, කිලිනොච්චි, යාපනය) පාඨමාලා 6 ක සිසුන් 240.<br>• උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025 (සීදූව, අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, නුවර, තලාව) පාඨමාලා 8 ක සිසුන් 320.<br>• ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හා සාමාන්‍ය ඉංග්‍රීසි පාඨමාලාවන් 2ක සිසුන් 100 දෙනෙකු සඳහා 2025 ජනවාරි මස විභාග පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| ව්‍යාපෘති අංක 19 | |
| **ව්‍යාපෘති සාරාංශය** | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පර්යේෂණ අංශය) |
| **ව්‍යාපෘතිය සඳහා ආදායම** | 1.49 |
| **වියදම** | 0.476 |
| **භෞතික ප්‍රගතිය** | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සිසුන්45 දෙනෙකු අවසන් කර ඇත. පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 35 දෙනෙකු ලියාපදිංචි වී ඇත. |

# ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

## අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2024 සහ ප්‍රගතිය - 2024.12.31 දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **15.00** | **12.48** |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | කෘෂිකාර්මික හා අපනයන භෝග ක්ෂේත්‍රවල ඇති සුවිශේෂී තත්ත්වය හේතුවෙන් ග්‍රාමීය සමාජයට සිදු වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීම |
|---|---|
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.25 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.15 |
| **භෞතික ප්‍රගතිය** | අධ්‍යයන වාර්තාවඅවසන් කිරීම |
| | |
| ව්‍යාපෘති අංක 02 | **වෙළෙඳපොළ පදනම් කරගත් එළවළු නිෂ්පාදනය සහ අලෙවිය පිළිබඳ සමීක්ෂණය** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.08 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.03 |
| **භෞතික ප්‍රගතිය** | අධ්‍යයන වාර්තාව අවසන් කිරීම |
| | |
| ව්‍යාපෘති අංක 03 | **විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ පවුල් මුහුණ දෙන ගැටළු පිළිබඳ සිද්ධි අධ්‍යයනය** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.08 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.04 |
| **භෞතික ප්‍රගතිය** | ඇගයීම් වාර්තාව අවසන් කිරීම |
| | |
| ව්‍යාපෘති අංක 04 | **තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම පිළිබඳ ක්‍රියාකාරී පුහුණුව.** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.95 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.95 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 9 |
| | |
| ව්‍යාපෘති අංක 05 | **ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ නිරත වූ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් පැවැත්වීම (අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබල ගැන්වීම සඳහා ගෘහ කළමනාකරණය සහ පවුල් සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී පුහුණු මැදිහත්වීම)** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.08 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.67 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 12 |

| | |
|---|---|
| ව්‍යාපෘති අංක 06 | **ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ නිරත වූ ක්ෂේත්‍ර නිලධාරීන් සහ ග්‍රාමීය නායකයින් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් පැවැත්වීම(අස්වැසුම ප්‍රතිලාභී පවුල් සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු මැදිහත්වීම)** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.60 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.34 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 7 |
| | |
| ව්‍යාපෘති අංක 07 | **ඇස්වැසුම වැඩසටහනේ නියැලී සිටින ක්ෂේත්‍ර නිලධාරීන් සහ ග්‍රාමීය නායකයින් සඳහා ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම් සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.50 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.44 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 6 |
| | |
| ව්‍යාපෘති අංක 08 | **සහභාගීත්ව සංවර්ධනයට අදාළව පළාත් මට්ටමේ පුහුණු සංචිත ගොඩනැගීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.40 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.38 |
| **භෞතික ප්‍රගතිය** | පුහුණු සංචිත 9 |
| | |
| ව්‍යාපෘති අංක 09 | **පළාත් පාලන ආයතන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් සඳහා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.85 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.91 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 10 |
| | |
| ව්‍යාපෘති අංක 10 | **ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ට ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම දායක වීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.59 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.46 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 4 |
| | |
| ව්‍යාපෘති අංක 11 | **ග්‍රාමීය සංවර්ධනය හා සම්බන්ධ ප්‍රකාශන නිකුත්කිරීම** |
| **ව්‍යාපෘති සාරාංශය** | විද්‍යුත් ප්‍රකාශන ලෙස නිකුත්කරයි |
| **භෞතික ප්‍රගතිය** | 1 වන වෙළුම සහ දෙවන වෙළුම අවසන් කිරීම |

# උපදේශන අංශය

## අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2024 සහ ප්‍රගතිය - 2024.12.31 දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | **6.00** | **5.76** |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | |
|---|---|
| ව්‍යාපෘති අංක 01 | මනෝ සමාජීය ගැටළු පදනම්කරගත් කණ්ඩායම් උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 3.23 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 3.19 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන්6,664<br>ප්‍රතිලාභීන් 311,295 |
| | |
| ව්‍යාපෘති අංක 02 | **තරුණ සංවිධාන සඳහා ප්‍රාදේශීය මට්ටමින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 746<br>ප්‍රතිලාභීන් 37,116 |
| | |
| ව්‍යාපෘති අංක 03 | **අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ මානසික ඒකාග්‍රතාවය වැඩිදියුණුකිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 86<br>ප්‍රතිලාභීන් 556 |
| ව්‍යාපෘති අංක 04 | **සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති පුවක්පිටිය - පුනරුත්ථාපන මධ්‍යස්ථානය, කැටවල - වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, තෙළඹුයාය - වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා"රියන්සි අලගියවන්න" කාන්තා රැකවරණ මධ්‍යස්ථානය යන ආයතනවලඋපදේශන වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 74<br>ප්‍රතිලාභීන් 204 |
| ව්‍යාපෘති අංක 05 | **ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව"වික්ටෝරියා" නිවාසයෙහි උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 12<br>ප්‍රතිලාභීන් 120 |

| | |
|---|---|
| ව්‍යාපෘති අංක 06 | **පූර්ව විවාහ වැඩසටහන් පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 452<br>ප්‍රතිලාභීන් 16,682 |
| | |
| ව්‍යාපෘති අංක 07 | **මානසික සෞඛ්‍ය සතිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 1.57 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 1.57 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 24<br>ප්‍රතිලාභීන් 2,874 |
| | |
| ව්‍යාපෘති අංක 08 | **ගම්පහ, පන්නල, කතරගම වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් සඳහා උපදේශන සායන පැවැත්වීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 45<br>ප්‍රතිලාභීන් 122 |
| ව්‍යාපෘති අංක 09 | **ජංගම දුරකථන හරහා උපදේශන සේවය ලබාදීම** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.12 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.07 |
| **භෞතික ප්‍රගතිය** | දුරකථන ඇමතුම් 3,312 ක් හරහාඋපදේශන සේවය ලබාදීම |
| | |
| ව්‍යාපෘති අංක 10 | **උපදේශන නිලධාරීන්ගේකුසලතා සංවර්ධන වැඩසටහන්** |
| **ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 0.40 |
| **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | 0.40 |
| **භෞතික ප්‍රගතිය** | වැඩසටහන් 5<br>ප්‍රතිලාභීන් 329 |

## 2.3 අභියෝග

### කාන්තා හා ළමා කටයුතු අංශය

1. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට කාන්තාවන්ගේ සක්‍රීය දායකත්වය උපරිම ලෙස ලබා ගැනීම හා ශ්‍රම බලකායේ ඔවුන්ගේ දායකත්වය ඉහළ නැංවීම තුළින් කාන්තාවන් සවිබලගැන්වීම.
2. තවදුරටත් පවත්නා සාම්ප්‍රදායික ආකල්ප, සිරිත් විරිත් හා ඇතැම් නීතිරීති මඟින් කාන්තා සංවර්ධනයට ඇති විභවතාවයන් හා අවස්ථාවන් හීනවීම.
3. වෙනස්වන සමාජ, ආර්ථික, සංස්කෘතික හා තාක්ෂණික වටපිටාව තුළ කාන්තාවන් හා ළමුන් හිංසනයන්ට හා අපයෝජනයන්ට ගොදුරුවීමේ ඉඩ ප්‍රස්ථා අවම කිරීම.
4. ශ්‍රී ලාංකික කාන්තාවන් ජාත්‍යන්තර ආර්ථිකයට හා වෙළඳ පොල ක්‍රියාවලියට බද්ධ කිරීම හා ඒ සඳහා තොරතුරු තාක්ෂණික භාවිතයන් හා ශක්‍යතාවයන් පුළුල් කිරීම.
5. දේශගුණ විපර්යාස හමුවේ කාන්තාවන් හා ළමුන් මුහුණ දෙන පීඩාවන් අවම කිරීම හා එකී පීඩාවන්ට ශක්තිමත්ව මුහුණදීමට ඔවුන්ව සවිබලගැන්වීම.
6. කාන්තා හිංසනය හා ළමා අපයෝජනය වැළැක්වීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම හා කාන්තාවන් හා ළමුන් සවිබලගැන්වීම සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය උපරිම වශයෙන් දායක කර ගැනීම.
7. ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ දීර්ඝ කාලීන මැදිහත්වීම් තුළින් කාන්තා හා ළමා සංවර්ධනයට ඇති ඉඩකඩ පුළුල් කිරීම.
8. කාන්තා හා ළමා සංවර්ධනයට අදාළව අඛණ්ඩව යාවත්කාලීන වන දත්ත හා තොරතුරු පවත්වාගෙන යාම හා දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියකට ඒවා බද්ධ කිරීම.
9. සාම්ප්‍රදායික එදිනෙදා පවුලේ කටයුතුවලට කේන්ද්‍රගතව සිටින කාන්තාවන් ආර්ථික ක්‍රියාවලියට යොමු කිරීම සඳහා අවශ්‍යවන ළමා හා වැඩිහිටි රැකවරණ සේවාවන් පුළුල් කිරීම.
10. කාන්තාවන්ට හා ළමුන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් හා අවස්ථාවන් සීමාවන නීතිරීති සංශෝධනය කිරීම හා සංවර්ධනය කිරීම කල්ගත වීම.
11. කාන්තා හා ළමා සංවර්ධනයේ ප්‍රතිඵල සැබෑ වශයෙන්ම ඉලක්ක ප්‍රජාව වෙත යාම හා ඒම සැපයුම් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා ප්‍රජාවගේ සහයෝගය හා දායකත්වය තවදුරටත් ශක්තිමත්ව ලබා ගැනීම.
12. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව තහවුරු කරමින් කාන්තාවන් හා ළමුන්ට හිතකර තෘප්තිමත් හා යහපත් ජීවිතයක් ගත කළ හැකි තිරසර සමාජයක් ඇති කිරීම.

## සමාජ සවිබලගැන්වීම් අංශය

1. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අමුද්‍රව්‍ය මිල ඉහළ යාම, වෙළඳපොල ගැටළු, වෙන්වන ප්‍රතිපාදන සීමා සහිත වීම, නූතන තාක්ෂණය භාවිතය සඳහා මතුවන දුෂ්තරතා පැවතීම.
2. ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය මට්ටමින් නිලධාරී නොමැති අතර සමාජ සේවා නිලධාරීන් මඟින් රාජකාරී ඉටු කරගැනීමට යාමේදී සෘජුව විධාන දීමේ ගැටළුකාරී තත්ත්වයක් පවතී .
3. අමාත්‍යාංශයට අදාළ සියළු නිලධාරීන් සඳහා අන්තර්ජාල හා පරිගණක පහසුකම් අවමවීම නිසා ප්‍රාදේශීය මට්ටමින් දත්ත ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදුවීම**.**
4. අමාත්‍යාංශයේ ඇතැම් ආයතනවල පවතින නිලධාරී හිඟය.
5. වැඩිහිටියන් නිවාසගතවීමේ ප්‍රවණතාවය වර්ධනය වීම හේතුවෙන් ඊට සාපේක්ෂව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දුෂ්කරතා.
6. ඇතැම් ප්‍රදේශිය ලේකම් කාර්යාලයන්හි පවතින ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය විශාල බැවින් විෂයය ආවරණය කිරීම සඳහා අනුමත ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම.
7. ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිවන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් වැඩි සිසුන් ප්‍රමාණයක් සඳහා පාඨමාලා පැවැත්වීමේ ඉඩ පහසුකම් සීමාවීම.
8. ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීමේ ඉඩකඩ සීමාවීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන අංශයට අදාළ රාජකාරී කාර්යක්ෂම කිරීමේ ගැටලු මතුවීම.
9. ආර්ථික අර්බුදය හමුවේ ඉලක්කගත පාරිභෝගිකයින්ගේ ආදායම් කෙරෙහි ඇති වූ අයහපත් බලපෑම මත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම වෙත සාමාජික බඳවා ගැනීම හා වාරික රැස්කිරීම් දුෂ්කර වීම.
10. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රවර්ධනය කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් නොවීම සහ රාජ්‍ය චක්‍රලේඛ මඟින් වියදම් සීමාවන් පැනවීම.
11. දායකයන්ගේ වාරික මුදල් සාපේක්ෂව ඉහළ අගයක පැවතීම හේතුවෙන් ස්වයං රැකියා නියුක්තික අඩු අදායම්ලාභීන් ඒ සඳහා රාජ්‍ය මූල්‍ය දායකත්වය අපේක්ෂා කිරීම.

# ඉදිරි ඉලක්ක

## කාන්තා හා ළමා කටයුතු අංශය

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ පනත පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
2. කාන්තාවන් සවිබලගැන්වීමේ පනත ක්‍රියාත්මක කිරීම.
3. ජාතික කාන්තා කොමිසම පිහිටුවීම.
4. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටු දැකීමේ සම්මුතිය (CEDAW) කාලීන වාර්තාකරණය සිදු කිරීම (2025 පෙබරවාරි)
5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ජාතික උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම (GEWE NAP)
6. ප්‍රධාන සුභ සාධන වැඩසටහන් වලට සහ අනෙකුත් වැඩසටහන් වලට අදාළව විධිමත් දත්ත යාවත්කාලීනව පවත්වාගෙන යාම.
7. අමාත්‍යාංශයේ ළමුන් සම්බන්ධයෙන් සමඟ කටයුතු කරන අනෙකුත් ආයතන හා ඒකාබද්ධව නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණ වැඩසටහන් වඩා පුළුල්ව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.
8. කාර්යාලගත සහ ක්ෂේත්‍රගත නවක නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.
9. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම (2024-2028) සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ ජාතික කමිටු යාන්ත්‍රණය බලගැන්වීම තුළින් ඉහත සැලැස්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම.

## සමාජ සවිබලගැන්වීම් අංශය

1. පුරවැසියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය.
2. ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ පවතින සමිති සතු අරමුදල් සක්‍රිය සංසරණයට යෙදවීම.
3. 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධනය අවසන් කිරීම.
4. සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම
5. ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම
6. දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම
7. අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කිරීම

8. ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයක් (Internal Quality Assurance Unit) පිහිටුවා පවත්වාගෙනයාම.
9. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා නව පාඨමාලා ආරම්භ කිරීමේ අවශ්‍යතාවය ඇති අතර දැනට පවතින අංශයන් (Divisions) අධ්‍යයන අංශ (Departments) ලෙස නම් කර ආයතනයෙහි ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීම.
10. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනයේ අධ්‍යයන කටයුතු තවදුරටත් පුළුල් කරමින් උසස් පෙළ සමතුන් වැඩි පිරිසකට උසස් අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් ආයතනය විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීමට කටයුතු කිරීම.
11. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම පුළුල් කිරීම හා ප්‍රතිලාභ පුළුල් කිරීම.
12. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයෙහි ලේඛන ඩිජිටල්කරණය කිරීම මඟින් සේවා කාර්යක්ෂම කිරීම
13. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවස්ථා පුළුල් කිරීම මඟින් සේවා ඵලදායිතාවය ඉහළ නැංවීම



# පරිච්ඡේදය 03

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඒසීඒ-එෆ් | |
| 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | | | | | |
| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | තත්‍ය | | |
| | | | 2024 | 2023 | |
| රු. | | | රු. | රු. | |
| | | | | | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| | 2.2) මූල්‍යමය අවධානමට පත්වීම සඳහා ආරක්ෂණයද ඇතුලත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩුවියදමකින් ලබාගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යාවශ්‍ය සෞඛ්‍ය | 2.2.1) වෛද්‍ය ආධාර ලබාගත් ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| | | 2.2.2) වැඩිහිටි රැකවරණය පිළිබඳ පුහුණුව ලැබූ පාලිකාවන් ගණන | | | √ |
| | | 2.2.3) ආරෝග්‍යා වෛද්‍ය ආධාර ලබාගත් වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවාවන් සියළු දෙනාටම ලබාගත හැකිවීම ඇතුළුව විශ්විය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට හැකිවීම. (3.8) | 2.2.4) ආධාරක උපකරණ (ශ්‍රවණාධාර, කණ්ණාඩි) ලබාගත් වැඩිහිටි පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| 3)පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලැසීම **(SDG 04)** | 3.1) 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩුමුදලකට ලබාගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනයද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබාගැනීමට හැකිවීම. (4.3) | 3.1.1) සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | | | √ |
| | | 3.1.2) වෘත්තීය පුහුණු ආයතන වල සහ තරුණ කණ්ඩායම් වල කුසලතා සංවර්ධනය සඳහා පැවැත්වූ වැඩසටහන් ගණන | | | √ |
| | | 3.1.3) අධ්‍යාපන ආධාර ලබා දුන් ආබාධිත සිසුන් සංඛ්‍යාව | | | √ |
| **4) සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික ප්‍රවර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම (SDG 8)** | 4.1) 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සහ සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම (8.5) | 4.1.1) ස්වයං රැකියා ආධාර ලබාදුන් වැඩිහිටි පුද්ගලයින් සංඛ්‍යාව | | √ | |
| | | 4.1.2) ස්වයං රැකියා ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | | √ |
| | | 4.1.3) ආබාධිත පුද්ගලයින්ගේ කුසලතා සංවර්ධනය කෙරූ ආයතන සංඛ්‍යාව | | | √ |
| **5) නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. (SDG 11)** | 5.1) 2030 වනවිට සියලුම දෙනාට ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගතහැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම (11.1) | 5.1.1) නිවාස ආධාර ලබාදුන් ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | √ | |
| | | 5.1.2) නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආධාර ලබාදුන් වැඩිහිටි පුද්ගලයින් සංඛ්‍යාව | | | √ |

## 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

1. ජාතික ක්‍රියාකාරී සැලසුම් හා පනත් ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධිත ආයතන /අමාත්‍යාංශ සඳහා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ප්‍රගතිය ගෙන්වා ගැනීමේ දී අසීරුතාවන්ට මුහුණ පෑමට සිදුවීම.
2. වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා නිලධාරීන් හා සම්පත් හිඟ වීම.
3. විෂය දැනුම, පුහුණු අවශ්‍යතා ප්‍රමාණවත් නොවීම
4. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදී නූතන තාක්ෂණික ක්‍රම යොදා ගැනීමට නිලධාරීන් දක්වන සෘණාත්මක ආකල්ප, ප්‍රමාණාත්මක භෞතික සම්පත් නොමැති වීම හා නූතන තාක්ෂණික ක්‍රම හා භාවිතයන් පිළිබඳ වැඩිහිටි ප්‍රජාවගේ අවබෝධය අඩු වීම.
5. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලය හා භෞතික සම්පත් නොමැති විම.
6. ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා වැඩිහිටි ප්‍රජාව සක්‍රිය ලෙස සම්බන්ධ කර ගැනීමට අපහසු වීම.
7. ඇතැම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන් පවතින ග්‍රාම නිලධාරීවසම් ප්‍රමාණය විශාල බැවින් විෂයය ආවරණය කිරීම සඳහා එක් නිලධාරියකු ප්‍රමාණවත් නොවීම.
8. සැලසුම් කර ගත් පරිදි අක් මුදල් නොලැබීම.

# පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
| කාන්තා හා ළමා කටයුතු අංශය | 26 | 19 | 16 | 12 | 1018 | 934 | 71 | 58 | 1131 | 1023 | 108 |
| සමාජ සවිබලගැන්වීම් අංශය | 27 | 22 | 3 | 4 | 772 | 531 | 45 | 34 | **847** | **591** | **256** |
| **දෙපාර්තමේන්තු/ ආයතන/ අංශ** | | | | | | | | | | | |
| මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය | 5 | 3 | 0 | 0 | 391 | 386 | 5 | 2 | 401 | 391 | 10 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 21 | 12 | 17 | 6 | 567 | 278 | 13 | 8 | 618 | **304** | **314** |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය | 6 | 5 | 3 | 2 | 53 | 39 | 6 | 2 | **68** | **48** | **20** |
| ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | 7 | 4 | 2 | 1 | 115 | 102 | 23 | 12 | **147** | **119** | **28** |
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 8 | 7 | 14 | 11 | 133 | 93 | 43 | 39 | **198** | **150** | **48** |
| ජාතික සමාජ සංවර්ධන ආයතනය | 53 | 33 | 9 | 5 | 49 | 35 | 26 | 20 | **137** | **93** | **44** |
| සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය | 14 | 9 | 04 | 0 | 74 | 29 | 10 | 2 | **102** | **40** | **62** |
| ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය | 4 | 3 | 14 | 11 | 21 | 18 | 11 | 7 | **50** | **39** | **11** |
| **එකතුව** | **171** | **117** | **82** | **52** | **3193** | **2445** | **253** | **184** | **3699** | **2798** | **901** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

### කාන්තා හා ළමා කටයුතු අංශය

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි තනතුරු 26ක් අනුමත වී ඇති අතර ඒ අතරින් තනතුරු 06ක් පුරප්පාඩුව පවතී. එම තනතුරු පහත පරිදි වේ.

- සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා පරිපාලන සේවය) - 02
- ගණකාධිකාරී - 02
- අභ්‍යන්තර විගණක - 01
- සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය) - 01

එසේම තෘතීය මට්ටමේ නිලධාරි තනතුරු 16ක් අනුමත වී ඇති අතර, ඒ අතරින් තනතුරු 04ක් පුරප්පාඩුව පවතින අතර එම තනතුරු පහත පරිදි වේ.

- පරිපාලන නිලධාරී - 01
- තොරතුරු තාක්ෂණ නිලධාරී - 01
- උපදේශන නිලධාරී - 02

ද්විතීය මට්ටමේ නිලධාරි තනතුරු 1018ක් අනුමත වී ඇති අතර ඒ අතරින් පහත තනතුරු 79ක් පුරප්පාඩුව පවතී.

- සංවර්ධන නිලධාරි - 51
- කළමනාකරණ සේවා නිලධාරි - 16
- පුස්තකාල සහකාර (දෙපාර්තමේන්තුගත) 01-
- නේවාසිකාගාර පාලිකා (දෙපාර්තමේන්තුගත) - 05
- සහකාර නේවාසිකාගාර පාලිකා (දෙපාර්තමේන්තුගත) - 05
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර - 01

ප්‍රාථමික මට්ටමේ නිලධාරි තනතුරු 71ක් අනුමත වී ඇති අතර ඒ අතරින් තනතුරු 13ක් පුරප්පාඩුව පවතින අතර එම තොරතුරු පහත පරිදි වේ.

- රියදුරු - 01
- අරක්කැමි (දෙපාර්තමේන්තුගත) - 06
- කාර්යාල කාර්ය සහායක - 02
- මධ්‍යස්ථාන සහායක (දෙපාර්තමේන්තුගත) - 03
- රියදුරු (කිලිනොච්චි) (කොන්ත්‍රාත්) –01

**මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි තනතුරු 05ක් අනුමත වී ඇති අතර, ඒ අතරින් සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂක (ශ්‍රී ලංකා පරිපාලන සේවය) තනතුරු 02 ක් පුරප්පාඩුව පවතී.

මෙම ලේකම් කාර්යාලය සඳහා තෘතීය මට්ටමේ නිලධාරි තනතුරු අනුමත වී නොමැති අතර ද්විතීය මට්ටමේ නිලධාරි තනතුරු 391ක් අනුමතව ඇත. ඒ අතරින් මුල් ළමාවිය සංවර්ධන සහකාර තනතුරු 03ක් හා කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 02ක් පුරප්පාඩුව පවතී.

ප්‍රාථමික මට්ටමේ නිලධාරි තනතුරු 05ක් අනුමත වී ඇති අතර, ඒ අතරින් රියදුරු තනතුරු 02ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 01ක් පුරප්පාඩුව පවතී.

තවද, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ පවතින තනතුරු පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීය මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලදි.

විශේෂයෙන් සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි/ සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ නොවීම මත තොරතුරු තාක්ෂණ සම්බන්ධ කාර්යයන්හිදී ගැටලු මතුවීම සිදුවී ඇත.

## සමාජ සවිබලගැන්වීම් අංශය

මෙම අංශය සඳහා අනුමත වූ කාර්ය මණ්ඩලය 847 ක් විය. 2024.12.31 වන දිනට මෙම අමාත්‍යාංශයේ දැනට සිටින කාර්ය මණ්ඩලය 591 කි. අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ නොවීම අමාත්‍යාංශයේ අරමුණු සහ ඉලක්ක සපුරාගැනීමේදී බාධාවක් පවතී.
සංඛ්‍යාලේඛන නිලධාරි තනතුර සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ගැනීමට යටත්ව තනතුරු 01 ක් මෙම අමාත්‍යාංශය වෙත අනුමත කර ඇත.

## 6.3 මානව සම්පත් ධාරිතා සංවර්ධනය

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| **කාන්තා හා ළමා කටයුතු අංශය** | | | | | | | |
| 1 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 20 | 2024.01.29 | 2,935.00 | | දේශීය | රාජකාරි කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීම |
| 2 | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම සම්බන්ධව පුහුණුව | 60 | 2024.04.17 | 24,820.00 | | දේශීය | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 3 | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 30 | 2024.05.09 | 4195.00 | | දේශීය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීම |
| 4 | රාජ්‍ය වැටුප් මෘදුකාංගය පිළිබඳ පුහුණුව | 03 | 2024.07.18 | 63,000.00 | | දේශීය | වැටුප් වර්ධක සකස් කිරීම සඳහා භාවිතා වන වැටුප් මෘදුකාංගය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 5 | රාජ්‍ය විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන | 140 | 2024.07.23 | 28,040.00 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 6 | පරිගණක දෘඩාංග පිළිබඳ මූලික පුහුණු වැඩසටහන | 70 | 2024.07.30 | 26,726.00 | | දේශීය | පරිගණක මෘදුකාංග භාවිතය හා නඩත්තු කිරීම සම්බන්ධව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම |
| 7 | මු.රෙ. 104 - හානි හා පාඩු පිළිබඳ පුහුණු වැඩසටහන | 6 | 2024.07.25 | 30,000.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 8 | ඒකාබද්ධ සේවයේ රියදුරන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන | 60 | 2024.07.25 | 19,459.00 | | දේශීය | රියදුරු මහතුන් සඳහා රථවාහන පිළිබඳ න්‍යායාත්මක ප්‍රායෝගික සිද්ධි භාවිතයෙන් දැනුම වර්ධනය කිරීම |
| 9 | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 105 | 2024.08.08 | 10,740.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| 10 | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන | 135 | 2024.08.06 | 32,304.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| **11** | විශ්‍රාම වැටුප් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 45 | 2024.10.16 | 19,424.00 | | දේශීය | විශ්‍රාම වැටුප් සකස් කිරීම සඳහා වන න්‍යායාත්මක හා විශ්‍රාම වැටුප් පද්ධතිය පිළිබඳව දැනුම වර්ධනය කිරීම |
| **12** | ගබඩා කළමනාකරණය හා භාණ්ඩ සමීක්ෂණය | 40 | 2024.11.11 | 21,770.00 | | දේශීය | ගබඩා කළමනාකරණය හා භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **13** | විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 5 | 2024.10.22 | 125,000.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **14** | රජයේ වාහන නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 4 | 2024.11.28 | 20,000.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **15** | ආයතන සංග්‍රහයෙහි වැටුප් පරිච්ඡේදය පිළිබඳ පුහුණු වැඩසටහන | 40 | 2024.12.05 | 20,190.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **16** | කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහන | 8 | 2024.12.11 | 40,000.00 | | දේශීය | රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය වන රාජකාරි ලිපි ලිවීම හා කාර්යාල සටහන් ලිවීම සම්බන්ධව දැනුම වර්ධනය කිරීම |
| **17** | කථන ශිල්ප පුහුණු වැඩසටහන | 1 | 2024.12.03 | 35,000.00 | | දේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **18** | නාට්‍ය චිකිත්සාව උපදේශන වැඩසටහන | 41 | දින 02 | 12,140.00<br>10,570.00 | | දේශීය | රාජකාරි හා පෞද්ගලික ජීවිතයේ ඇති ආතතිය මඟහරවා ගැනීම |
| **19** | ආතති කළමනාකරණ පුහුණු වැඩසටහන | 27 | දින 02 | 231,000.00 | | දේශීය | රාජකාරි හා පෞද්ගලික ජීවිතයේ ඇති ආතතිය මඟහරවා ගැනීම |
| **20** | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණය (ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින්) | 40 | දින 01 | ප්‍රදායක ආයතනය විසින් සෘජුව දරා ඇත | . | දේශීය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණය පිළිබඳ දැනුම |

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| **21** | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) බහු පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුව | 60 | දින 01 | ප්‍රදායක ආයතනය විසින් සෘජුව දරා ඇත. | | දේශීය | කාන්තා ක්‍රියාකාරි සමාජ ව්‍යවස්ථා පිළිබඳ සාකච්ඡාව |
| **22** | තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය ( තුන්වන පුහුණු වැඩසටහන් මාලාව) | 06 | දින 08 | | ප්‍රදායක ආයතනය විසින් සෘජුව දරා ඇත. | විදේශීය | ඉන්දියාවේ කාන්තා සංවිධාන සම්බන්ධ දැනුම |
| **23** | දකුණු ආසියාවේ ළමා ශ්‍රමය අවසන් කිරීම සහ ළමුන්ගේ සහ තරුණයින්ගේ භූමිකාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ළමුන්ට එරෙහි හිංසනය අවසන් කිරීම පිළිබඳ කලාපීය ළමා උපදේශනය. | 2 | 2024.02.27-28 | | ඇ.ඩො 125 | විදේශීය | දකුණු ආසියාතික රටවල ළමා ශ්‍රමය ලබා ගැනීම හා ළමා ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සම්බන්ධව දැනුම වර්ධනය කිරීම |
| **24** | ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවය සහ සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ පුහුණුව (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දකුණු ආසියාතික කලාපීය පුහුණු හා තාක්ෂණික සහයෝගීතා මධ්‍යස්ථානය - IMF SARTTAC) | 2 | 2024.04.22-26 | | ඇ.ඩො 150 | විදේශීය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සාර්ව ආර්ථික ක්‍රමය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **25** | යුනිසෙෆ් දකුණු ආසියානු කලාපීය ඉගෙනුම් හා දැනුම හුවමාරු රැස්වීම | 1 | 2024.04.22-24 | | ඇ.ඩො 125 | විදේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීම |
| **26** | ආසියා සහ පැසිෆික් කලාපයේ ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙහි රාජ්‍ය ආයතන තුළ කාන්තා පැවැත්ම සහ නායකත්වය ප්‍රවර්ධනය කිරීම | 1 | 2024.04.22-25 | | ඇ.ඩො 125 | විදේශීය | ආසියා හා පැසිෆික් කලාපයන්හි රාජ්‍ය ආයතනයන් තුළ කාන්තා නායකත්වය ප්‍රවර්ධනය පිළිබඳ දැනුම වර්ධනය |
| **27** | ව්‍යවසායකත්වය, නායකත්වය සහ ජාලකරණය තුළින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - හවුල්කාරීත්ව පුහුණු වැඩසටහන | 6 | 2024.06.18-25 | | ඇ.ඩො 175*6 | විදේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **28** | ග්‍රාමීය කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ධාරිතා සංවර්ධනය (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය -JICA) | 1 | 2024.07.07-27 | | ඇ.ඩො 375 | විදේශීය | ග්‍රාමීය කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුම වර්ධනය කිරීම |

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| **29** | සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජ කළමනාකරණයට සහභාගී වන කාන්තා නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 2024.06.04-17 | | ඇ.ඩො 375*2 | විදේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **30** | ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මුලිනුපුටා දැමීම (දැනුම සහයෝගීත්ව නිර්මාණ වැඩසටහන) (මාර්ගගතව - 2024 සැප්තැම්බර් 3 -05 ජපානයේ - 2024 සැප්තැම්බර් 23 සිට ඔක්තෝබර් 12 දක්වා) (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය - JICA) | 1 | 2024.09.23-2024.10.12 | | ඇ.ඩො 375<br><br>ස්ටර්ලින් පවුම් 75 | විදේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **31** | දරුවන්ට එරෙහි හිංසනය අවසන් කිරීම පිළිබඳ ගෝලීය අමාත්‍ය සමුළුව 2024 නොවැම්බර් 07-08 බගෝටා, කොලොම්බියාව | 2 | 2024.11.07-08 | | ඇ.ඩො 280 ස්ටර්ලින් පවුම් 75 | විදේශීය | ළමා හිංසනය සම්බන්ධ දැනුම වර්ධනය කිරීම |
| **32** | නව යොවුන් වියේ ගැබ්ගැනීම් පිළිබඳ කලාපීය උපදේශනය - 2024 ජුලි 11-12 - නේපාලය | 1 | 2024.07.11-12 | | ඇ.ඩො 75 | විදේශීය | නව යොවුන් වියේ සිදුවන ගැබ් ගැනීම් පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **33** | සමාජ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ඔරොත්තු දීම හා සියලු පාර්ශ්ව ඇතුළත්ව) | 2 | 2024.09.12-13 | | ඇ.ඩො 160 | විදේශීය | ව්‍යවසායකත්වය මඟින් කාන්තාවන් සවිබලගැන්වෙන ආකාරය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **34** | ආසියා පැසිෆික් අමාත්‍ය සමුළුව බීජිං +30 සමාලෝචන | 1 | 2024.11.19-21 | | ඇ.ඩො 100 | විදේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීම |
| **35** | තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ උපදේශන වැඩමුළුව (සාර්ක් හා ආසියානු සංවර්ධන බැංකුව) | 1 | 2024.10.21-22 | | ඇ.ඩො 100 | විදේශීය | අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීම |
| **36** | කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | 1 | 2024.10.28-30 | | ඇ.ඩො 240 | විදේශීය | කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| **37** | රාජ්‍ය මූල්‍ය පහසුකම් කළමනාකරණය පළමු දකුණු යුරෝපා භුවමාරු වැඩසටහන (UNICEF) | 1 | 2024.11.24 - 2024.11.28 | | ඇ.ඩො 160 | විදේශීය | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය |

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| **සමාජ සවිබලගැන්වීම් අංශය** | | | | | | | |
| 1. | ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වන ලද පැය 100 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 9 | පැය 100 ක් 2023.12.05 - 2024.04.09දින දක්වා සෑම අඟහරුවාදා දිනයකම පැය 6.00 බැගින් | 0.00 | | දේශීය | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සේවා අවශ්‍යතාවය සපුරාලීම. |
| 2. | General Training on Operationalizing the National Evaluation Policy Implementation Framework | 1 | දින 2 (පැය 12) (2024.01.11 හා 12 දිනයන්හි) (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.00 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 3. | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණුව | 96 | 2024.01.17 දින - පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.0138 | | දේශීය | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳදැනුම වර්ධනය කිරීම. |
| 4. | WORKSHOP ON ADVANCED EXCEL | 5 | දින 3 (පැය 18) (2024.01.17, 18හා 19දිනයන්හි)( පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.00 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 5. | ගිණුම් ක්‍රම පිළිබඳ දෙවන එක්දින පුහුණු වැඩසටහන | 85 | 2024.01.29 දින - පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.00903 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 6. | අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල පිළිබඳ පුහුණු වැඩසටහන | 56 | 2024.02.16 දින - පැය 03 (පෙ.ව. 9.30 - ප.ව. 12.30) | 0.00278 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 7. | ප්‍රවාහන නිලධාරීන් හා වෘත්තීය රියදුරන් සඳහා වාහන වායු විමෝචන පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව | 45 | 2024.02.28දින - පැය 06 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.00 | | දේශීය | වාහන වායු විමෝචන පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම් වර්ධනය කිරීම |
| 8. | නවෝදා - සතුටින් වැඩකරන නවමු රැකියා ප්‍රවේශයක් උදෙසා මනෝවිද්‍යාත්මක පුහුණු වැඩසටහන | 71 | 2024.03.06 දින - පැය 03 (පෙ.ව. 9.30 - ප.ව. 12.30) | 0.006 | | දේශීය | සතුටින් වැඩකරන නවමු රැකියා ප්‍රවේශයක් උදෙසා |
| 9. | පළමු කාණ්ඩයේ නිලධාරිනිය සඳහා පවත්වන ලදපැය 200 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 6 | පැය 200 ක් 2024.03.18 - 2024.08.26 දින දක්වා සෑම සඳුදා, බදාදා හා සිකුරාදා දිනයන්හි පැය 6.00 බැගින් | 0.00 | | දේශීය | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සේවා අවශ්‍යතාවය සපුරාලීම. |

| | වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | දේශීය | විදේශීය | | |
| 10. | රාජ්‍ය සේවයේ මානව සම්පතෙයි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් 2024.03.22 දින සිට 2024.04.04 පවත්වන ලද පුහුණු වැඩසටහන | | | | | | | |
| | a. | ලිපි ලිවීම, සටහන් ලිවීම හා වාර්තා සකස් කිරීම පිළිබඳ දැනුම | 21 | පැය 3 (පෙ.ව. 9.15 - ප.ව. 12.15) | 0.00 | | දේශීය | ලිපි ලිවීම, සටහන් ලිවීම හා වාර්තා සකස් කිරීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| | b. | ගිණුම්කරණය හා වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම | 13 | පැය 3 (ප.ව. 12.45 - ප.ව. 3.45) | 0.00 | | දේශීය | ගිණුම්කරණය හා වැටුප් සකස් කිරීමපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| | c. | ධනාත්මක ආකල්ප සංවර්ධනය | 2 | පැය 3 (පෙ.ව. 9.15 - පෙ.ව.12.15) | 0.00 | | දේශීය | ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම. |
| | d. | විගණනය පිළිබඳ මූලික දැනුම | 18 | පැය 3 (පෙ.ව.12.45 - ප.ව. 3.45) | 0.00 | | දේශීය | විගණනය පිළිබඳ මූලික දැනුමලබා දීම |
| | e. | රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුම | 3 | පැය 3 (පෙ.ව. 9.15 - ප.ව. 12.15) | 0.00 | | දේශීය | තොරතුරු හා සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| | f. | ඉන්වෙන්ට්‍රි නඩත්තුව, තොග පාලනය හා ගබඩා පාලනය පිළිබඳ දැනුම | 24 | පැය 3 (පෙ.ව. 12.45 - ප.ව. 3.45) | 0.00 | | දේශීය | ඉන්වෙන්ට්‍රි නඩත්තුව, තොග පාලනය හා ගබඩා පාලනයපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| | g | විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම | 3 | පැය 3 (පෙ.ව. 9.15 - ප.ව. 12.15) | 0.00 | | දේශීය | විශ්‍රාම වැටුප් සකස් කිරීම දැනුම වර්ධනය කිරීම. |
| | h | ලිපි, ගොනුකරණය පිළිබඳ මූලික දැනුම | 19 | පැය 3 (පෙ.ව. 12.45 - ප.ව. 3.45) | 0.00 | | දේශීය | ලිපි, ගොනුකරණය පිළිබඳ මූලික දැනු ලබා දීම. |
| | i | මූලික විමර්ශන පිළිබඳ දැනුම | 8 | පැය 3 (පෙ.ව. 9.15 - ප.ව. 12.15) | 0.00 | | දේශීය | මූලික විමර්ශන පිළිබඳ දැනුමවර්ධනය කිරීම. |
| | j | නවීන පරිගණක දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 20 | පැය 3 (පෙ.ව. 12.45 - ප.ව. 3.45) | 0.00 | | දේශීය | නවීන පරිගණක දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 11 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද සෞඛ්‍ය සේවා කඳවුර (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | | 127 | 2024.03.26දින -පැය 6 (පෙ.ව. 8.30 - ප.ව. 3.30) | 0.00 | | දේශීය | සෞඛ්‍ය කඳවුරක් පැවැත්වීම. |

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 12. | ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ සහ පිළිකා හා බෝ නොවන රෝග පිළිබඳව පවත්වන ලද කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | 40 | 2024.03.27 දින -පැය 5½ (පෙ.ව. 9.00 - ප.ව. 3.30) | 0.00 | | දේශීය | අදාළ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 13. | කාර්යාල ක්‍රම පිළිබද පළමු එක්දින පුහුණු වැඩසටහන | 54 | 2024.03.28 දින -පැය6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.0112 | | දේශීය | කාර්යාල ක්‍රම පිළිබ දැනුම වර්ධනය කිරීම. |
| 14. | ඵලදායිතාව හා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාව | 1 | 2024.04.06 - 2024.08.12 දක්වා දින10 (පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා) (30 hours | 0.00 | | දේශීය | ඵලදායිතාව හා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 15. | ද්වීතියික ගණයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 22 | පැය 150 ක් 2024.04.06 - 2024.08.12 දින දක්වා සෑම සෙනසුරාදා, ඉරිදා, සඳුදා හා බ්‍රහස්පතින්දා දිනවල (ප.ව. 7.00 - ප.ව. 9.00) | 0.00 | | දේශීය | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සේවා අවශ්‍යතාවය සපුරාලීම. |
| 16. | Planning Workshop on Implementation of National Policy on Migration for Employment | 1 | 2024.04.09 දින -පැය5 (පෙ.ව. 9.30 - ප.ව. 3.30) | 0.00 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 17. | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | 28 | 2024.04.18 දින -පැය 5½ (පෙ.ව. 9.00 - ප.ව. 3.30 | 0.00 | | දේශීය | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳදැනුම වර්ධනය කිරීම. |
| 18. | කාර්යාල ක්‍රම පිළිබද දෙවන එක්දින පුහුණු වැඩසටහන | 64 | 2024.04.19 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.012595 | | දේශීය | කාර්යාල ක්‍රම පිළිබ දැනුම වර්ධනය කිරීම. |
| 19. | මුදල් රෙගුලාසි පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | 99 | 2024.04.26 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.01496 | | දේශීය | මුදල් රෙගුලාසි පිළිබඳදැනුම වර්ධනය කිරීම |
| 20. | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | 71 | 2024.05.03 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.01385 | | දේශීය | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 21. | මුදල් රෙගුලාසි පිළිබඳ දෙවන එක්දින පුහුණු වැඩසටහන | 40 | 2024.05.19 දින -පැය 6 | 0.00981 | | දේශීය | මුදල් රෙගුලාසි පිළිබඳදැනුම වර්ධනය කිරීම |

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| | | | (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | | | | |
| 22. | රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | 64 | 2024.05.22 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.01133 | | දේශීය | රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 23. | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමේ එක්දින පුහුණු වැඩසටහන | 57 | 2024.05.31 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.01979 | | දේශීය | දූෂණයෙන් හා අක්‍රමිකතාවයෙන් තොර රාජ්‍ය සේවයක් සඳහා නිලධාරීන් තුළ ස්වයං විනයක් ඇති වීම හා රජයේ වත්කම් සඳහා නිසි වටිනාකමක් ජනිත වීම |
| 24. | ආයතන සංග්‍රහය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | 54 | 2024.06.12 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.01498 | | දේශීය | ආයතන සංග්‍රහය පිළිබඳදැනුම වර්ධනය කිරීම |
| 25. | ආයතන සංග්‍රහය පිළිබඳ දෙවන එක්දින පුහුණු වැඩසටහන | 63 | 2024.06.26 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.01179 | | දේශීය | ආයතන සංග්‍රහය පිළිබඳදැනුම වර්ධනය කිරීම |
| 26. | රාජ්‍ය විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | 79 | 2024.07.23 දින -පැය 3 (පෙ.ව. 9.30 - ප.ව. 3.30 | 0.00 | | දේශීය | රාජ්‍ය විගණනය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 27. | ඒකාබද්ධ සේවයේ රියදුරන් සඳහා පුහුණු වැඩමුළුව (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලදී) | 28 | 2024.07.25 දින -පැය 3 (පෙ.ව. 9.30 - ප.ව. 1.00 | 0.00 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 28 | රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව | 15 | 2024.07.29 - 2024.08.02 දක්වාදින5 - පැය 30 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.00 | | දේශීය | රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 29 | Basic Computer Hardware පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | 40 | 2024.07.25 දින -පැය 5 (පෙ.ව. 9.00 - ප.ව. 3.00 | 0.00 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 30. | වැටුප් පරිවර්තන පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | 72 | 2024.08.06 දින -පැය 4½ (පෙ.ව. 11.00 - ප.ව. 3.30 | 0.00 | | දේශීය | වැටුප් පරිවර්තනපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 31. | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව (කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සංවිධානය කරන ලද) | 49 | 2024.08.08 දින -පැය 3 (පෙ.ව. 9.30 - ප.ව. 12.30 | 0.00 | | දේශීය | ව්‍යාපෘති යෝජනා සකස් කිරීමපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |

| වැඩසටහනේ නම | | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.මි.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 32. | Metropolitan Campus KDU ආයතනය විසින් පවත්වන ලද Government Payroll System පිළිබඳ තුන්දින පුහුණු වැඩසටහන | 1 | 2024.08.13 - 2024.08.15 දක්වා දින 03 (පැය 18) (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.018 | | දේශීය | වැටුප් සැකසීම පිළිබඳ මනා දැනුමක් ලැබීම හා එම කාර්යයේ යෙදෙන නිලධාරීන් හට නිසි මඟපෙන්වීමක් ලබා දීම. |
| 33 | රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව | 5 | 2024.09.09 - 2024.09.13 දක්වා දින5 - පැය 30 (පෙ.ව. 9.00 - ප.ව. 4.00 | 0.00 | | දේශීය | රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 34. | නිවාඩු පිළිබඳ පුහුණු වැඩසටහන | 55 | 2024.09.26 දින -පැය 3½ (පෙ.ව. 9.30 - ප.ව. 1.00 | 0.005425 | | දේශීය | නිවාඩුපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 35 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ විශේෂ වැඩසටහන | 89 | 2024.10.21 දින -පැය 6 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.02475 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 36 | රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටිය පිළිබඳ වැඩමුළුව | 3 | 2024.10.21 - 2024.10.25 දක්වා දින5 - පැය 30 (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.00 | | දේශීය | රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය පටිපාටිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| 37 | ලිපිගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - පළමු කණ්ඩායම | 56 | 2024.10.22 දින -පැය 3 (පෙ.ව. 9.00 - මධ්‍යාන්‍ය 12.00) | 0.01282 | | දේශීය | ලිපිගොනු කළමනාකරණයපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |
| | ලිපිගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - දෙවන කණ්ඩායම | 47 | 2024.10.22 දින -පැය 3 (ප.ව. 1.00 - ප.ව. 4.00) | | | | |
| 38 | Metropolitan Campus KDU ආයතනය විසින් පවත්වන ලද Government Payroll System පිළිබඳ තුන්දින පුහුණු වැඩසටහන | 1 | 2024.11.04 - 2024.11.06 දක්වා දින 03 (පැය 18) (පෙ.ව. 9.00 - ප.ව. 4.00) | 0.018 | | දේශීය | වැටුප් සැකසීම පිළිබඳ මනා දැනුමක් ලැබීම හා ඒ සම්බන්ධ කාර්යයන් ඉහළ කාර්යක්ෂමතාවයෙන් ඉටු කිරීම. |
| 39 | Renewal Fee of CPFA Membership of Mrs. L. M. Denawaka, Chief Finance Officer | 1 | Annual membership renewal | 0.016 | | දේශීය | තවත් වසරකට සමාජිකත්වය අළුත් වීම. |
| 40. | Higher National Diploma in Public Procurement and Contract Administration HN-DIPPCA 24/25 Program. | 1 | වර්ෂ 1 | 0.138 | | දේශීය | අදාළ විෂය ක්ෂේත්‍රපිළිබඳ දැනුම වර්ධනය කිරීම. |

## **ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

### කාන්තා හා ළමා කටයුතු අංශය

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් සාක්ෂාත් කිරීම පිණිස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සෑම අංශයක් හා ආයතනයන් සතු මානව සම්පත විෂයානුබද්ධව හා තාක්ෂණික දැනුමෙන් බලගැන්විය යුතු අතර, ඊට සමාන්තරව සිය වගකීම් නිසියාකාරව ඉටු කිරීමට පෙළඹවීම සඳහා නිසි මඟ පෙන්වීම් සහිත ආකල්ප සංවර්ධන වැඩසටහන්වලට නිරන්තරයෙන් යොමුකළ යුතු වේ.

එම අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කරන ලද ඉහත සඳහන් පුහුණු වැඩසටහන් තුළින් සියලුම නිලධාරීන්ගේ විෂයානුබද්ධ හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සිදුවන අතරම මෙම අමාත්‍යාංශය මඟින් ප්‍රතිලාභ ලබන කණ්ඩායම් හට ඵලදායී සේවයක් සැලසීම සඳහා නිලධාරීන් තුළ මානසික අභිප්‍රේරණයක් ඇතිවන අතර අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීම උදෙසා එමඟින් විශාල දායකත්වයක් සපයනු ලබයි

### සමාජ සවිබලගැන්වීම් අංශය

මෙම අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයේ හා අනුබද්ධ ආයතන වෙත පැවරී ඇති කාර්යභාරයන් අතර ප්‍රමුඛතම කාර්යය වන්නේ දිවයිනේ ආර්ථික,සමාජයීය, කායිකහා මානසික වශයෙන් පසුගාමී තත්ත්වයෙන් පසුවන අවාසි සහගත තත්ත්වයන්හී දිවි ගෙවන ජන කණ්ඩායම් ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාත්මික වශයෙන් සවිබලගන්වා ඔවුන් හට ඉහළ ජීවන තත්ත්වයක් අත්කර දීමට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීමයි.

මෙම කාර්යභාරය සාක්‍ෂාත් කිරීම පිණිස අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයේ හා අනුබද්ධ ආයතන සතු මානව සම්පත විෂයානුබද්ධ හා තාක්‍ෂණික දැනුමෙන් බලගැන්විය යුතු අතර ඊට සමාන්තරව සිය වගකීම් නිසියාකාරව ඉටු කිරීමට පෙළඹවීම සඳහා නිසි මඟ පෙන්වීම් සහිත ආකල්ප වර්ධන වැඩසටහන්වලට නිරන්තරයෙන් යොමුකළ යුතුය.

එම අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කරන ලද ඉහත සඳහන් පුහුණු වැඩසටහන් විශයානුබද්ධව හා තාක්ෂණික දැනුමින් දැනුවත් කිරීම හා ආකල්ප සංවර්ධනය කිරීම මඟින් ඉහත ජන කණ්ඩායම් හට ඵලදායී සේවයක් සැලසීම සඳහා නිලධාරීන් තුළ මානසික අභිප්‍රේරණයක් ඇතිවන අතර අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැවීම උදෙසා එමඟින් විශාල දායකත්වයක් සපයනු ලබයි.

# පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිබලගැන්වීම් අංශය | | |
| **1 පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | - | අදාළ නොවේ | | |
| **2 පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛණය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **3 මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභි නියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/204 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **4 වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **5 විගණන විමසුම්** | | | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිලිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| **6 අභ්‍යන්තර විගණනය** | | | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | අනුකූල නොවේ. | සිහිකැඳවීම් ලිපි යොමු කලද පිළිතුරු එවීම ප්‍රමාද වේ. | අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිළිතුරු සැපයීමේ කාර්යය අධීක්ෂණය කිරීම අංශයේ මාණ්ඩලික නිලධාරීයා විසින් සිදු කිරීම. |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **7 විගණන හා කළමනාකරණ කමිටු** | | | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **8 වත්කම් කළමනාකරණය** | | | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **9 වාහන කළමනාකරණය** | | | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | අනුකූල නොවේ | මෙම වාහනය බදු නිදහස්ව | අපහරණය කිරීමට ඇති වාහන |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| | | | | ආනයනය කර ඇති බැවින් අපහරණය කිරීමේ දී ගැනුම්කරුවන් විසින් ගෙවිය යුතු බදු ප්‍රමාණය රේගුවෙන් ලබා ගැනීමට කාලයක් ගත වූ අතර, ඒ අනුව තක්සේරු කමිටු වාර්තාව ලබා ගැනීමට ප්‍රමාද විය | හඳුනා ගැනීමේ කමිටුවට යොමු කිරීමට පෙර (බදු නිදහස්ව ආනයනය කර ඇති වාහන) ගෙවිය යුතු බදු ප්‍රමාණයන් පිළිබඳව ශ්‍රී ලංකා රේගුවෙන් අදාළ තොරතුරු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **10 බැංකු ගිණුම් කළමනාකරණය** | | | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිබලගැන්වීම් අංශය | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **11 ප්‍රතිපාදන උපයෝජනය** | | | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **12 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **13 පොදු තැන්පත් ගිණුම** | | | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **14 අග්‍රිම ගිණුම** | | | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය | අනුකූල වේ | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| | අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | | | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **15** ආදායම් ගිණුම | | | | | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | අදාල නොවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **16** මානව සම්පත් කළමනාකරණය | | | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල නොවේ | දැනට අනුමත කාර්ය මණ්ඩලය 847 ක් වේ. පුරප්පාඩු 256 පවතී | පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **17** මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **18 පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **19 මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | කාන්තා හා ළමා කටයුතු අංශය | සමාජ සවිලබගැන්වීම් අංශය | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |
| **20 විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | අනුකූල වේ | | |